ISSN 1391 - 1031
2018 දෙසැම්බර්
24 වෙළුම 08 කලාපය

ආධාරය රු 40/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

*"සිය පෞරාණික වුත්, පූජනීය වුත්, ප්‍රාග් විනිශ්වයන් සහ මත සහිත යකඩ මළ බැඳුණු සියලු සබඳතාවයන් විනාශ වී යන අතර අලුතින් ඇතිවන සියලු සබඳතාවයන් අස්ථිකරනයට භාජනය වීමටත් පෙර ඒවා යල් පැන යයි. ඝන වූ හැම දෙයක්ම උණුවී වාතය බවට පෙරළෙයි. ශුද්ධවූ හැම දෙයක්ම කෙළෙසෙන්නේය. අවසානයේදී මිනිසාට, තම ජීවන තත්වයන් සහ තම වර්ගයා සමග ඇති අන්‍යොන්‍ය සබඳතාවයන් දෙස සන්සුන් සිතින් බැලීමට අවශ්‍යතාවයක් ඇතිවේ."*

**මාක්ස්-එංගල්ස්**
**කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය, 37 පිටුව**

# ප්‍රජාතන්ත්‍රවාදය රැකීමට

# ජ.වි.පෙ. පෙරමුණ ගනී!

**මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා විරෝධී ලෙස හදිසි ආණ්ඩු මාරුවක් සිදුකිරීම හා ඒ ආශ්‍රිතව වර්ධනය වූ ප්‍රජාතන්ත්‍ර විරෝධී සිදුවීම් මාලාවක් හේතුවෙන් අනතුරට ලක් වූ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් නායකත්වය ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර තිබේ.**

ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කිරීමට විවිධ අයුරින් දායක වූ හා දායක වෙමින් සිටින සාම්ප්‍රදායික දේශපාලන පක්ෂවලට මෙම ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමේ සටනේ නායකත්වය තබා දායකත්වය හෝ ලබා ගැනීමට මේ වන විට සදාචාරාත්මක අයිතියක් නොමැත. විශේෂයෙන් ගතවූ වසර තුනහමාරක පාලන කාලය තුළ එකිනෙකාගේ විවිධ පටු වුවමනාකම් වෙනුවෙන් ජනමතය පසෙකලා රාජපක්ෂ කණ්ඩායම සමග 'ඩීල්' දේශපාලනයක නිරත වූ එ.ජා.ප.යට හෝ රාජපක්ෂ කණ්ඩායම සමග ප්‍රබල ප්‍රතිවිරෝධයක සිටි හා පසුව බල වුවමනාව වෙනුවෙන් ඔවුන් සමග දේශපාලන වශයෙන් සන්ධාන ගත වූ මෛත්‍රීපාල සිරිසේන මහතා නායකත්වය දරන ශ්‍රීල.නි.ප.යට මෙහිලා කිසිදු භූමිකාවක් ඉතිරි වී ඇත්තේ නැත. එකම කඳවුරක පක්ෂ ත්‍රිත්වය අතර සිදුවූ නග්න පිල් මාරු කිරීම් හා ඒ සඳහා වන 'ලංසු තැබීම්' ලාංකේය මෑත කාලීන දේශපාලනයේ පිළිකුල් සහගතම ලක්ෂණයක් ප්‍රකාශයට පත් කරවා තිබිණි.

මේ තත්වය තුළ 2015 ජනවාරි 08 රාජපක්ෂ කළු දශකයේ පවුල්වාදය හා ඒකාධිපතිවාදය පරාජය කර සදාචාරවත් දේශපාලනයක් වෙනුවෙන් ඡන්දය ලබාදුන් හැටදෙලක්ෂයක් ජනතාවගේ අපේක්ෂා බිඳ දමනු ලැබ ඇත. එසේ අතරමං කරන ලද ලක්ෂ සංඛ්‍යාත ජනතාවට බලාපොරොත්තු තැබිය හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින සදාචාරවත් දේශපාලනයක් කෙරෙහි පමණි. එනම් ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි පමණි.

මේ පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ප්‍රකාශ කළේ, රටේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම නිසා වැඩියෙන්ම බැටකෑ පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් දැඩිව පෙනී සිටින බවත් ඊට නායකත්වය ලබාදීමට සූදානම් බවත්ය. එසේම රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණත්වය අගයන ඒ අවශ්‍යතාව දකින සියලු ජන කොටස්වලට ඒ වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ සමග අත්වැල් බැඳගන්නා ලෙසට ආරාධනා කරන බවද ටිල්වින් සිල්වා සහෝදරයා කියා සිටියේය.











29වැනි ඉල් මහ විරු සමරුව
විහාරමහාදේවී එළිමහන් රංග පීඨයේදී


**05 බලය වෙනුවෙන්...**



දැන් අපේ සමාජයට වගකීමක් තිබේ. ඡන්දදායකයන් ඉදිරියේ සුදුවතින් සැරසී, පිරිත්නූල් ගැටගසාගෙන...

**07 අයවැය නැතිව ආර්ථිකයට...**



ප්‍රාදේශීය සභා, පළාත් සභාද ඇතුළු මුළු රටේම මූල්‍ය පාලනයේ බලය ව්‍යවස්ථානුකූලව ඇත්තේ...

**09 සමාජවාදය තුළ...**



ධනේශ්වර පංතිය කම්කරුවාගේ පැවැත්ම ගැන සැලකිල්ලක් දක්වන්නේ කම්කරුවා ඔවුන්ට...

**11 ප්‍රාථමික සමාජය...**



ජනගහනය ඉතාම අඩු විය. ජන ගණත්වය වැඩිවූයේ විශාල දඩයම් පෙදෙස්වලින් වටවූ ගෝත්‍රික...

සංවාදය.................. 03
තරුණ.................. 04
ආවර්ජනා.................. 06
ජාත්‍යන්තර.................. 08
කාන්තා.................. 10
කාලීන.................. 12
වේදිකාව.................. 13
විශේෂ.................. 14


**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## ලංකා ගුරුසේවා සංගමයෙන් උතුරු පළාත් සමුළුවක්



'එකම හඬක්, එකම තැනක්' තේමාව යටතේ ලාංකේය ගුරු පරපුරේ උතුර දකුණ යාකරමින් සැබෑ සහෝදරත්වයෙන් බලමුළු ගැන්වූ ලංකා ගුරුසේවා සංගමයේ උතුරු පළාත් සමුළුව පසුගියදා යාපනය වීරසිංහම් ශාලාවේදී පැවැත්විණි. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේත්, ලංකා ගුරුසේවා සංගමයේ හා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයාගේත්, ජනතා විමුක්ති පෙරමුණේ යාපනය දිස්ත්‍රික් නායක රාමලිංගම් චන්ද්‍රසේකර සහෝදරයාගේත් සහභාගිත්වයෙන් මෙම සමුළුව පැවැත්විණි.

මෙහිදී විශේෂයෙන් උතුරු පළාතේ සේවයේ නියුතු ගුරුවරුන් විදුහල්පතිවරුන් මුහුණදෙන වෘත්තීය ගැටළු මෙන්ම සිසු දරුවන්ගේ අධ්‍යාපන ගැටළු විසඳීමට බලකරමින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව වූ යෝජනා ගණනාවක් මෙම සමුළුවේදී සම්මත කර ගත් බව ලංකා ගුරු සේවා සංගමයේ උප සභාපති සුන්දරලිංගම් ප්‍රදීප් සහෝදරයා පැවසීය.

## වරාය සේවක ස්ථාන මාරු අවලංගුයි



පසුගිය අගෝස්තු මාසයේ විධායක නිලධාරීන්ගේ පමණක් වැටුප් වැඩිකිරීම හේතුවෙන් නිර්මාණය වූ බරපතළ වැටුප් විෂමතාවය නිවැරදි කරන ලෙස බලකරමින් කරන ලද අරගලයේදී වරාය වෘත්තීය සමිති නායකයින් අත්තනෝමතිකව ස්ථාන මාරු කරනු ලැබුණු අතර අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු පාලනාධිකාරිය මගින් නැවත එම ස්ථාන මාරුවීම් අවලංගු කළේය. මෙසේ එම ස්ථාන මාරුවීම් ලැබූ වෘත්තීය සමිති නියෝජිතයින් කොළඹ වරායට පිළිගැනීමේ උත්සවය පසුගියදා කොළඹ වරාය පිවිසුම ඉදිරිපිටදී සිදු කෙරිණි. මෙම අවස්ථාව සඳහා සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා ඇතුළු සාමාජිකයෝ විශාල පිරිසක් සහභාගි වූහ.

වෘත්තීය සමිති ක්‍රියාකාරී නායකයින් ත්‍රිකුණාමලය හා ගාල්ල වරායන්වලට ස්ථාන මාරු කිරීමට එරෙහිව තම සංගමය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩුවට අදාළව අධිකරණය මගින් එම ස්ථාන මාරු කිරීම් අවලංගු කරන ලෙස නියෝග කිරීම තම සංගමය ලැබූ විශාල ජයග්‍රහණයක් බවත් එමෙන්ම වැටුප් විෂමතාවය නිවැරදි කර සියලු සේවකයින්ට වැටුප් වැඩිකර ගැනීම වෙනුවෙන් අරගලය ඉදිරියට ගෙන යන බවත් මෙහිදී චන්ද්‍රසිරි සහෝදරයා අවධාරණ කළේය.

## ගුරු හා විදුහල්පති වැටුප් විෂමතාවයට එරෙහිව දෙසැ. 03 සිට වෘත්තීය ක්‍රියාමාර්ග




ගුරු හා විදුහල්පති සේවයේ වැටුප් විෂමතාවයට මේ වන විට වසර 21ක් ගත වී ඇති නමුත් මෙතෙක් බලයේ සිටි කිසිදු ආණ්ඩුවක් මෙම ගැටලුව විසඳීමට කටයුතු කර නැතැයි පසුග යදා කොළඹදී පැවති මාධ්‍ය හමුවකදී ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය.

එමෙන්ම 1997දී මෙම සේවාවන්ට ඇතිකළ වැටුප් විෂමතාව ඉවත්කර දීප ව්‍යාප්ත සේවාවන්ට අදාළ වැටුප් පරිමාණයන් වහා ලබා දෙන ලෙසත්, 2008.07.01 දින සිට ක්‍රියාත්මක නව සේවා ව්‍යවස්ථා මගින් අහිමි කර ඇති මාස 30ක මිලියන 6000ක් පමණ වන හිඟ වැටුප් වහා ගෙවන ලෙසත් ගුරුවරුන්ට පාසලේ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා කරන කොළ පිරවීම් ඇතුළුව ජනාධිපති කාර්ය සාධන බලකායේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පාසල් සංවර්ධන ක්‍රියාමාර්ගයේ, අමතර වැඩ ඉවත් කරන ලෙසත් ඒ සඳහා කාර්ය මණ්ඩල බඳවා ගන්නා ලෙසත් බල කරන බව මහින්ද ජයසිංහ සහෝදරයා මෙම මාධ්‍ය හමුවේදී පැවසීය.

ඒ අනුව මීට ඇහුම්කන් නොදෙන්නේ නම් මේ වනවිටත් ජනාධිපතිවරයාට භාරදීමට ගුරුවරුන්, විදුහල්පතිවරුන් අත්සන් කරමින් තිබෙන පෙත්සම එළැඹෙන දෙසැම්බර් 03 වැනිදා භාරදීමට පැමිණෙන්නේයැයි ඔහු මෙහිදී අනාවරණය කළේය.

2019 පළමු පාසල් වාරය ආරම්භ වූ වහාම දිවයිනේ අධ්‍යාපන කොට්ඨාශ මුල්කරගනිමින් 300කට වැඩි උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කරන බවත් අනතුරුව ඊටද ඇහුම්කන් නොදෙන්නේ නම් දැවැන්ත උද්ඝෝෂණවල සිට වැඩවර්ජනයක් දක්වා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් මහින්ද ජයසිංහ සහෝදරයා මෙහිදී අවධාරණය කළේය.

## වරාය - දුම්රිය තාක්ෂණ වාර්ෂික සමුළු මුළුදෙයි



සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ 20වැනි වාර්ෂික සමුළුව පසුගිය 30වැනි කොළඹ වරාය පරිශ්‍රයේදී පැවැත්විණි. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති හා එහි ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් මෙම සමුළුව පැවැත්විණි.

දුම්රිය තාක්ෂණ ශිල්පී සංගමයේ 10වැනි වාර්ෂික සමුළුව පසුගියදා දෙමටගොඩ ධාවනබල උප දෙපාර්තමේන්තු කාර්යාලයීය සාහිත්‍ය හා සමාජ ආයතන ශාලාවේදී පැවැත්විණි. මෙම සමුළුව පැවැත්වුණේ, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක වසන්ත සමරසිංහ සහෝදරයාගේ සහභාගිත්වයෙනි.

# එතෙරින්...

## මව්බිමේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරනු!




ලංකාවේ ඇතිවූ දේශපාලන කුමන්ත්‍රණය පරාජය කර රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන ලෙස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඇතුළු පාලනයට බල කෙරෙන උද්ඝෝෂණ රැසක් රටවල් කිහිපයක ජනතා විමුක්ති පෙරමුණ ජාත්‍යන්තර සංවිධාන විසින් සූදානම් කර තිබුණි. එම උද්ඝෝෂණවල අවස්ථා කිහිපයක් පහත ඡායාරූපවල දැක්වේ.





## ඉල් සමරු විදෙස් රටවලදීත්




ජනතා විමුක්ති පෙරමුණේ 29 වන ඉල් මහ විරු සමරුවට සමගාමීව මැද පෙරදිග හා යුරෝපයේ රටවල් රැසකද ජනතා විමුක්ති පෙරමුණේ විදෙස් කමිටුවල සංවිධානයෙන් ඉල් මහ විරු සමරු දේශන හා සමරු වැටසටහන් සංවිධානය කර තිබුණි. කුවේට්හි පැවැති ඉල් සමරු දේශනය හා වැඩසටහන සඳහා ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික, ඌව පළාත් සභා මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න සහෝදරයා සහභාගි විය.






## සිසිලියේ අධිරාජ්‍ය විරෝධී සමුළුවකට ජ.වි.පෙ.න්



ඉතාලියේ සිසිලියේ ක්‍රියාත්මක Partito Comunista (සිසිලියේ මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂය) පක්ෂය විසින් සංවිධානය කළ තෙදින අධිරාජ්‍ය විරෝධී වැඩමුළුවක් සඳහා ඉතාලියේ සිසිලි ජනතා විමුක්ති පෙරමුණ කමිටුවේ සහෝදරවරුද එක්ව සිටියහ. මෙහිදී ජ.වි.පෙ. ඉතාලි කමිටුවේ චමින්ද ජයරත්න සහෝදරයා විසින් සුභපැතුම් පණිවිඩයක්ද ඉදිරිපත් කරන ලදී.

## විනී හෙට්ටිගොඩ නගෝයා වැඩමුළුවක



ප්‍රවීණ කටූන් ශිල්පි ආචාර්ය විනී හෙට්ටිගොඩ මහතා 'එතෙර අපි' සංවිධානයේ ආරාධනයකට අනුව ජපානයේ නගෝයාහි 'කාටූන් ශිල්පියාගේ දේශපාලන කාර්යභාරය' පිළිබඳව වැඩමුළුවක් හා දේශනයක් සඳහා පසුගියදා සහභාගි විය.

## රාජපක්ෂ කණ්ඩායම... 16 පිටුවෙන්

ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට එරෙහි වීරවංශ මහතාගේ බිරිඳට එරෙහිව ගොනුකර ඇති නඩුව දෙසැම්බර් මස 11වැනිදා යළි කැඳවීමට නියමිතයි. දිවිනැගුම අරමුදලේ රු. මිලියන 2992ක මුදලක් අයථා ලෙස පරිහරණය කිරීමට එරෙහිව බැසිල් රාජපක්ෂ මහතා ඇතුළු විත්තිකරුවන් 04කට එරෙහි නඩුව නොවැම්බර් මස 26වැනිදා කැඳවීමට නියමිතයි. 2014 වර්ෂයට අදාලව වත්කම් බැරකම් ප්‍රකාශය සම්බන්ධයෙන් ජොන්ස්ටන් ප්‍රනාන්දුට එරෙහි නඩුව දෙසැම්බර් 04වැනිදා කැඳවීමට නියමිතයි.

පුටුවලින් ගහගන්න එක පුදුමයක් නෙවෙයි. මහජනයාට බාධා කරමින් උද්ඝෝෂණ සංවිධානය කළ වීරවංශ ඇතුළු 06කට එරෙහි නඩුව පෙබරවාරි 11වැනිදා විභාගයට ගැනීමට නියමිතයි. රගර් ක්‍රීඩක වසීම් තාජුඩීන් ඝාතන නඩුව නොවැම්බර් 29වැනිදා කැඳවීමට නියමිතයි. නාමල්, ගෝඨාභය, බැසිල්, ගාමිණී සෙනරත්, වීරවංශ, ජොන්ස්ටන්, මහින්දානන්ද අලුත්ගමගේ, ශිරන්ති රාජපක්ෂ, කලබල වෙන එක පුදුමයක්ද? මේ නිසා තමයි ඔවුන් බලහත්කාරී පාලනයක් ගොඩනගාගෙන බලහත්කාරී ලෙස රැඳී සිටින්නේ. මේ රටේ ජනතාව හොඳින් තේරුම් ගත යුතුයි, එම මන්ත්‍රී කණ්ඩායම පාතාල මැර කණ්ඩායමක් ලෙස හැසිරෙමින් කටයුතු කරමින් තිබෙන්නේ තමන්ට එරෙහිව එල්ල වී තිබෙන නඩුවලින් බේරෙන්නයි."

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## කුමන්ත්‍රණය, ජනතාව හා සමාජයේ ඛේදවාචකය

පසුගිය වසර 40ක් පමණ වන ලංකාවේ නව ලිබරල් ආර්ථිකයත් (කොල්ලකාරී විවෘත ආර්ථිකය) ඒ සඳහා සමාජය තුළ ක්‍රමානුකූල ලෙස ඇතිකළ ආකල්පත් එහිදී වෙළඳ දැන්වීම් නිපදවන්නන්ගේ සිට ජනමාධ්‍ය, අධ්‍යාපනය, ආගමික සංස්ථා ආදී සියල්ල තුළ ඇතිවූ විපර්යාසත් දේශපාලනයේ පාදඩකරණයත් ඒවායේ මැදිහත්වීමත් මගින් ලාංකේය සමාජය බරපතළ ලෙස 'රෝගී' කරනු ලැබ තිබේ.

වත්මන් ලාංකේය සමාජය තමන් ඉතිහාසයක් පුරා එක් රැස්කරගත් සියලු අධ්‍යාත්මක හා සදාචාරමය හර පද්ධතීන්, වටිනාකම් ඉවත ලමින් හුදු ආත්මාර්ථය, ආත්මලාභය හා පුද්ගලාභිවාදනය මූලික කොට සිතන හා හැසිරෙන එකක් බවට පත්ව තිබේ. නූතන ධනවාදය විසින් සමාජය යළි ම්ලේච්ඡත්වය වෙත රැගෙන යමින් තිබේ; මිනිසුන් අසංවේදී, සමාජ යුතුකම් හා වගකීම් නාඳුනන නරුම පිරිසක් බවට පත්කරමින් තිබේ. මෙය මිනිසුන්ගේ පෞද්ගලික වරදක් නොව පසුගිය දශක 04ක් තිස්සේ මිනිස් සමාජයට මඟ කියූ කොල්ලකාරී ධනවාදයේ වරදය.

පසුගිය දිනක මොනරාගල ප්‍රදේශයේ එක්තරා තරුණයෙක් තම පෙම්වතියගේ ගෙල සිරකර මරණ අයුරු දැක්වෙන වීඩියෝවක් අන්තර්ජාලයට මුදාහැර තිබුණි. එය නරඹන විට ගැටලු කිහිපයක් පැනනගී. එකක් දැන් අපේ සමාජය අපරාධ වළක්වන සමාජයක් නොව අපරාධ නරඹන සමාජයක් බවට පත්ව තිබීමේ ඛේදවාචකයය. අනෙක අමනාප වූ විට තම ප්‍රේමවන්තියගේ ගෙල මිරිකා මරා දැමීමට තරම් 'ප්‍රේමවන්තයින්' රුදුරු වී තිබීමය. ඒ සියල්ලට වඩා එය දැක දැකත් එය වළක්වා ගත හැකිව තිබියදීත් ඊට මැදිහත් නොවී එය වීඩියෝ කරමින් සිටිය හැකි පරපුරක් බිහිකර තිබීමය. මෙය සරල කාරණයක් නොවේ.

මෙම ගැටලු මෙසේම මාතරදී පාසල් ළමයෙකුට පිහියෙන් පහරදී මරා දැමූ සිදුවීමේදීද දැකගත හැකි විය. එලෙස මරා දැමුණේ හා ඝාතකයා බවට පත්වුණේ පාසල් ළමුන් වීම ඉතා බරපතළය. එසේම එහිදීද එම ගැටුම පවතිද්දී එතනින් යන වාහන කිහිපයක වැඩිහිටියන් වාහනවල වේගය අඩුකොට සිදුවීම නරඹමින් ගියා මිස වාහනයකින් බැස මෙම ගැටුම වැළැක්වීමට මැදිහත් වූයේ නැත. අනතුරකට ලක්වූ සතෙකු බේරා ගැනීමට පවා ඉදිරිපත් වූ සමාජයක් දැන් මෙලෙස අසංවේදීව හා සමාජ වගකීම් පිළිබඳ හැඟීමෙන් තොරව ආත්මාර්ථකාමී ලෙස හැසිරීම බරපතළ කරුණකි.

පසුගියදා ඊනියා මහජන නියෝජිතයන් පාර්ලිමේන්තුව තුළ කලහකාරී ලෙස හැසිරෙමින් එහි උපකරණවලට (මහජන දේපළ) හානිකරන විට, පිහි වනන විට, මිරිස් කුඩු ගසන විට ඒවා දැක ඊට එරෙහි වනවා වෙනුවට ඉන් වින්දනයක් ලැබීමට (ආතල් ගැනීමට) හුරුවී සිටීම මේ තත්වයේම වර්ධනයක් නොවේද? හොඳ නරක වෙන්කර හඳුනාගෙන ඊට ප්‍රතිචාර දක්වනවා වෙනුවට 'අපේ හොරා අපට හොඳයි' යන ප්‍රතිපත්තියට මිනිසුන් මාරුවූ විට එවැනි සමාජයක අනාගතය බියකරුමය.

පසුගියදා දේශපාලන පිටියේදී ව්‍යවස්ථාව උල්ලංඝනය කොට බලහත්කාරයෙන් ආණ්ඩුවක් හැදූ විට, එම ආණ්ඩුව බලහත්කාරී ලෙස පවත්වාගෙන යන විට, තම දේශපාලන පිල කුමක් වුවත් දේශපාලන කුමන්ත්‍රණවලට බලහත්කාරී ලෙස බලය පවත්වාගෙන යාමට විරුද්ධ විය යුතු ජනතාව ඒ වෙනුවට තම තමන්ගේ පැත්තට හුරේ දැමීම මෙම සමාජ අර්බුදයේ උච්ඡතම අවස්ථාව නිරූපනය කිරීමක් විය.

මෙම ඛේදවාචකය නිර්මාණය කිරීම සඳහා කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තියද, පරිභෝජනවාදයක ජනතාව ගිල්වා දැමූ වෙළඳපොළ බලවේගද සිය ලාභය හා තම නාලිකාවේ ජනප්‍රියත්වය පමණක් සිතූ විද්‍යුත් මාධ්‍ය ජාලා හිමිකරුවෝද ඒවායේ ප්‍රධානීහුද කපටි ධනපති දේශපාලකයෝද උන්ට ආවඩන බඩ වඩා ගන්නා විවිධ පුද්ගලයෝද අඩුවැඩි වශයෙන් දායකවී සිටිති. මෙහිදී ලංකාවේ ජනමාධ්‍ය (?) විසින් කර තිබෙන හා කරමින් තිබෙන හානිය සුළුපටු නොවේ. සමාජය තුළ මිත්‍යාවන් පැතිරවීම, අපරාධ උත්කර්ෂයට නැංවීම, හුදකලා ජයග්‍රහණ සොයන තනි සුපිරි තරු බිහිකිරීම, සමාජයක පිටුදැකිය යුතු ජඩ පක්ෂය ඇගයීමට ලක්කිරීම ආදී හානිකර කටයුතු රැසක් ඔවුහු කරමින් සිටිති.

පාර්ලිමේන්තුවේ බලය කොල්ලකෑමේ කුමන්ත්‍රණයේදීද ජනමාධ්‍යවල සදාචාරමය නොවන හැසිරීම හොඳින් පෙනිණි. පාර්ලිමේන්තුවට එ.ජා.ප. මන්ත්‍රීවරයා ගෙනා පිහිය දුටු කැමරා කාච (එය දැකීම හා පෙන්වීම නිවැරදිය) පාර්ලිමේන්තුවට මිරිස්කුඩු ගෙන ඒම හා ඒවායින් දමා ගැනීම දැක්කේ නැත. කතානායකගේ 'හැසිරීමේ' අඩුපාඩු නිතර දකින මෙම මාධ්‍ය ජනාධිපතිවරයාගේ හිතුවක්කාරී හැසිරීම හා මහින්ද රාජපක්ෂ කණ්ඩායමේ බලලෝභී ප්‍රචණ්ඩ හැසිරීම දුටුවේ නැත. ඒ වෙනුවට බලය කොල්ලකෑමත් කොල්ලකා ගත් බලය බලහත්කාරයෙන් පවත්වාගෙන යාමත් සාධාරණය කෙරෙමින් පවතී.

මෙම තත්වය දිගුකලක් සමාජයකට දරා සිටිය නොහැක. මේ තත්වය තව තවත් වර්ධනය වුවහොත් මුළු සමාජයම විනාශ වන අතර මෙම ඛේදවාචකයේ නිර්මාතෘවරුන්ද එම විනාශයේම ගොදුරු බවට පත්වනු ඇත. එබැවින් සමාජමය වගකීම් හඳුනන, මෙම ඛේදවාචකයෙන් සමස්ත සමාජයම (දරු පරපුර සමඟ) බේරා ගැනීමට සිතන සියලු දෙනා මෙම තත්වයට එරෙහිව නැගී සිටිය යුතුය. තම හඬ අවදි කළ යුතුය. එක් අතකින් සමාජය තුළ පුළුල් සංවාදයක්, සාකච්ඡාවක් ආරම්භ කළ යුතුය. ඒ සඳහා විද්වතුන් කලාකරුවන් අධ්‍යාපනඥයන් පෙරමුණ ගත යුතු අතර අනෙක් අතට මේ සියල්ල දේශපාලනික නිසා ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය දේශපාලනයේ සදාචාරය, ජාතික සමගිය, ආර්ථික සමානතාවය ආදී සටන් පාඨ මුල්කරගත් දේශපාලන බලවේගයක් ගොඩනැගිය යුතුය. වත්මන් අර්බුදය ඉල්ලා සිටින්නේ එයයි.

# ජනතාව අයිතිවාසිකම් දිනාගැනීමට පෙරට ආ යුතුයි



ජනතා විමුක්ති පෙරමුණේ නායක
**අනුර දිසානායක සහෝදරයා**

***නියමුවා:- මේ වන විට රටේ පවතින දේශපාලන අර්බුදය ඔබ තේරුම් ගන්නෙ කොහොමද? අර්බුදයේ පතුලේ ඇත්තේ කුමක්ද?***

*අනුර දිසානායක සහෝදරයා:-* මතුපිට දිගහැරෙන දේශපාලන සිදුවීම් මගින් පෙන්නුම් කරන්නේ, මෛත්‍රීපාල-මහින්ද රාජපක්ෂ කණ්ඩායම තමන්ට හිමි නැති බලයක් අනීතිකව හා බලහත්කාරී ලෙස පවත්වාගැනීමට උත්සාහ දැරීමක්. එසේම මෙය පැහැදිලිවම කුමන්ත්‍රණකාරී ලෙස බලය උදුරා ගැනීමක් හා එම බලය අත් නොහැර පවත්වාගෙන යාමට උත්සාහ දැරීමක් වශයෙන් හඳුනා ගත හැකියි. නමුත් මෙම අර්බුදයේ පතුලේ ඇත්තේ අපේ රටේ ධනවාදය මුහුණ දී තිබෙන දැවැන්තම අර්බුදයයි. සමාජ ක්‍රමයක් හැටියට අපේ රට ධනවාදයේ අර්බුදයට මුහුණ දී තිබෙනවා වගේම ධනවාදී දේශපාලන ව්‍යාපාරයන් ඇතුළෙත් එම අර්බුදය මතුවී තිබෙනවා. මෙම අර්බුදය තමයි මෙහි පතුළේ තිබෙන්නේ. මෙම ධනවාදයේ තිබෙන අසාර්ථකභාවය හේතුවෙන් නිර්මාණය වී ඇති අර්බුදය එකිනෙකා පිට පටවමින් එකිනෙකාට එයින් ගොඩ එන්නට පුළුවන් යැයි ඔවුන් හිතනවා. ඒ මතයන් අනුව ඇදීගෙන යන දේශපාලන අර්බුදයක් තමයි මේ නිර්මාණය වී තිබෙන්නේ.
විශේෂයෙන්ම රනිල්-මෛත්‍රී ආණ්ඩුව මතුපිට හැඩයෙන් ජාතික සමගි ආණ්ඩුවක් වුණාට අභ්‍යන්තරිකව විශාල බල පොරයක් ගොඩනඟාගෙන සිටි ආණ්ඩුවක්. ඒ නිසා ඒ ආණ්ඩුවේ සමස්ත අසාර්ථකභාවය එකිනෙකා මත පටවමින් ඉදිරියට ගෙනයාම සඳහා දරන ප්‍රයත්නයක ප්‍රතිඵලයක් හැටියට තමයි මේ අර්බුදය නිර්මාණය වී තිබෙන්නේ. එසේම අර්බුදයට විසඳුම ලෙස ඉදිරිපත් කළ මෛත්‍රී- මහින්ද ආණ්ඩුවටත් මේ අර්බුදයෙන් ගැලවීමේ කිසිදු හැකියාවක් නැහැ.

***නියමුවා:- වත්මන් පාර්ලිමේන්තු අර්බුදය මෙතෙක් ජනතාවගේ අර්බුදයක් බවට වර්ධනය වී නැහැ. නමුත් මේ තුළින් පිළිබිඹු වන්නේ ධනේශ්වර පාලකයින්ට තවදුරටත් අපේ රටේ පාලනය පවත්වාගෙන යාමට නොහැකි බවද?***

*අනුර දිසානායක සහෝදරයා:-* නිසැක ලෙසම ඔව්. ජේ.ආර්. ජයවර්ධන විධායක ජනාධිපති ධුරය නිර්මාණය කළේ විවෘත ආර්ථිකය බාධාවකින් තොරව ඉදිරියට ගෙනියන්න. පාර්ලිමේන්තුවේ 5/6ක බලයක් තිබුණු සහ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස්වීමේ ලියුම් සාක්කුවේ දමාගත් ඔහුටත් මේ සමාජ ආර්ථික දේශපාලන අර්බුදයට මුහුණදීම අසීරු වුණා.
නමුත් අද වන විට විධායක ජනාධිපති ධුරය ඉතාමත් දුර්වලභාවයට පත්වී තිබෙනවා. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ සරල බහුතරයවත් නැහැ. 19වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ඔහුගේ බලය සීමා කරනු ලැබ තිබෙනවා. දැන් ඔහු ව්‍යවස්ථාවට හා නීතීන්ට පටහැණිව කටයුතු කරමින් සිටිනවා. ඒ වගේම විධායකය සහ පාර්ලිමේන්තුව අතර ඉතාමත් පැහැදිලි ගැටුමක් නිර්මාණය වෙමින් තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ ඔහු සතු බලය ඉතාමත් දුර්වල තත්වයට පත්වී තිබෙනවා.
මෙයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවයි, මේ අර්බුදකාරී තත්වය තුළ තවදුරටත් අපේ රටේ ධනවාදී පාලකයන්ට තමන්ට රිසි පරිදි තමන්ට අවශ්‍ය පරිදි පාලනය තවදුරටත් ඉදිරියට ගෙනයාමට බැරි බවයි.

> මේ දේශපාලන කුමන්ත්‍රණය පරාජය කිරීම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ කේන්ද්‍රිය කාර්යභාරය කළා වගේම කේන්ද්‍රිය සාධකය බවට පත්වුණා. ඒ නිසා කුමන්ත්‍රණකරුවන් අන් කවරදාටත් වඩා වැඩියෙන් කළබල වී තිබෙනවා. වේගවත් වී තිබෙනවා. ඔවුන් කල්පනා කරනවා නම් ඒ අවලාදවලින් අප ගනු ලබන දේශපාලන තීන්දු තීරණ ආපසු හරවන්න පුළුවන් කියලා, අපේ ක්‍රියාකාරිත්වය අඩපණ කරන්න පුළුවන් කියලා, ඒ අවලාදකරුවන්ට අපට කියන්න තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ ගැන නුඹලා කිසිවක්ම දන්නේ නැති බවයි.

***නියමුවා:- දැන් දේශපාලන අර්බුදය අධිකරණය හමුවට ගොස් තිබෙනවා. මෙම තීරණය පිළිබඳ ඔබේ පුරෝකථනය කවරේද? යම් හෙයකින් ලැබෙන තීන්දුවක් අනුව ඉදිරි මහමැතිවරණයක් සඳහා ජ.වි.පෙ. සූදානම කවරාකාරද?***

*අනුර දිසානායක සහෝදරයා:-* විශේෂයෙන්ම ලංකා ඉතිහාසයේ අධිකරණ පද්ධතිය අවුරුදු 200කට වඩා ඉතිහාසයක් ගත වුණත් විධායකයත්, ව්‍යාවස්ථාදායකයත්, අධිකරණයත් ඉතා හොඳින් සමීප වුණු නඩුවක් මේක. මේ නඩුවේ පළමුවෙනි පියවර තමයි, ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය අත්හිටුවා තිබීම. ඒ පිළිබඳ නඩුව විභාග කර තීරණයක් ලබාදීමට සූදානම්. අපි විශ්වාස කරන්නේ නැහැ මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් දක්වා ඇදෙයි කියලා.
මොකද, දැනට ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්චිත වශයෙන් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අත්හිටුවා තිබෙනවා. පසුව අවසන් තීන්දුව ලෙස ගැසට් නිවේදනය වැරදි බවට නියෝගයක් ලබාදුන්නොත් ජනාධිපති මෛත්‍රීපාල මහත්මයා ඉතාමත් ප්‍රබල අර්බුදයකට පත්වෙනවා. ඒ නිසා බොහෝ දුරට ඒ දක්වා ඇදෙන්න නොදී අධිකරණ නඩු විභාගයට පෙර මෙම ගැසට් නිවේදනය පිළිබඳ තීරණයක් ගැනීමේ දේශපාලනයක් දැන් මතුවී තිබෙනවා. කෙසේ වුවත් මේ තිබෙන පාර්ලිමේන්තුව තුළ කවුරු එකසිය දහතුන හදා ගත්තත් එය ජනතාවගේ ඇත්ත මතය නියෝජනය වන්නේ නැහැ. මොකද ඒක විකෘති මතයක්. කවුරු එකසිය දහතුන හදාගත්තත් වරදාන වරප්‍රසාද මුදල් දී හදාගන්නේ.
මේ තත්වය තුළ අපේ යෝජනාවම තමයි නව පාර්ලිමේන්තුවක් සඳහා ජනතාවට

15 වැනි පිටුවට



4

YES WE CAN

# නිවහල් සමාජයක පෙරගමන්කරුවන් වෙමු!

මේ දවස්වල ප්‍රජාතන්ත්‍රවාදය බෙහෙවින් කතාකරන මාතෘකාවකි. බොරු ප්‍රජාතන්ත්‍රවාදය ධනවාදයේ හරහට හිට ඇත. ඇණයක් වී ඇත. ඒ, වෙන කිසිවක් නිසා නොව ප්‍රජාතන්ත්‍රවාදය නමැති සළුවේ හිල්වලින් ධනවාදයේ හෙළුව දෝරේ ගලායාමට පටන්ගෙන ඇති නිසාය. මෙවැනි පාලකයන්ගෙන් ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලීම, ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලීමක් වැනිය.

ජනවරමට පයින් ගසා රුපියල් කෝටි ගණන්වලට කුණු කරෝල සේ මහජන නියෝජිතයන් විකිණීම ජයටම සිදුවේ. පිම්ම, තුන් පිම්ම පමණක් නොව හතර වැනි පිම්මද පැනීමට තරම් මේ ජනතා නියෝජිතයෝ පාදඩ වූහ. පාර්ලිමේන්තුවේ ගුටි ඇණ ගත්තෝය, විරුද්ධවාදීන්ට මිරිස් කුඩු වලින් දමා ගැසුවෝය, නිරායුධ පොලිස් නිලධාරින්ට පවා පහර දුන්නේ පුටු, පොත් හා මිරිස් වතුරවලිනි. නිර්ලජ්ජිත භාෂාවෙන් කෑ ගසා පාර්ලිමේන්තුව දෙවනත් කළෝය. රට පාලනය කිරීමට ජනතා ඡන්දය ඉල්ලන්නේ මේ අයය. ධනේශ්වර පාදඩකරණය සමාජගත වී හමාරය. මේ පෙන්වන්නේ පාදඩකරණයේ නාටකයයි. මෙම හොර නඩය බලයට පොරකන්නේ ජනතාවට සේවය කිරීමට නොව, ඔවුන්ගේ මඩිය තරකරගැනීමට මෙන්ම සිදුකළ හොරකම්, වංචා, දූෂණ යටගසාගැනීමට බව තේරුම්ගත යුතුය.

තවදුරටත් මේ බොරු ප්‍රජාතන්ත්‍රවාදීන්, බොරු දේශප්‍රේමීන්, හොරුන්, පාදඩයන් කොල්ලකාරී, පරගැති, පසුගාමී දේශපාලනිකව වයෝවෘධ රැළකට අපේ රටේ අනාගතය භාරදෙනවාද යන්න තීරණය කිරීමට කාලය එළඹ තිබේ. ජනාධිපතිවරයාගේ සිට අගමැති (ලෙස පෙනී සිටින දෙදෙනාම), විපක්ෂ නායක, සභානායකවරු, අමාත්‍යවරු දක්වාම සිතුම් පැතුම්වල සිටම වයෝවෘධය. හිටපු ඇමති මණ්ඩලයටත් නීතිවිරෝධීව තනතුරුවල සිටින ඇමති මණ්ඩලයටත් මෙය අදාළය. මෙවැනි පාලකයින් සිටින රටක අනාගතය පිළිබඳ නවීන සිතීමක් ඇතිවන්නේ කෙසේද? මියයන තුරුම බල වුවමනාව වෙනුවෙන් කැස කවන පාලක රැළක් සිටින රටක අනාගතය කෙබඳු වේද? නූතන ලෙස සිතන පරම්පරාවට බලය හුවමරුවීමෙන් තොරව මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයෙන්නේ නැත.

තරුණ තරුණියන් ලෙස අප ඇත්ත ප්‍රජාතන්ත්‍රවාදය ළඟාකර ගත හැකි, වංචාවෙන්, දූෂණයෙන් හා නාස්තියෙන් තොර පාලන ක්‍රමයක් ගොඩනැගීම වෙනුවෙන් පෙළගැසිය යුතුය. තමාගෙන්ම පටන්ගන්න, තමාව වෙනස් කරගන්න, අලුත් ඇහැකින් සමාජය දෙස බලන්න, තරුණ ස්පාර්ටකස්වරුන් ලෙස හිතන්න. තවකෙකුගේ වෙනස්වීම දෙස බලා වෙනස් වන්නට හිතුවානම් ස්පාර්ටකස්ටද තවමත් බලාසිටීමට සිදුවනවා නොඅනුමානය. තරුණ ඔබ වෙනස් වී තවකෙකුට වෙනස් වීමට පාර කියා දෙන්න. ස්පාර්ටකස්ද සිය නැවුම් බලාපොරොත්තු වෙනුවෙන් එකිනෙකා රැස්කර, සංවිධානය කර වහල්භාවයට එරෙහිව කළ අසීමාන්තික කැපකිරීම් හමුවේ මතුවූ අරගලය නවමු සමාජයකට පාර විවර කළේය.

මේ කාලවකවානුව එවන් ස්පාර්ටකස්ලා මෙන්ම සිතන, තමා බැදි යදම් අබරණ සේ නොදකින, ඒවා යදම් ලෙසම දකින, නැවුම් සමාජයක බලාපොරොත්තු දල්වාගෙන ඒ වෙනුවෙන් සටන් කළ යුතු කාලයයි. තරුණ අප එම සමාජ වෙනස යථාර්ථයක් කිරීම වස් එකට එකතු වෙමු. සටන් කරමු. අලුතින් සමාජය කියවා ගනිමු.

අලුත් ලොවක අරුණැල්ල වෙනුවෙන් අපි අපගේ කාර්යභාරය ඉටු කරමු!

තරුණ

# පලස්තීනයට ජීවත් වීමට ඉඩදෙනු!

තමන් උපන් බිම අහිමිවූවන් ජීවත් වන රටවල් කිහිපයක් අප අසා ඇත්තෙමු. එවැනි ඛේදජනක අත්දැකීමකට මුහුණ දෙමින් සිටින රටක් ලෙස පලස්තීනය සඳහන් කළ හැක. දිනෙන් දින තම භූමිය ක්‍රම ක්‍රමයෙන් අහිමිවෙමින් යන බවට ඕනෑවටත් වඩා සාක්ෂි පලස්තීන - ඊශ්‍රායල් යුද්ධය තුළින් පෙන්නුම් කරනු ලබයි. කුඩා දරුවාගේ සිට මහල්ලා දක්වා ඝාතනය වන කුරිරු යුද්ධයක් බවට එම යුද්ධය පත්ව ඇත.

එම ගැටුම පිළිබඳ ඉතිහාසය දෙස හැරී බැලුවොත්, 07 වන සියවස වන විටත් පලස්තීනය පැවැතියේ අරාබි (ඉස්ලාමීය ආගමික) රටක් ලෙසයි. එහි යුදෙව්වෝ 4%ක් ද ක්‍රිස්තියානි පලස්තීනුවෝ 10%ක් ද පමණ ජීවත් වූහ. පොදුවේ මෙම ජනතාව විසින් තමන්ව හඳුන්වාගත්තේ 'පලස්තීනුවන්' ලෙසයි. කෙසේ නමුත් 1800 වසර අගදී යුරෝපය තුළ "දේශපාලන සියොන්වාදය" යනුවෙන් කුඩා අන්තවාදී සංවිධානයක් බිහිවිය. එහි අරමුණ වූයේ ලෝකයේ තැනින් තැන විසිරී සිටි යුදෙව් ජාතිකයින්ට ලොව කොතැනක හෝ තනි යුදෙව් රාජ්‍යයක් ඇති කිරීමයි. ඒ අනුව එකී කණ්ඩායමේ නායකයින් විසින් එම රාජ්‍යය පලස්තීනය තුළ පිහිටුවීමට තීරණය කළ අතර ඒ වෙනුවෙන් විවිධ උපායමාර්ග පවා යොදාගන්නට විය. මේ සඳහා ලෝක අධිරාජ්‍යවාදී බලවතුන් වන බ්‍රිතාන්‍ය හා එක්සත් ජනපදය විසින් තමන්ගේ වාසිය වෙනුවෙන් ඔවුනට උදව් කරන්නට විය.

පලස්තීන ගොවියන්ගේ ඉඩම් මිලදී ගැනීම සඳහා අරමුදල් ධනවත් යුදෙව්වන්ගෙන් ලැබුණු අතර ඉඩම් විකිණීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවන්හිදී බලහත්කාරයෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා යොදාගත්තේ භීෂණයයි. පලස්තීන ජනතාවට එල්ල වූ ප්‍රචණ්ඩත්වයේ උච්චතම අවස්ථාව වූයේ ඊශ්‍රායෙල් රාජ්‍යය පිහිටුවීමට ආසන්න එනම් 1947 හා 1949 අතර කාලයේදී ය. යුරෝපයේ යුදෙව් ත්‍රස්ත කල්ලි විසින් පලස්තීන ගම්වලට පහර එල්ල කොට දහස් ගණන් ජනතාව මරා දැමීය. නැතහොත් පළවා හැරීය. ඒ අනුව 1948 දී පලස්තීනුවෝ 750,000ක් පමණ උපන් බිම්වලින් පලවා හරින ලදහ. මෙම මානව ඛේදවාචකය හැඳින්වූයේ "අල් නක්බා" නමිනි. 1948දී එක්සත් ජාතීන්ගේ යෝජනාවක් අනුව පලස්තීන භූමියෙන් 55%ක් ජනගහනයෙන් 30%ක් වන ඊශ්‍රායලයටද භූමියෙන් 45%ක් ජනගහනයෙන් 70%ක් වන පලස්තීනයටද වන පරිදි වෙන් කළ නමුත් ඊශ්‍රායලය විසින් පලස්තීන භූමිය අත්පත් කරගැනීම තවදුරටත් සිදුවිය. ඊශ්‍රායලය විසින් පැහැදිලිවම අන්තර්ජාතික මහජන මතය හා නීතිය පවා උල්ලංඝනය කරමින් අත්පත් කරගත් ප්‍රදේශවල යුදෙව් ජනාවාස සහ හමුදා කඳවුරු ඉදිකිරීම දිගින් දිගටම කරගෙන යයි. අලුත්ම තත්වය නම් 2017 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදය විසින් ඊශ්‍රාලයේ ටෙලිවිව් නුවර පිහිටි තම තානාපති කාර්යාලය නැගෙනහිර ජෙරුසෙලම වෙත ගෙන යන බව ප්‍රකාශ කිරීමයි. ඊට එරෙහිව ලොව පුරා විරෝධයක් එල්ල වුවත් මෙම වසරේ මැයි මස 14 වන දින ඊශ්‍රායලයේ ඇමරිකන් තානාපති කාර්යාලය නැගෙනහිර ජෙරුසෙලමේ පිහිටවන ලදී. එය ඔවුන්ගේ බලහත්කාරයේ තරමයි.

පලස්තීනයේ නිදහස හා ස්වෛරීත්වය උල්ලංඝනය කරමින්, පලස්තීන ජනතාවගේ මානුෂීය අයිතීන් පවා අහෝසි කරමින්, ඊශ්‍රායලය හා අධිරාජ්‍යවාදීන් විසින් සිදුකරනු ලබන ම්ලේච්ඡ ප්‍රහාරයන්ට එරෙහිව පලස්තීන ජනතාව විසින් දීර්ඝ කාලයක් තිස්සේ තම රට නිදහස් කරගැනීමේ අරගලයක නිරත වෙමින් සිටී. එම අමානුෂික ක්‍රියාවන්ට එරෙහි ලෝකයේ සිවිල් සංවිධාන හා කණ්ඩායම් නොවැම්බර් 29 දින 'ජාත්‍යන්තර පලස්තීන සහයෝගිතා දිනය' ලෙස සමරනු ලබයි. එම දිනය එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය විසින් 1977 දී ප්‍රකාශයට පත් කරන ලදී. වර්තමානය වන විට පලස්තීන අරගලය ලෝකයේම අරගලයක් බවට පත්ව තිබේ. සමාජවාදී ප්‍රගතිශීලී හා අධිරාජ්‍ය විරෝධී සියලුම සංවිධාන මෙම අරගලය සාධාරණ බවත් ඒ සඳහා සහයෝගය ලබා දීමටත් එක් කඳවුරකට පෙළගැසී සිටී.

සමාජවාදී තරුණ සංගමය ලෙස අපිද "පලස්තීනයට ජීවත් වීමට ඉඩදෙනු" මැයෙන් නිදහස් පලස්තීනයක් උදෙසා ජාතික සහයෝගීතා වැඩසටහන් පැවැත්වීම වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක කරමින් සිටිමු. මෙවරද රටම ආවරණය වන පරිදි නොවැම්බර් 29 සිට දෙසැම්බර් 7 දින දක්වා සහයෝගිතා සතියක් නම් කළ අතර වැඩසහන් රැසක් සූදානම් කළෙමු. එහි දී අත්පත්‍රිකා බෙදාහැරීම, පෙත්සම අත්සන් කිරීම, විරෝධතා බැනර් ප්‍රදර්ශනය ඇතුළු විරෝධතා වැඩසටහන් සංවිධානය කෙරිණි.

අප රට තුළ ද ජාතිවාදය හා අන්තවාදය විටෙන් විට පැන නැගෙන්නේ දේශපාලඥයන්ගේ බල වුවමනාවන්ගේ න්‍යායපත්‍රයන් මත බව පසුගිය කාලය පුරාම දුටුවෙමු. එවැනි ව්‍යාපෘතීන් පරාජය කිරීමට පෙළගැසෙනවා මෙන්ම ලෝකය තුළ ද පැනනගින කවර වර්ගයේ ජාතිවාදයක් වුවද පරාජය කිරීම අපි සතු වගකීමකි.




## ගෙදරට මරගාතේ...

ලෝකෙම උතුම් රට
ලෝකෙටම පස්ස හරවපු
ජාතියක..
නරිවාදන් බේරෙන හැටි..
හැත්තෑවෙන් වැට පැනපු
නිදහසෙන් තිත්ත වුණු
මහ වුන්ට සින්න වුණු
ලෝකෙටම විකුණපු රට...
චැනල් - පත්තර
ගජබින්නාලංකාරෙන්
ගඳගස්සපු රට...
ලෝකෙටම පස්ස හරවපු
ලෝකෙන්ම උතුම් රට
රට්ටුන්ට තිත්ත වුණු
මහ වුන්ට සින්න වුණු...

"ඔබ සිටින්නේ රාමුව තුළ නම් පින්තූරය දැකිය නොහැක."

-ආර්.එස්.ට්‍රැප්-

UPDATE

### ඊජිප්තුවෙන් බළලු මමී සහ කුරුමිණි මමී හමුවෙයි




වසර 4500 ක් පමණ පැරණි මමීකරණය කළ බළලුන් හා සකාරබ් කුරුමිණියන් (ගොම ගුලි ගෙන යන කුරුමිණියන්) විශාල සංඛ්‍යාවක් සොයාගැනීමට ඊජිප්තු පුරාවිද්‍යාඥයෙ පිරිසක් පසුගියදා සමත්ව සිටිති.
සුකර් කාග් නම් පාරාවෝ රජ පෙළපත් සංකීර්ණයට අයත් දකුණු කයිරෝහි සකාරා නම් සොහොන් කොත් සංකීර්ණය තුළින් මෙම මමීකරණයන් හමුව ඇත. වසර 5500කට පෙර ඊජිප්තුව බළලුන් ආගමික වශයෙන් වන්දනා කර ඇති අතර කුරුමිණියා පූජනීය සත්වයෙක් ලෙස සැලකූ බව පැවසේ. ඒ අනුව මෙම කැණීමේදී ද්‍රව්‍යයෙන් හා ලෝහයෙන් කරන ලද එම සතුන්ගේ පිළිරූ හා කොහුක භාණ්ඩ රැසක්ද සොයා ගෙන ඇත. කෙසේ වුවද මෙම නව සොයාගැනීම් නිසා ඊජිප්තුවේ සංචාරක කර්මාන්තය තවත් දියුණු වනු ඇතැයි ඊජිප්තු රජය බලාපොරොත්තු වේ.

### නැවිය හැකි ස්මාර්ට් ෆෝන්



තිරය නැවිය හැකි වන පරිදි සකසූ ස්මාර්ට් ජංගම දුරකතනයක් චීනයේ ෂෙන්සෙන් නුවර පිහිටි Royole නම් සමාගමක් විසින් පසුගියදා එළිදැක්විය. අඟල් 7.8ක තිරයක් සහිත මෙය Flexipai ලෙස නම්කර ඇත. එසේම එය එක්සත් ජනපද ඩොලර් 1290 සිට 1863 දක්වා මිලකට අලෙවි කිරීමට සූදානම් බවද පැවසේ. කෙසේ වුවද මේ වන විට සැම්සුන්ග් සමාගම මගින්ද නැවිය හැකි ස්මාර්ට් දුරකථනයක් ඉදිරියේදී එළිදැක්වීමට නියමිතව ඇත. එසේම L.G සහ HUAWEI යන සමාගම්ද සිය නැවිය හැකි ස්මාර්ට් ෆෝන් දියුණු කරමින් සිටින බව පැවසේ.

### මිනිස් කෘතිම බුද්ධි ව්‍යාපෘතියක්



කෘතිම බුද්ධියක් යුත් පරිගණක ලොව පුරා දියුණුව හා යහපත් කටයුතු සඳහා යොදාගත හැකි ආකාරය පිළිබඳ යෝජනා සකස් කිරීමේ ව්‍යාපෘතියක් පසුගිය දා කැලිෆෝනියාවේ සනිවේලිහි දී පැවැත්වුණි. මෙම තාක්ෂණයේ දියුණුව මඟින් ජනතාව රැකියාවලින් ඉවත් කිරීම මෙන්ම මිනිසුන් ඝාතනය වීම ආදී සංකල්ප පිළිබඳව පැවති බිය තුරන් කිරීම එහි මූලික අරමුණ වී ඇත. මේ සඳහා නව මුදල් යෙදවීමේ වැඩසටහන All FOR SOCIAL GOOD ලෙස හඳුන්වා දී ඇත. මේ වෙනුවෙන් ගූගල් සමාගම විසින් ඩොලර් මිලියන 115ක මුදලක්ද ප්‍රදානය කර ඇත.

### රුසියාවේ දැවැන්තම දියමන්ති පතලක්



රුසියාව තුළ දියමන්ති කැණීම සඳහා මහා පරිමාණ පතලක් විවෘත කිරීමට එරට ජනාධිපති ව්ලැඩිමීර් පුටින් පියවර ගෙන ඇත. රුසියාවේ ඊසාන දිගින් පිහිටා ඇති එම පතල් ව්‍යාපෘති කටයුතු ලෝකයේ විශාලතම දියමන්ති කැණීමේ සමාගම ලෙස සැලකෙන අල්රෝසා සමාගම වෙත ලබා දී ඇත. එම සමාගම පවසන්නේ මෙම පතල වෙනුවෙන් වසර 2042 වන විට එක්සත් ජනපද ඩොලර් බිලියනයක මුදලක් ආයෝජනය කිරීමට ඔවුන් සූදානම් බවයි. එසේම එම පතල මඟින් සෑම වසරකදීම කැරට් ලක්ෂ 10ක පමණ දියමන්ති නිපදවනු ඇති බවටද ඔවුහු සිය විශ්වාසය පළ කර සිටිති.

# බලය වෙනුවෙන් රෙදි ඇඳීම හා රෙදි ගැලවීම



මේ දිනවල ලංකාවේ පාර්ලිමේන්තුව කේන්ද්‍ර කර ගනිමින් කොටස් වශයෙන් දිග හැරෙන දේශපාලන නාඩගම (විගඩම) ඛේදාන්ත නාඩගමක් බව පෙනෙන්නට තිබේ. තම බලලෝභය වෙනුවෙන් මෛත්‍රී-මහින්ද එක්ව නිර්මාණය කළ දේශපාලන කුමන්ත්‍රණය මුළු රටම අරාජික කොට අස්ථාවර කර තිබේ. එසේම රට අපකීර්තියටද පත්කර තිබේ. සුදු ඇඳගත් හා ටයිකෝට් දමාගත් (ධනවාදයේ අන්තේවාසිකයන් ලෙස කටයුතු කරන) මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ පෙන්වූ 'විශිෂ්ට රංගනය' අපේ රටේ ඉතිහාසයේ සදා නොමැකෙන කළු පැල්ලමක් තබා තිබේ.

අර්බුදය තවම අවසන් නැත. නීති විරෝධී ආණ්ඩුවක් බලහත්කාරයෙන් පවත්වාගෙන යාමට මෛත්‍රී-මහින්ද වෙර දරමින් සිටිති. එජාප නායකයා, නැතිවූ තම බලය ගැන දුක්වෙමින් යළි එය ලබාගත හැකි මං සොයමින් සිටී. ඒ අතර රටත් ජනතාව දිනපතා විනාශය කරා ගමන් කරමින් සිටී. එබැවින් ජනතාවගේ අරමුණ විය යුත්තේ මේ අර්බුදයේදී රනිල්ගේ නැතිවුණු අගමැතිකම බේරාදීම හෝ මහින්දගේ බලයෙන් ගත් අගමැතිකම රැකදීම නොව රටත් ජනතාවත් මේ විපතෙන් මුදා ගැනීමේ මග සෙවීමය. ඒ සඳහා මේ කුමන්ත්‍රණ විගඩම් හා නාඩගම් පිටුපස ඇති පන්තිමය වුවමනාවන් තේරුම් ගැනීමය.

ඉතිහාසයේ සමහර සිදුවීම් ජනතාවට බොහෝ දේ පිළිබඳ අනගි පාඩම් කියා දෙන බව අපි දනිමු. මෙම කුමන්ත්‍රණයද එවැන්නකි. මෙහි ප්‍රකාශිත අරමුණ කුමක් වුවත් හරයෙන් පවතින්නේ 'බලය' පිළිබඳ ප්‍රශ්නයකි. ඒ අනුව බලය පිළිබඳ ප්‍රශ්නය ආ විට ධනපති පක්ෂවල නායකයන් හැසිරෙන්නේ කෙසේද යන්න මෙයින් උගත හැකිය.

මෛත්‍රීපාල මහතා බලය පිළිබඳ අර්බුදයකට මුහුණදී සිටී. ඔහු ශ්‍රීල.නි.ප. නායකත්වය තමා වෙත තබා ගත්තද ඔහුව හුදකලා කර මහින්ද රාජපක්ෂ මහතා නව පක්ෂයක් ගොඩනගා ගැනීමත්, පසුගිය පළාත් පාලන ඡන්දයේදී ඉන් තරග වැදීමත්, එම ඡන්දයේදී මෛත්‍රීපාල කණ්ඩායමට ලබාගත හැකි වූයේ ඡන්ද ලක්ෂ 14ක් තරම් කුඩා ප්‍රමාණයක් වීමත් විසින් මෛත්‍රීගේ ජනවරමට අභියෝගයක් එල්ලවී ඇත. ඊළඟ ජනාධිපතිවරණයකදී (එවැන්නක් පැමිණියහොත්) මෛත්‍රීට එ.ජා.ප.යේ සහාය නැත. මහින්ද කල්ලියද නැත. එවිට සිදුවන්නේ ඇප නැතිව පරාජය වීමටය. ඉන් මිදීමට මෛත්‍රීට අවශ්‍ය වී ඇත. තව වරක් ජනාධිපති ධුරයේ 'රස' බැලීමේ ආශාව අන් සියල්ල යටකරමින් මතුව තිබිණි. ඒ සඳහා වූ එකම මග වූයේ මහින්ද සමග එකතුවී සන්ධාන අපේක්ෂකයා ලෙස මහින්දගේ ඡන්දවලින් ජය ගැනීමය. එහෙත් ඒ සඳහා මහින්දට 'ගෙවිය යුතු' විය. මෛත්‍රී එම ගෙවීම කළේ මහින්දට අයිති නැති අගමැතිකම හා ආණ්ඩුවක් බලයෙන් ලබාදීමෙනි. කුමන්ත්‍රණය අවශ්‍ය වූයේ ඒ සඳහාය. එබැවින් මේ කුමන්ත්‍රණය මෛත්‍රීගේ දෙවැනි ජනාධිපති සිහිනය වෙනුවෙන් මිස වෙන අරමුණකින් කළ එකක් නොවේ.

තමන්ට හිමි නැති අගමැතිකමක් හා ආණ්ඩුවක් ගැනීමට මහින්ද පෙළඹුණේද 'බලය' සඳහාය. ඔහුට බලය නැතිව බැරිය. එහි 'රස' දන්නේ ඔහු හා ඔහුගේ මජර ගෝල බාලයෝය. මේ දිනවල ඔහුගේ හෙලිකොප්ටර් ගමන් දෙස බැලීම මේ සඳහා ප්‍රමාණවත්ය. ඔවුනට 'ඉක්මන් බලයක්' අවශ්‍ය වූ අනෙක් කරුණ වූයේ දැනට විභාග වෙමින් පවතින, ස්ථිර ලෙස සිරගත වීමට සිදුවන අපරාධ නඩු හා මූල්‍ය වංචා නඩුවලින් ගැලවීමටය. දැනටම ඔවුන් ඒ සඳහා පියවර ගෙන තිබේ.

අනෙක් ප්‍රධාන කරුණ නම් ජනාධිපතිවරණයකට මුහුණ නොදී ඒ වෙනුවට ඊට පෙර මහමැතිවරණයකට යාමේ රාජපක්ෂගේ වුවමනාවය. ජනාධිපතිවරණයක් යනු මහින්දට උගුලකි. ඔහුට ඊට තරග වැදීමට නොහැක. එහෙත් එය ආවිට අකමැත්තෙන් වුවත් ගෝඨාභය හෝ වෙන කිසිවෙකු ඉදිරිපත් කළ යුතු වේ. එවිට තම බල ආධිපත්‍ය තමා අතින් ගිලිහෙන බවත් නාමල්ගේ මාර්ගය අවහිර වන බවත් මහින්ද දනී. එබැවින් ඉක්මන් මහමැතිවරණයට පාර කපා ගැනීම මහින්දගේ අරමුණය. එහිදී ආණ්ඩු බලය (අනීතිකව) අතේ තබාගෙනම එම ඡන්දය කිරීම ඔහුට වාසිය. මහින්ද මේ කුමන්ත්‍රණයට දායක වූයේ ඒ සඳහාය. පසුගිය 15 දා පාර්ලිමේන්තුවේ ඔහු කළ කථාවේ ප්‍රධාන ඉල්ලීම වූයේ මහමැතිවරණයකට යාමට පාර්ලිමේන්තුවේ සහාය ඉල්ලීමය.

එබැවින් රටක් අරාජික කළ, අපකීර්තියට හා අවමානයට පත් කළ මේ දේශපාලන සූදුව වෙන කිසිවක් සඳහා නොව 'බලය' සඳහාය. බලය පිළිබඳ ප්‍රශ්නයේදී පාලකයන් ඔවුන් විසින්ම උත්තරීතර යැයි ජනතාවට හඳුන්වා දී ඇති ආයතන හා සංකල්ප කෙළෙසන හැටි මේ දිනවල දැකිය හැකි විය. තමන්ගේ (ධනපති පාලකයින්ගේ) ව්‍යවස්ථාව ඔවුහුම උල්ලංඝනය කළෝය. උත්තරීතර යැයි ඔවුන්ම කියූ ඔවුන්ගේ පාර්ලිමේන්තුව ඔවුහු සුනු විසුනු කළෝය. බහුතරය පිළිබඳ සංකල්පය, ආචාරධර්ම, සම්ප්‍රදායන් විනාශවී ගියේ සුනාමියකට හසුවූ ලෙසය. ඔවුනගේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාජයක් හා මිථ්‍යාවක් බව ඔවුහු ඔප්පු කළහ.

ඒ අතර ධනපති දේශපාලන සදාචාරයේ පෙනුම හා හරය පිළිබඳ පාඩමක්ද මෙහිදී ජනතාවට උගත හැකි විය. ධනේශ්වර දේශපාලකයින් ජනතාව රවටන්නේ පෙනුමෙන් සිල්වත්, හැදියාව සහිත මහත්වරුන් ලෙස හෝ දේශප්‍රේමී ජාතික නායකයින් ලෙස පෙනී සිටිමිනි. ඒ සඳහා ඔවුන් ඇඳුම් (රෙදි) උපයෝගී කර ගනිති.
ඔවුන්ගෙන් බොහෝ දෙනා අඳින්නේ සුදු ඇඳුම්ය. ඒ සඳහා වෙනම ඇඳුමක් සකස් කරගෙන තිබේ. ඒ, ජනතාව 'ඇන්දීමටය'. සමහරු මහත්වරුන් සේ ටයිකෝට් අඳිනවිට වැඩිදෙනා රෙද්ද බැනියම හෝ කලිසමට උඩින් සුදු ඇඳුම අඳිති. අතීතයේ පවුල් පසුබිමින් ටයිකෝට් ඇඳි බණ්ඩාරනායක දේශපාලනයේදී බහුතර සිංහල බෞද්ධයන් 'ඇන්දීම' සඳහා ජාතික ඇඳුමට මාරුවූ බව ප්‍රසිද්ධ කථාවකි. ඉතාම තක්කඩි දේශපාලකයෙක් වූ ජේ.ආර්. ජයවර්ධනද ටයිකෝට් කලිසම් අතහැර රෙද්ද බැනියමට මාරු වූවෙකි. මහින්ද රාජපක්ෂලාද එසේය. ඔවුන් රෙදි ඇන්දේ බලය සඳහා ජනතාව රවටා ගැනීමටය. එහෙත් පාලක පංතියේ අර්බුදය සියල්ල කණපිට හරවා තිබේ.

> දැන් අපේ සමාජයට වගකීමක් තිබේ. ඡන්දදායකයන් ඉදිරියේ සුදුවතින් සැරසී, පිරිත්නූල් ගැටගසාගෙන 'බෝධිසත්වයන්' මෙන් පෙනී සිටින ධනපති දේශපාලකයින් සැබවින්ම වෙස්වළාගත් 'රකුසන්' බව අවබෝධ කර ගැනීම ඉන් පළමුවැන්නය. බලය ඩැහැගැනීමට අවශ්‍ය වූ විට ඊට බාධා එල්ලවූ විට ඔවුන්ගේ හැසිරීමේ සැබෑ වියරුව මඟින් ඔවුන් කවුද යන්න දැන්වත් වටහා ගත යුතුය. එම දේශපාලන කුණුකන්දල් දේශපාලන බිමෙන් ඉවත් කිරීම පොදු ජනතාවගේ වගකීමකි.

බලය වෙනුවෙන් රෙදි ඇන්ද වුන්ට දැන් බලය වෙනුවෙන්ම 'රෙදි නැතිව' හැසිරීමට සිදුව තිබේ. සුදු ඇඳුම්වලට මිරිස් වතුර වදින්නේ මේ නිසාය. මෙවැනි තත්වයක් තුළ මේ ආණ්ඩුවේ 'රෙදි ඇඳගෙන' සිටිය නොහැකි බව ප්‍රසිද්ධියේ කීවේ මහින්දවාදී වෙල්ගම මන්ත්‍රීවරයාය. මෙම අර්බුදය හමුවේ මෛත්‍රී-මහින්ද ඇතුළු කුමන්ත්‍රණ නඩයම රෙදි ගලවාගෙන තිබේ. ඒ, ප්‍රජාතන්ත්‍රවාදයේ සළුය. දේශපාලන සදාචාරයේ සළුපිලිය. දැන් ඔවුන් සිටින්නේ අමු නිරුවතිනි. රනිල් මහතාද එසේය. අගමැතිකම අහිමි වුවද තවමත් අරලියගහ මැදුරේ රැඳීසිටිමින් ඔහුද පෙන්වන්නේ තම නිර්ලජ්ජිතභාවයමය. බලය පිළිබඳ ප්‍රශ්නයේදී ඔහුද සිටින්නේ 'රෙදි නැතිව'ය. ජනතාව ඉගෙන ගන්නේ නම් සැබෑ පාඩම් ඒවාය.

කෙසේ වුවත් ධනපති දේශපාලනයේ තෙම්පරාදු වූවන්ගේ සැලසුම් සහගත කුමන්ත්‍රණය දැනටමත් වට කිහිපයකින් පරාජය වී තිබේ. නිවැරදිව කිවහොත් පරාජය කරනු ලැබ තිබේ. මෙම කුමන්ත්‍රණය පළමු පරාජය ලැබුවේ පසුගිය නොවැම්බර් 13දා ශ්‍රේෂ්ඨාධිකරණයේදීය. ඒ, ජනාධිපතිගේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් පත්‍රය අත්හිටවනු ලැබීම මගිනි. ජනාධිපතිවරයෙකුගේ අති විශේෂ ගැසට් පත්‍රයක් අධිකරණයේදී අත්හිටවූ පළමු අවස්ථාව මෙය වීමද විශේෂයකි.

මෙම කුමන්ත්‍රණයේ දෙවන පරාජය වූයේ නොවැම්බර් 14 හා 16 යන දෙදිනම පාර්ලිමේන්තුවේ මහින්දගේ නීති විරෝධී අගමැති ධුරයට හා ආණ්ඩුවට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ ගෙන ආ විශ්වාසභංග යෝජනා දෙකම සම්මත වීමය. එය පිළිගැනීමට කුමන්ත්‍රණකරුවන් සූදානම් නැති වුවද දැන් ඔවුහු පැරදී නිරුවත්ව සිටිති. මහින්දගේ අටවාගත් ආණ්ඩුවට පාර්ලිමේන්තු බහුතරය නැති බව ඉතා පැහැදිලිය. මහින්දවාදීන් පාර්ලිමේන්තුවේ 'යකා නටන්නේ' ඒ නිසාය. එබැවින් මේ කුමන්ත්‍රණය පරාජයට පත්කිරීමේ වැඩිම ගෞරවය හිමිව තිබෙන්නේ ජ.වි.පෙ.ටය. රාජපක්ෂවාදීන් වියරු වැටී ජ.වි.පෙ.ට එරෙහිව මඩ, අවලාද නඟමින් පහර දෙන්නේ මෙම පරාජය ඔවුන්ට දරාගත නොහැකි එකක් වන නිසාත් ඊට මූලිකත්වය ගත්තේ

15 වැනි පිටුවට



"මධ්‍යතනවාදය සමග සංසන්දනය කරන කල ධනපති ප්‍රජාතන්ත්‍රවාදයෙන් මහා ඓතිහාසික ඉදිරි ගමනක් සලකුණු වන නමුත්, එය කවදත් සීමා කළ, කප්පාදු කළ, ව්‍යාජ සහ වංචනික ප්‍රජාතන්ත්‍රවාදයක්ද, ධනපතියන්ට පරාදීසයක් සහ සූරාකනු ලබන්නන්ට, දුප්පතුන්ට උගුලක් හා රැවටිල්ලක්ද වූයේය. ධනපති ක්‍රමය යටතේ එය එසේම පැවතීම නොවැළැක්විය හැකිය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**9වැනි වෙළුම,**
**23 පිටුව**

# ප්‍රජාතන්ත්‍රවාදය වුවමනා කර තිබේ



“ප්‍රජාතන්ත්‍රවාදය” යන වචනය පවා ව්‍යුත්පන්න වන්නේ වැඩවසම් ක්‍රමයට එරෙහිව නැගී ගෙන එන ධනපති පංතිය සිදු කරන ලද අරගලයන් සමගිනි. එනිසා ප්‍රජාතන්ත්‍රවාදය යනු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය වේ. ධනපති පංතිය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක මූලික බල කණු ලෙස සර්වජන ඡන්ද බලය, බහු පක්ෂ ක්‍රමය (පාර්ලිමේන්තු ක්‍රමය), ස්වාධීන අධිකරණ ක්‍රියාවලිය සහ නිදහස් මාධ්‍යය හඳුන්වනු ලබයි. නමුත් ඉහත කී බල කණු හතරම ඔවුන් විසින්ම කෙළසා ඇති බව මෙරට පාර්ලිමේන්තුව තුළ හටගෙන ඇති අර්බුදයෙන් තවදුරටත් තහවුරු වේ.

මේ අවශේෂව පවතින ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය හෝ රටේ ජනතාව වෙනුවෙන් රැක ගැනීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරමින් සිටියදී ඇතැම් වාමාංශිකයයි කියා ගන්නා කල්ලි කණ්ඩායම් ධනපති කල්ලි සමග එකට සිට ගනිමින් ජ.වි.පෙ.ට එරෙහිව අවලාද නගමින් තිබේ. ඒ කෙසේ වුවද ජ.වි.පෙ. තම සමාජමය කාර්යභාර්ය අමතක නොකරමින් මෛත්‍රීපාල සිරිසේන විසින් සිදු කළ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවලියට එරෙහිව අඛණ්ඩ අරගලයක යෙදී සිටී.

එම ක්‍රියාමාර්ගයන්ගේ දිගුවක් ලෙස පසුගිය නොවැම්බර් 21 වෙනිදා මහරගම නගරයේදී “ඒකාධිපති වියරුව පරදවමු! ප්‍රජාතන්ත්‍රවාදය දිනවමු!” යන මැයෙන් දැවැන්ත ජන රැලියක් ජ.වි.පෙ. විසින් පවත්වන ලදී. මේ රැලිය සඳහා විශාල පිරිසක් සහභාගී වී සිටියහ. ජ.වි.පෙ. නායක අනුර දිසානායක, දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල් කාන්ත, ජාතික සංවිධායක බිමල් රත්නායක යන සහෝදරවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන අතුලසිරි සමරකෝන් සහ අනිල් ජයන්ත යන මහත්වරුද, නීතිඥ හර්ෂණ නානායක්කාර, ප්‍රවීණ සාහිත්‍යවේදී කීර්ති වැලිසරගේ යන මහත්වරුද රැලිය ඇමතුහ. මෙයට අමතරව සිවිල් සංවිධානයන්හි නියෝජිතයෝද, කලාකරුවෝද, විශ්වවිද්‍යාල ආචාර්යවරු ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයෝ රැසක්ද ජ.වි.පෙ. වේදිකාවේ අසුන් ගෙන සිටීම විශේෂත්වයක් විය.

කුරුණෑගල, මාතර, තංගල්ල සහ ගම්පහ යන නගරයන්හිදී මේ රැලි මාලාව පැවැත්වූ අතර තවත් නගර ගණනාවකදී රැලි පැවැත්වීමට නියමිතය.

# දේශපාලන කුමන්ත්‍රණ පැරදවීම උදෙසා

පසුගිය ඔක්තොම්බර් 26වැනිදා ඉතාම කුමන්ත්‍රණකාරී ලෙසත්, සදාචාර විරෝධී ලෙසත් මෛත්‍රීපාල ජනාධිපතිවරයා විසින් මහින්ද රාජපක්ෂ අගමැතිවරයා බවට පත් කරන කළේය. මෙම දේශපාලන කුමන්ත්‍රණය පැරදවීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතත් ක්‍රියාමාර්ග රැසක් සංවිධානය කරන ලදී.

ඒ සංවිධානය කළ වැඩපිළිවෙළේ එක් අංගයක් ලෙස පසුගිය නොවැම්බර් 09වැනිදා එක හා සමගාමීව අනුරාධපුර, මහනුවර, මාතර සහ රත්නපුර යන දිවයිනේ ප්‍රධාන නගරයන්හි උද්ඝෝෂණ පාගමන් සහ සම්මන්ත්‍රණයක් කිහිපයක් පැවැත්විණි. අනුරාධපුර මහනුවර, මාතර සහ රත්නපුර යන දිස්ත්‍රිකයන් හි පාගමන් සහ සම්මන්ත්‍රණ පිළිවෙළින් විජිත හේරත්, ලාල් කාන්ත, අනුර දිසානායක සහ ටිල්වින් සිල්වා යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර සඳහා ඒ ඒ දිස්ත්‍රික්වලින් ජ.වි.පෙ. සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

“කුමන්ත්‍රණ පරදවන ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජන බලය” යන තේමාව යටතේ මෙම සම්මන්ත්‍රණ මාලාව නම් කර තිබුණු අතර මේ පෙළපාළි සහ සම්මන්ත්‍රණ සඳහා කලාකරුවෝ, විශ්වවිද්‍යාල ආචාර්යවරු ඇතුළු විද්වත්හු රැසක්ද සහභාගි වී සිටියහ.




# පාර්ලිමේන්තු වේදිකාවේ අරගලය තුළ



“තමන්ගේම පංතියේ නොදියුණු ස්ථරයන්ට උගැන්වීමේ ඒකාන්ත කාර්යය ඉටු කර ගැනීම සඳහා සහ ඌන සංවර්ධිත, පැගුණු හා නූගත් ගැමි පොදු ජනතාවන් අවදි කර, අවබෝධමත් කර ගැනීම සඳහා, පාර්ලිමේන්තු මැතිවරණවලට සහ පාර්ලිමේන්තු වේදිකාවේ කෙරෙන අරගලයට සහභාගි වීම විප්ලවවාදී නිර්ධන පංතියේ පැහැර හැරිය නොහැකි කටයුත්තක් වන බවය.” (ලෙනින්, තෝරාගත් කෘති, 10 වෙළුම, 174 පිටුව)

ජ.වි.පෙ. මෙම කුමන්ත්‍රණය හමුවේ පාර්ලිමේන්තුව තුළ සිදු කරනු ලබන කාර්යභාරය සම්බන්ධව වාම වෙස් ගත් ඇතැම් කල්ලි කණ්ඩායම් මෙන්ම කුමන්ත්‍රණයේ මහ මොළකරුවන් වන මෛත්‍රී-මහින්ද කල්ලියද කිඹුල් කඳුළු හෙළමින් සිටින්නේ විප්ලවවාදී ව්‍යාපාරයක් මෙසේ නොකළ යුතු බවටය. එහෙත් ලෙනින් සහෝදරයා පාර්ලිමේන්තුව තුළ සිදු කරන අරගල නිර්ධන පංති ව්‍යාපාරයට මඟ හැරිය නොහැකි බව සඳහන් කළේ බොහෝ කලකට පෙරය.

වත්මන් අර්බුදය හමුවේ රුපියල් කෝටි ගණනින් මන්ත්‍රීවරුන් එහාට මෙහාට හුවමාරු වෙද්දී ජ.වි.පෙ. මන්ත්‍රීවරු තමන්ට ලැබුණු ජනවරමට පිටු නොපා මෛත්‍රී-මහින්ද කල්ලිය විසින් විසින් සිදු කළ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාමාර්ගවලට එරෙහිව පාර්ලිමේන්තුව තුළ ප්‍රබල භූමිකාවක් ඉටු කරන ලදී.

මෙහි තීරණාත්මක අවස්ථාවක් වූයේ, පසුගිය නොවැම්බර් 14වැනිදා මහින්ද රාජපක්ෂගේ නීති විරෝධී අගමැති ධුරයට හා ආණ්ඩුවට එරෙහිව ජ.වි.පෙ.න් ගෙන ආ විශ්වාසභංග යෝජනාවයි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිපතිවරයාගේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය දෙසැම්බර් 07 දක්වා අත්හිටුවීමත් සමග කුමන්ත්‍රණ කල්ලියේ පළමු පරාජය සටහන් වූ අතර දෙවන පරාජය සටහන් වූයේ ජනතා විමුක්ති පෙරමුණ විසින් පාර්ලිමේන්තුවට ගෙනා ආ විශ්වාසභංග යෝජනාවෙන් කුමන්ත්‍රණ ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ බහුතරයක් නොමැති බව නිල වශයෙන් තහවුරු වීමෙනි.

# ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් විද්වත් පෙළගැස්ම

ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධව ධනේශ්වර විචාරකයන් අතර ජනප්‍රිය අර්ථකතනය වී ඇත්තේ, ඇමරිකානු ජනාධිපතිවරයෙකු වූ ඒබ්‍රහම් ලින්කන් විසින් 1863දී ගෙටිස්බර්ග් නුවරදී ප්‍රජාතන්ත්‍රවාදය යනු “මහජනතාව විසින් මහජනතාව උදෙසාම ගෙන යන මහජන පාලන තන්ත්‍රයක්” යනුවෙන් කළ හැඳින්වීමයි. සරලව ගතහොත් මෙය බහුතරයේ කැමැත්ත ලෙසද හඳුන්වනු ලබයි.

නමුත් එම ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ සීමා මායිම්ද නොතකා හරිමින් පසුගිය ඔක්තෝබර් 26වැනිදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් මහින්ද රාජපක්ෂ අගමැති ධුරයට පත් කරන ලදී. මේ දේශපාලන කුමන්ත්‍රණයේ දිශානතිය සටහන් වී ඇත්තේ මර්දනකාරී ඒකාධිපති පාලනයක් දක්වා බව කල් තියා පසක් කර ගත් ජාතික විද්වත් සංවිධානය ජනතාවට වැසී යන ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයන් රැක ගැනීම වෙනුවෙන් පෙරට පැමිණියේය.

ඒ අනුව යමින් එම සංවිධානය විසින් “ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් විද්වත් පෙළගැස්ම” යන තේමාව යටතේ විද්වත් කතිකාවක් පසුගිය නොවැම්බර් 12වැනිදා ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. මෙහි ආරාධිත දේශනයක් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් පවත්වනු ලැබිණි.




එසේම ආචාර්ය හරිනි අමරසූරිය මෙනෙවිය, සාහිත්‍යවේදී ජයතිලක කම්මැල්ලවීර, මහාචාර්ය සරත් විජේසූරිය, මහාචාර්ය ලියනගේ අමරකීර්ති, මහාචාර්ය චන්දන අබේරත්න, ආචාර්යය උපාලි පන්නිලගේ, නීතිඥ හර්ෂණ නානායක්කාර, හිටපු අමාත්‍යංශ ලේකම් ඒ.පී.ඒ. ගුණසේකර, සාහිත්‍යවේදී කීර්ති වැලිසරගේ, ආචාර්ය අනිල් ජයන්ත, විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ සහ ආචාර්ය විජිත රෝහණ යන මහත්වරු ඇතුළු පිරිසක් මේ සාකච්ඡා සභාවේ මූලිකත්වය දැරූ අතර විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් උගතුන්, බුද්ධිමතුන් රාශියක් මේ කථිකාවට සම්බන්ධ වී සිටියහ.

# අයවැය නැතිව ආර්ථිකයට ඉදිරියට යා හැකිද?



ලංකාවේ විසඳුම් නැති ආර්ථික දේශපාලන අර්බුදයේ පුපුරා යාමක් පාර්ලිමේන්තුවේදී මේ වනවිට දිගහැරෙමින් පවතී. මේ වන විටත් අවසානයකට පැමිණ නැති ආණ්ඩු බල පොරයේ මෙම පුපුරා යාම ධනවාදයේ විසඳුම් නැති ආර්ථික දේශපාලන අර්බුදයේම පොදු ස්වභාවය බව අපි දේශපාලනනිකව හඳුනා ගනිමු. ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් වීමත් එය ධනපති පංතියේ පක්ෂ අතර ගැටුමක් ලෙසත්, තවදුරටත් සංකීර්ණ වන විට ධනපති කඳවුරේම පුද්ගලයින් අතර බල අරගලයක් ලෙසටත් වරින් වර විවිධ හැඩරුවෙන් එළිදකින්නේ එකම පොදු ධනවාදී අර්බුදයම පමණි. එම නිසා දේශපාලන අවබෝධයක් නොමැති සාමාන්‍ය ජනතාව මෙවැනි අර්බුදයන්හිදී වික්ෂිප්ත වූවත් අප එවැනි පුදුමයන්ට පත් නොවිය යුත්තේ, අර්බුදයේ පතුලේ ඇති දේශපාලන හේතු හොඳින් කිරා මැන බැලීමට හා තේරුම් ගැනීමට අපට හැකි නිසාය.

**"ආණ්ඩුවේ" පාර්ලිමේන්තු වර්ජනය**

ඔක්තෝම්බර් 26 වෙනිදා කඩිමුඩියේ අගමැති ලෙස මහින්ද රාජපක්ෂ පත් කිරීමත් සමග පැවති රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය වෙනුවට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් නම් කළ කැබිනට් මණ්ඩලයක් තමන් ආණ්ඩුව යැයි හඳුන්වා දෙමින් ක්‍රියාත්මක වීම ඇරඹීය. නමුත් ඔවුන්ට අවශ්‍ය පරිදි බහුතරයක් මන්ත්‍රීවරුන් සකස් කර ගැනීමට නොහැකි වීම නිසා දැන් ඔවුහු තමන් ආණ්ඩුව ලෙස හඳුන්වා ගත්තද පාර්ලිමේන්තුව වර්ජනය කරමින් සිටිති. සරලව කිවහොත් ලංකාවේ "ආණ්ඩුව" ඔවුන්ගේ පාර්ලිමේන්තුව වර්ජනයක යෙදී සිටී. ඔවුන් ආණ්ඩුවක් නම් ඔවුන්ට පාර්ලිමේන්තුවේ කටයුතු වර්ජනය කර කඩාකප්පල් කිරීමට හැකියාවක් තිබේද?

පසුගිය වකවානුවේ වසරක් පමණ ලංකාවේ පළාත් පාලන ආයතන මැතිවරණ කල්දැමීම නිසා පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා /නගර සභා/ මහ නගර සභා) මහජන නියෝජිතයින් පත්කර ගත නොහැකිව පැවැතිණි. නමුත් ඒ මොහොතේ එම ආයතන මගින් සිදුවන සේවාවන් අඛණ්ඩව කිරීමට හැකි වූයේ ලේකම්වරුන් හා නාගරික කොමසාරිස්වරුන් ආයතනවල මූල්‍ය පාලනයේ ප්‍රධානින් ලෙස ව්‍යවස්ථාවෙන්ම කටයුතු කිරීමේ බලය ලබා තිබූ නිසාය. දැනට පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් නැති වකවානුවේ වෙනදාටත් වඩා කාර්යක්ෂම සේවාවක් සැපයූ අතර මන්ත්‍රීවරුන්ගේ මැදිහත්වීමෙන් කොමිස් මුදල් ලබා නොගැනීම නිසා සභාවන්ට සෘජුව ආදායම ලැබීමෙන් ලාභ ලබන තත්වයකටද පත්විය.

පළාත් සභාවන්ද මෙ වනවිටත් බහුතරයක් විසුරුවා ඇතත් ඡන්ද කල්යාම නිසා මන්ත්‍රීවරුන් නොමැති පළාත් සභා බවට පත්වී ඇත. නමුත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරුන් මගින් මූල්‍ය පාලනයේ ක්‍රියාවලිය සිදු කරන බැවින් පළාත් සභාද මන්ත්‍රීවරුන්ගෙන් තොරව ක්‍රියාත්මක වේ.

මේ සියලු අත්දැකීම් නිසා දැන් පාර්ලිමේන්තුවම අකර්මණ්‍ය තත්වයක පැවතියද ආණ්ඩු පක්ෂය නොපැමිණියද, පාර්ලිමේන්තුවක් රැස් නොවුණද ආර්ථිකය පවත්වාගෙන යාමට හැකියාවක් නැතිදැයි යමෙකුට සිතිය හැකිය. එසේම වැටුප්, දීමනා, වරප්‍රසාද ආරක්ෂකයින් සහිත මෙවැනි පාර්ලිමේන්තුවක් පවත්වාගෙන යනවාට වඩා පාර්ලිමේන්තුවම වසා දමා, රට පවත්වාගෙන යාමක් කළ නොහැකිදැයි යමෙකුට සාධාරණ පැනයක් නැගිය හැකිය. නමුත්, එය එසේ නොවේ. ප්‍රාදේශීය සභා, පළාත් සභාද ඇතුළු මුළු රටේම මූල්‍ය පාලනයේ බලය ව්‍යවස්ථානුකූලව ඇත්තේ පාර්ලිමේන්තුවටය. පාර්ලිමේන්තුවේ මූලික කාර්යයන් දෙකකි. එනම්, රටේ මූල්‍ය පාලනයේ කටයුතු සිදු කිරීම හා නීති පැනවීමේ කටයුත්තයි. ඒ නිසා පාර්ලිමේන්තුව අරාජිකවීම හෝ "ආණ්ඩුවක්" පාර්ලිමේන්තුවේ වර්ජනයේ ප්‍රතිඵලය වන්නේ ප්‍රායෝගිකව මුදල් වෙන්කිරීම හා මූල්‍ය පාලනයේ ක්‍රියාවලිය අඩපණවීමත්, නීති අණපනත් මගින් අවශ්‍ය "රාජ්‍යය" මෙහෙයවීම නතරවීමත්ය.

**රුපියල ඇදවැටීම**

දිගින් දිගටම ඩොලරයට සාපේක්ෂව රුපියල බාල්දුවීම (කඩාවැටීම) නතර වීමක් නොමැතිව සිදුවෙමින් පවතී. රුපියල මිල තීරණය වීම ඩොලරයට ඇති ඉල්ලුම හා සැපයුම මත තරගකාරීව පාලනයකින් තොරව පැවැතීම ආර්ථික වශයෙන් වාසිදායක වන්නේ ඉතා ශක්තිමත් අපනයන වෙළඳාමක් ඇති හා විදේශ භාණ්ඩ හා සේවා ආනයනය මත රඳා නොපවතින රටකටය. නමුත් ලංකාවේ වත්මන් ආර්ථිකය ඊට සපුරා පරස්පරය. දැන් මතුවී ඇති දේශපාලන අස්ථාවරභාවය නිසා තවදුරටත් සිදුවිය හැක්කේද ලෝක ආර්ථිකය තුළ ලංකාව රටක් ලෙස ශක්තිමත්වීම නොව දුර්වල වීමය. අපගේ සංචාරක කර්මාන්තය දුර්වලවීම රටට ගලා එන ඩොලර් විශාල ප්‍රමාණයක් තාවකාලිකව හෝ නතර කිරීමට සෘජු සාධකයක් වනු නොඅනුමානය. මෙම දේශපාලන කුමන්ත්‍රණයේ මහින්ද රාජපක්ෂ පාර්ශ්වය කුමන්ත්‍ර විපක්ෂයේ සිටියෙදී ප්‍රකාශ කරන්නේ රුපියල කඩාවැටීම නතර කිරීමේ සූත්‍රය - මැජික් යෂ්ටිය ඔවුන් සතු බවයි. නමුත් කුමන්ත්‍රණයෙන් පසු බලයේ සේයාවක් තාවකාලිකව දකින විට කියන්නේ රුපියල කඩාවැටීම අතින් අල්ලා නතර කරන්නද කියාය. බලය සඳහා ජනතාවගේ ප්‍රශ්න දැඩි ලෙස යොදාගන්නා මේ දේශපාලන දෙබිඩ්ඩන් ජනතාව විසින් තේරුම්ගත යුතුය.

**ණය ගෙවීමේ අර්බුදය**

ඉදිරි වසරේ ජනවාරි 15වැනි විට ලංකාව අඩුම තරමේ ඩොලර් බිලියනයක්වත් ණය ආපසු ගෙවිය යුතුය. ඒ සඳහා පවතින්නේ කවුරු අගමැති වූ ආණ්ඩුවක්දැයි අදාළ නොවේ. දැනටමත් මෙම තාවකාලික අටවා ගත් ආණ්ඩුව චීන සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 500ක් ණය ඉල්ලා ඇතැයි වාර්තාවේ. 2017 දෙසැම්බර් 31 වන විටම රට සමස්ත ණය බර රු. කෝටි 10 ලක්ෂ 34,606ක් විය. ලබන වසරේදී තවත් ඇමරිකානු ඩොලර් මිලියන 5800ක් වත් ණය ගෙවීමට සොයාගත යුතුය. 2018 වසරේ සැප්තැම්බර් වනවිට පැවැති වික්‍රමසිංහ පාලනයට ඇමරිකානු ඩොලර් මිලියන 4522ක් ජාත්‍යන්තර ණය ලබාදීමට එකඟ වූ අතර එයින් මුදාහැර තිබුණේ එ.ජ. ඩොලර් මිලියන 3621ක් පමණි. මෙම ඉතිරි කොටස මෙම පවතින අස්ථාවරතාවය යටතේ ලබා දෙනු ඇතැයි විශ්වාස කළ නොහැකිය. එම නිසා ණය අර්බුදයද අවුලෙන් අවුලට යනු මිස රටට - ජනතාවට සුභවාදී ලෙස තාවකාලිකව හෝ විසඳේ යැයි කිව නොහැක.

**සංචාරක කර්මාන්තයේ බිඳවැටීම**

30 වසරක යුද්ධය අවසන් වීමෙන් පසුව ලංකාවට සංචාරක අවධානය යොමු වූ අතර ලංකාව සංචාරයට සුදුසු රටක් ලෙසටද පසුගිය වකවානුවේ ජාත්‍යන්තර මාධ්‍ය තුළ ප්‍රචාරය විය. නමුත් මෙම දේශපාලන කුමන්ත්‍රණය ප්‍රකාශයට පත්වූ අවස්ථාවේ සිට ලංකාව ලෝකය හමුවේ හැල්ලුවට ලක් වූ අතර, ලංකාවට පැමිණීමට වෙන්කිරීම කළ සංචාරකයින් ගෙන්ද 25% ක් පමණ එම ගමන් අවලංගු කර ඇත. මෙම සංචාරක කාලවකවානුවේ ඒමට නියමිත සංචාරකයින් නොපැමිණීම නිසා ලංකාවට, ආර්ථිකයට අහිමි වූ විදේශ විනිමය ප්‍රමාණය තවම ගණනය කර නැත. නමුත් ඒ පාඩුව ආර්ථිකයට දැරිය නොහැකි තරම් වන බව නම් නිසැකය.

**කොටස් වෙළඳපොළ බිඳවැටීම!**

දේශපාලන අස්ථාවරය සෘජුවම බලපාන තවත් ක්ෂේත්‍රයක් වන්නේ, කොටස් වෙළඳපොළ කෙරෙහිය. දැනට ඇතිවී තිබෙන අරාජිකත්වය හමුවේ විදේශ ආයෝජකයින් තම ආයෝජන ඉවත් කර ගෙන යාම අරඹා ඇත. මෙම වසරේදී විදේශිකයින් විසින් රුපියල් මිලියන 17,322ක් වටිනා කොටස් මේ වනවිට කොටස් වෙළඳපොළෙන් ඉවත් කරගෙන ගොස් ඇති අතර මෙම නොවැම්බර් මාසයේදී පමණක් එසේ ඉවත් කරගෙන ඇති ප්‍රමාණය රුපියල් මිලියන 4500කි. එසේම සෛවරී බැඳුම්කර විකුණා ඇති ප්‍රමාණය රුපියල් මිලියන 18,004කි. එම මුදල් රට තුළට පැමිණීම වෙනුවට රටින් එළියට ගලා ගිය ප්‍රමාණයන්ය.

**අතුරු සම්මතය සම්මතද?**

මේ වන විට ජනාධිපතිගේ අභියාචනය පරිදි අතුරු සම්මත ගිණුමක් මගින් ඉදිරි මාස 4කට මුදල් වෙන්කර ගැනීමක් කර ඇතැයි මාධ්‍යවල පළවී ඇත. ජනාධිපතිට හෝ අමාත්‍ය මණ්ඩලයට පමණක් තම අභිමතය පරිදි එසේ මුදල් වෙන් කිරීමක් කළ හැක්කේද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

**15 වැනි පිටුවට**


"ප්‍රාදේශීය සභා, පළාත් සභාද ඇතුළු මුළු රටේම මූල්‍ය පාලනයේ බලය ව්‍යවස්ථානුකූලව ඇත්තේ පාර්ලිමේන්තුවටය. පාර්ලිමේන්තුවේ මූලික කාර්යයන් දෙකකි. එනම්, රටේ මූල්‍ය පාලනයේ කටයුතු සිදු කිරීම හා නීති පැනවීමේ කටයුත්තයි. ඒ නිසා පාර්ලිමේන්තුව අරාජිකවීම හෝ "ආණ්ඩුවක්" පාර්ලිමේන්තුවේ වර්ජනයේ ප්‍රතිඵලය වන්නේ ප්‍රායෝගිකව මුදල් වෙන්කිරීම හා මූල්‍ය පාලනයේ ක්‍රියාවලිය අඩපණවීමත්, නීති අණපනත් මගින් අවශ්‍ය "රාජ්‍යය" මෙහෙයවීම නතරවීමත්ය."



"දේශපාලන නිදහස ලැබූ පමණින්ම වැඩකරන ජනතාව එකවරම දුප්පත්කමෙන් නිදහස නොලැබුවත් එයින් ඔවුනට ලැබෙන්නේ දුප්පත්කමට විරුද්ධව සටන්කිරීමට උපයෝගී කරගත හැකි අවියකි. කම්කරුවන්ගේම සමගිය හැර දුප්පත්කමට විරුද්ධව සටන් කිරීමේ වෙනත් මගක් නැත. එහෙත් දේශපාලන නිදහස ඇතොත් මිස කෝටි ගණන් ජනතාවට සමගි විය නොහැකිය."

**ලෙනින්**
**කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර සන්ධානය, 27 පිටුව**

# එක්සත් ජනපදය ඉරාන පඹ ගාලක




පසුගිය නොවැ. 05වැනිදා එක්සත් ජනපදය යළිත් වතාවක් ඉරානයට ආර්ථික සම්බාධක පැනවීය. ඉරාන බැංකු 50කට හා එහි ශාඛාවන්ට, ඉරාන ජාතික ගුවන් සේවයට, නැව් නාවික කර්මාන්ත 200කට, ඉරාන පරමාණු බලශක්ති සංවිධානයට හා පුද්ගලයන් ගණනාවකට මේ ආකාරයෙන් සම්බාධක පනවන ලදී. මෙම සම්බාධක පැනවීමේ අරමුණ වන්නේ ඉරාන ඛනිජ තෙල් වෙළඳාම මුළුමනින්ම නවතා දැමීමය.

එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, රුසියාව හා චීනය යන රටවල් හය ඉරානය සමග සිදුකළ සාකච්ඡා අවසානයේ එළඹි න්‍යෂ්ටික ගිවිසුමෙන් එක්සත් ජනපදය පසුගිය මැයි මාසයේදී ඉවත් වූයේ ඉරානය එකී ගිවිසුම බිඳ දමා ඇති බව ප්‍රකාශ කරමිනි. එහෙත් ඉතිරි රටවල් පහත්, ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරියත් එය ප්‍රතික්ෂේප කරන අතර ඉරානයද න්‍යෂ්ටික ගිවිසුම අනුව කටයුතු කරමින් සිටී. මෙම න්‍යෂ්ටික ගිවිසුම එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළත්, ආරක්ෂක මණ්ඩලය විසිනුත් අනුමත කරනු ලැබූ අතර ආරක්ෂක මණ්ඩලයේ 2237 යෝජනාව ලෙස එය සම්මත කරනු ලැබ ඇත. එක්සත් ජනපදය මෙම ගිවිසුමෙන් ඉවත් වූයේ ඒක පාර්ශ්විකවය. ඒ, ඔවුන් ඉදිරිපත් කළ හේතු තහවුරු නොකරමිනි.

එක්සත් ජනපදය සම්බාධක පැනවීමේදී රටවල් 06කට මාස 06ක සහන කාලයක් ලබා දී ඇත. ජපානය, දකුණු කොරියාව, ඉන්දියාව, චීනය, තායිවානය, තුර්කිය, ග්‍රීසිය හා ඉතාලිය එකී රටවල්ය. දකුණු කොරියාවත් ඉන්දියාවත් තම රටට අවශ්‍ය බොරතෙල්වලින් විශාල ප්‍රමාණයක් ඉරානයෙන් ආනයනය කරන අතර ඉරාන බොරතෙල් නිෂ්පාදනයෙන් 1/3ක්ම චීනය විසින් ආනයනය කරනු ලබයි. ඕනෑම රටක් හෝ ව්‍යාපාරයක් ඉරානය සමග ගනුදෙනු කළහොත් ඔවුන්ටද වක්‍ර සම්බාධක පනවන බවටත් එක්සත් ජනපද වෙළඳපොළ තහනම් කරන බවටත්, එසේ වුවහොත් ඔවුන්ටද දරුණු ප්‍රතිවිපාක විඳින්නට සිදුවන බවටත් එක්සත් ජනපදය විසින් අනතුරු අඟවා තිබේ.

සම්බාධක පනවමින් එක්සත් ජනපදය, ඉරානයට බලකරමින් සිටින්නේ ඉරාකය, යේමනයට, ලෙබනනයට, සිරියාවට හා ඉරාකයට සිදු කරන මැදිහත්වීම් වහාම නවතා දමන ලෙසටයි. එසේම ඉරානය එහි විප්ලවීය ප්‍රතිපත්තිය 180°කින් ආපසු හැරවිය යුතු බවත් එසේ නොවුණහොත් එරට ආර්ථික වශයෙන් පොඩිපට්ටම් කරන බවටත් එක්සත් ජනපද රාජ්‍ය ලේකම් මයික් පොම්පියෝ පසුගියදා අනතුරු අඟවා සිටියේය.

**ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරියත් ඉරාන න්‍යෂ්ටික ගිවිසුමේ අනෙකුත් පාර්ශවකාර රටවලුත් පවසන්නේ ඉරානය න්‍යෂ්ටික ගිවිසුමේ එකඟතා කඩකර නොමැති බවයි. එසේ තිබියදී එක්සත් ජනපදය මේ අයුරින් ඒක පාර්ශ්විකව ඉරානයට සම්බාධක පනවන්නේ මන්ද? එසේම එක්සත් ජනපදයේ මෙම ක්‍රියාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එකඟතාවන් හා විශේෂයෙන්ම ආරක්ෂක මණ්ඩලයේ 2237 වන යෝජනාව උල්ලංඝනය කිරීමකි. ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරියත්, ජාත්‍යන්තර අධිකරණයත් හෑල්ලුවට ලක්කිරීමකි.** එහෙත් එය විභාග කිරීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවේ.

මෙලෙස සම්බාධක පැනවීමේ සැබෑ හේතුව වන්නේ ඉරානය යළි න්‍යෂ්ටික අවි නිෂ්පාදනය ආරම්භ කිරීම නොවේ. මැදපෙරදිග කලාපය තුළ ඉරානයේ එක්සත් ජනපද විරෝධී ක්‍රියා කලාපයයි. මේ වන විට ඊශ්‍රායලයට මැදපෙරදිග කලාපය තුළ සිය අරමුණු ජයග්‍රහණය කිරීමේදී ප්‍රබල බාධකයක් වී ඇත්තේ ඉරානයයි. එබැවින් එය දුර්වල කර දැමිය යුතුය. එක්සත් ජනපදය මේ සිදුකරමින් සිටින්නේ එක් අතකින් ඊශ්‍රායලයේ ඍජු වුවමනාව ඉටු කිරීමයි. අනෙක් අතට එය එක්සත් ජනපදයේ කලාපීය වුවමනාවම වීමයි.

එහෙත් එක්සත් ජනපදයේ මෙම අත්තනෝමතික සම්බාධක පැනවීම ඔවුන්ගේ අභිප්‍රාය පමණක් ඉටු නොකරන බව පෙනෙන්නට තිබේ. එය එක්සත් ජනපදයට අවාසි සහගත ප්‍රතිඵල ද අත්කරදීමට නියමිතය. එක්සත් ජනපදයේ මෙම සම්බාධක පැනවීම ජාත්‍යන්තර ප්‍රජාවගේ පොදු හෙළා දැකීමට ලක්වී තිබේ. එහිදී එක්සත් ජනපදය තනි වී ඇත. එසේම මේ නිසා එක්සත් ජනපදයත් යුරෝපා සංගමයත් අතර ප්‍රතිවිරෝධතා වර්ධනය වී තිබේ. චීනය හා රුසියාව සමඟ ගැටුම උත්සන්න වී තිබේ. ඉරානය සමග වෙළඳ ගනුදෙනු කරන රටවල් බොහෝ ගණනක් මේ වන විට මෙම සම්බාධක නොතකා ඉරාන බොර තෙල් මිලට ගැනීමේ විවිධ ක්‍රම යොදා ගැනීමට උත්සාහ කරමින් සිටියි. මෙකී රටවලින් පැමිණි බලපෑම කෙතරම් ප්‍රබල වීද යත් රටවල් 08කට මාස 06ක සහන කාලයක් ලබාදීමට සිදුවූයේද එබැවිනි.

කිසියම් රටක් ඒකපාර්ශ්විකව පනවනු ලබන සම්බාධක හේතුවෙන් අනෙකුත් රටවල්වලට සම්බාධකවලට ලක්වන රට සමග ගනුදෙනු කිරීමට ඉඩ නොදීම කෙතරම් යුක්ති සහගතද? ඉන් උල්ලංඝනය වන්නේ, එකී රටවල ස්වාධීනත්වය නොවේද? ස්වාධීන රාජ්‍යයක් විසින් වෙළඳාම් කළ යුත්තේ හෝ නොකළ යුත්තේ කවර රටක් සමගදැයි තවත් රාජ්‍යයකට තීරණය කළ හැකිද?

යුරෝපා සංගමය, රුසියාව හා චීනය මෙම සම්බාධක මඟහරිමින් කටයුතු කිරීමට විවිධ ක්‍රම අත්හදා බලමින් සිටී. ඒ අනුව ඔවුහු විශේෂ භාණ්ඩ හුවමාරු ක්‍රමයක් හඳුන්වා දීමටත් දේශීය මුදල් ඒකකවලින් ඉරානය සමග වෙළඳ ගනුදෙනු කිරීමටත් විකල්ප බැංකු ක්‍රමයක් සැකසීමටත් කටයුතු කරමින් සිටිති.

මෙම ක්‍රියාමාර්ගයන් සාර්ථක වුවහොත් එය එක්සත් ජනපද ආධිපත්‍යයට ප්‍රබල පහරක් වනු නොඅනුමානය. එක්සත් ජනපදයේ මෙම ක්‍රියාමාර්ග නිසැකවම ඩොලරයේ ආධිපත්‍යය දුර්වල කරමින් එක්සත් ජනපදයට බලාපොරොත්තු නොවූ අවාසි සහගත ප්‍රතිඵල අත්කර දෙනු ඇත.

## ප්‍රංශය: කහ බැනියම් විරෝධයකට මැදිවී



ජනාධිපති මැක්‍රෝන්ගේ ආණ්ඩුව විසින් ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව ප්‍රංශය පුරා පැන නැගුණ විරෝධතා මේ වන විට දෙවන සතියද ඉක්මවා තිබේ. 'කහ බැනියම්' විරෝධතා ලෙස හඳුන්වන මෙම විරෝධතා රැල්ල ප්‍රචණ්ඩ ආකාරයක්ද ගෙන තිබේ. පෙළපාලිකරුවන් හා විරෝධතාකරුවන් විසුරුවා හැරීම සඳහා පොලීසියට ජල ප්‍රහාර හා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීමටද සිදුවිය.


මැක්‍රෝන් රජයේ ආර්ථික ප්‍රතිපත්තියට එරෙහි වන ප්‍රංශයේ පොදු ජනතාව වෘත්තීය සමිති හා දේශපාලන පක්ෂ මැක්‍රෝන් හඳුන්වන්නේ 'ධනවතුන්ගේ ජනාධිපතිවරයා' ලෙසය.

## BREXIT: යුරෝපයෙන් ඉවත් වන ගිවිසුමක





පසුගිය නොවැ. 25වන දා යුරෝපා සංගමයේ රටවල් 28හි නායකයෝ බ්‍රසල්ස් නුවරට රැස්වූයේ යුරෝපා සංගමයෙන් වෙන්වන පළමු සාමාජිකයා වන බ්‍රිතාන්‍යයේ වෙන්ව යාමට අදාළ ගිවිසුම හා යුරෝපා සංගමයේ සහ බ්‍රිතාන්‍යයේ අනාගත සබඳතා පිළිබඳ ප්‍රකාශනයට අත්සන් තැබීමටයි. ඒ සමග බ්‍රිතාන්‍යයේ වෙන් වී යාමට නිල අනුමැතිය ලැබෙන අතර එහි එකඟතා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත යුතුව ඇත.

## ග්‍රීසිය: කම්කරු පක්ෂවල ජාත්‍යන්තර සමුළුවක්




කොමියුනිස්ට් පක්ෂ හා කම්කරු පක්ෂවල ජාත්‍යන්තර හමුව නොවැම්බර් 23දා ග්‍රීසියේ ඇතන්ස් නුවරදී ආරම්භ විය. මෙවර පැවැත්වූයේ එහි 20වැනි සමුළුවයි. සෝවියට් දේශයේ හා සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු මෙම හමුව ගොඩනැගීමට මූලික වූයේ ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂ යයි. (KKE) මෙම සමුළුව පිළිබඳ හා එහිදී ඉදිරිපත් වූ ලේඛන solidnet.org පිවිසීමෙන් ලබාගත හැකිය.

## බ්‍රිතාන්‍යය: පිළිකාවට නව ප්‍රතිකාරයක්



බ්‍රිතාන්‍ය විද්‍යාඥයින් පිරිසක් පිළිකාවට නව ප්‍රතිකාර ක්‍රමයක් සොයා ගෙන තිබේ. එනම් පිළිකා සෛල විනාශ කළ හැකි වෛරසයක් ජාන ඉංජිනේරු විද්‍යාව හරහා නිපදවීමට ඔවුන් සමත්ව සිටී. මෙම වෛරසය පිළිකා සෛල තුළ වර්ධනය වී එම සෛල විනාශ කිරීමට සමත්ය.

## ඉන්දියාව: නව දිල්ලියට ගොවි ජන ගඟක්



පසුගිය නොවැම්බර් 29 වනදා ඉන්දියාවේ ගොවීහු ලක්ෂයක් පමණ නවදිල්ලි අගනුවරට රැස්වී දැවැන්ත විරෝධතා පා ගමනක් පැවැත්වූහ. ඔවුන්ගේ ඉල්ලීම වූයේ ගොවි ණය අහෝසි කරන ලෙසටත්, ඉන්දියාවේ කෘෂිකාර්මික අර්බුදයට වහා පිළියම් යොදන ලෙසත්ය.

ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් ගොඩනැගුණු සංවිධානයකින් මෙම විරෝධතා පා ගමන සංවිධානය කළ අතර ඊට ඉන්දියාව පුරා ගොවි සංවිධාන 200ක් පමණ එක්වී සිටියහ.

ගොවි ණය හා අස්වැන්නට නිසි මිලක් නොලැබීම ආදී හේතු නිසා පසුගිය අවුරුදු 10 තුළ ඉන්දියාවේ ගොවීන් 300,000ක් පමණ සිය දිවි හානිකර ගෙන ඇත.

# සමාජවාදය තුළ ශික්ෂණය



"ඒ සමාජවාදීන්ගේ කෘති අපි නැවත වරක් කියවා බලමු නම්, විද්‍යාව එහි ධනපති බැඳීම්වලින්ද, ධනපති ක්‍රමයට බැඳුණු එහි වහල්භාවයෙන්ද, කැත ධනපති කෑදරකමෙහි වුවමනාවන් කෙරෙහි බැඳුණු එහි වහල්භාවයෙන්ද මුදාගනු ලැබෙනු ඇත්තේ සමාජවාදය විසින් පමණකැයි යනු, ඒ සියලු දෙනාම, කිසිම විශේෂයක් නොමැතිව පෙන්වා දී තිබෙන බව දක්නට පිළිවන."

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**8වැනි වෙළුම,**
**134පිටුව**

මේ දිනවල රටේ උත්තරීතරම ආයතනය යැයි සැලකෙන පාර්ලිමේන්තුව තුළ සිදුවූ සිදුවීම් හේතුවෙන් රට පුරා ශික්ෂණය, හැදියාව, සදාචාරය ආදී මාතෘකා පිළිබඳ සංවාදයක් මතුවී තිබේ. රටේ උත්තරීතරයැයි සම්මත ආයතනය තුළ ගරු කටයුතු ජනතා නියෝජිතයන් යැයි කියැවෙන පුද්ගලයින් හැසිරුණු ආකාරය කාගේත් අප්‍රසාදයට හා පිළිකුලට භාජනය වී තිබේ. එහි වරද ඇතැම්හු පුද්ගලයන් මතද, තවකෙකු දේශපාලන පක්ෂ මතද ආදී වශයෙන් පටවමින් සිටිති.

රට තුළ මතුවී ඇති දේශපාලන අර්බුදය තුළ ධනේශ්වර ක්‍රමයේත් විශේෂයෙන්ම ධනේශ්වර ආයතනවලත් ධනේශ්වර ව්‍යවස්ථා ධනේශ්වර නීතිය ආදියේත් සැබෑ ස්වරූපය ඉතා හොඳින් හෙළිදරව් වෙමින් තිබේ. ධනේශ්වර ශික්ෂණයේ නිරුවත පෙනෙන්නට පටන්ගෙන තිබේ.

'ශික්ෂණය' යන්නට යෙදෙන ඉංග්‍රීසි වචනය Discipline යන්නයි. එනම් 'විනය'යි. එහෙත් පොදු භාවිතයේදී ශික්ෂණය යන්නෙන් අදහස් කරන්නේ හුදු විනයම පමණක් නොවන බවත් ඒ තුළ විනය මෙන්ම හැදියාව, අධ්‍යාපනය, සදාචාරය, ආචාර ධර්ම ආදී සියල්ල ඒ තුළ අඩංගු බවත් අපට හැඟේ.

මිනිසා සත්ව රංචුවෙන් වෙන්වී සමාජමය සත්වයෙකු වූ පසු එම සමාජයේ යහපැවැත්ම සඳහා ශික්ෂණය අත්‍යවශ්‍ය සාධකයක් විය. ශික්ෂණය බිහිවන්නේ මානව සංහතිය පවත්වා ගැනීමේ හා ආරක්ෂා කර ගැනීමේ සමාජමය අවශ්‍යතාව වෙනුවෙනි. ශික්ෂණය නොමැති වූ කළ මිනිස් සමාජය සත්ව ගාලක් බවට පත්වේ. ශික්ෂණය මගින් නිශ්චිත සමාජමය කාර්යයන් ඉටුකිරීමට සූදානම් පුද්ගලයෙකුගේ චරිත ගුණයන් නිර්මාණය කරනු ලැබේ. ඊට සොබාදහම, සමාජය, තාක්ෂණය හා යථාර්ථය පරිණාමනය කිරීම සඳහා අත්‍යවශ්‍ය දැනුමද ප්‍රායෝගික හා බුද්ධිමය කුසලතාවය හා භාවිතයද නිර්මාණාත්මක කටයුතුවල අත්දැකීම්ද ලෝකය, මිනිසුන් හා තමාම කෙරෙහි මිනිසා දක්වන ආකල්පයෙහි ආකාරයන්ද ආචාර සම්පන්නකමද ඇතුළත් වේ.

මානව ඉතිහාසයේ මුල් අවධිවලදී දරුවන් ශික්ෂණය කිරීම ඉටු කරන ලද්දේ වැඩිහිටියන් සමග ඔවුන්ගේ ශ්‍රම ක්‍රියාකාරිත්වය තුළින් පමණකි. එසේ වුවද සමාජ සංවර්ධනයත් සමග දැනුම හා අත්දැකීම් ලබාදීමේ එවැනි සීමිත ක්‍රියාමාර්ගයන් වඩා වඩාත් ජීවිතයේ අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් විය. පාසල් බිහිවූයේ ඉන් පසුවය.

(ඉස්කෝලය යන වචනය ග්‍රීක භාෂාවේ 'විනෝද කාලය ගත කිරීම', 'ශ්‍රමයට පසු විවේකය' යනුවෙන් අර්ථකථනය වේ. වඩාත් පැසුණු හා දැනමුතු පුද්ගලයින් ගැටවරයින් හා දරුවන් සමග පැවැත්වූ සල්ලාප පුරාණ ග්‍රීසියේ ඉස්කෝල යනුවෙන් හඳුන්වනු ලැබිණි.)



පංති සමාජය තුළදී ශික්ෂණය පංතිමය ස්වභාවයක් අත්පත් කර ගත්තේය. ධනවාදයේදී ධනපතියා, දේපළ හිමියා වැඩි වැඩියෙන් ලාභ ලබා ගැනීමත්, දේපළ ගොඩගසා ගැනීමත් සිය එකම ඉලක්කය ලෙස කටයුතු කරයි. ධනපති සමාජයේදී පොදු අධ්‍යාපනයේ හා ශික්ෂණයේ ස්වභාවය පිළිබඳ එංගල්ස් මෙසේ පවසයි. "**ධනේශ්වර පංතිය කම්කරුවාගේ පැවැත්ම ගැන සැලකිල්ලක් දක්වන්නේ කම්කරුවා ඔවුන්ට අත්‍යවශ්‍ය නිසාම පමණක් නම් ඔවුන් කම්කරුවාට අධ්‍යාපනය ලබා දෙන්නේද ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාලන ප්‍රමාණයට පමණක් වීම පුදුමයට හේතුවක් නොවන්නේය.**"

"ධනේශ්වර පංතිය කම්කරුවාගේ පැවැත්ම ගැන සැලකිල්ලක් දක්වන්නේ කම්කරුවා ඔවුන්ට අත්‍යවශ්‍ය නිසාම පමණක් නම් ඔවුන් කම්කරුවාට අධ්‍යාපනය ලබා දෙන්නේද ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාලන ප්‍රමාණයට පමණක් වීම පුදුමයට හේතුවක් නොවන්නේය."

ධනපති ක්‍රමය තුළදී ශික්ෂණය මගින් උත්කර්ෂයට නංවන්නේ පුද්ගලිකත්වය, තරගය, ලාභය පසුපස හඹායාම ආදී ගුණාංගයි. එවිට තම පුද්ගලික බල වුවමනාවන් වෙනුවෙන් තමන්ම උත්තරීතර යයි නම් කළ ආයතන, ව්‍යවස්ථා, එකඟතාවන් සියල්ල නොසලකා කටයුතු කළ හැකිය. තම පුද්ගලික බල වුවමනාවන් වෙනුවෙන් රටක, ජනතාවක අනාගතය බිලිදිය හැකිය.

සමාජවාදය තුළදී පුද්ගලයා ශික්ෂණය කරනු ලබන්නේ, ඊට ගුණාත්මකව වෙනස් ආකාරයටයි. එහිදී පෞද්ගලිකත්වය වෙනුවට උත්කර්ෂයට නංවන්නේ සාමූහිකත්වයයි. ඉන් අදහස් කරන්නේ, සමාජවාදය තුළදී පෞද්ගලිකත්වය නොසලකා හැරෙන්නේය යන්න නොවේ. සමාජවාදය තුළදී පෞද්ගලිකත්වයක් නැතැයි යන ප්‍රචාරය ධනපති පංතිය විසින් සමාජවාදයට එරෙහිව ගොඩනඟන මතයකි. සමාජවාදය තුළදී පෞද්ගලිකත්වය අහෝසි වන්නේ නැත. ඒ වෙනුවට සාමූහිකත්වය තුළ පෞද්ගලිකත්වය හැඩ ගන්වනු ලැබෙයි. සමාජවාදයේදී සෑම පුද්ගලයෙකුටම අනන්‍ය පෞද්ගලිකත්වයක් ගොඩනංවනු ලබන අතර - හා ගොඩනැංවෙන අතර - එම පෞද්ගලිකත්වය කිසිවිටෙකත් ධනවාදයේ පෞද්ගලිකත්වය මෙන් සමාජයේ පොදු වුවමනාවන්ට ප්‍රතිවිරෝධී, සමාජයේ පොදු වුවමනාවන්ට සතුරු පෞද්ගලිකත්වයන් නොවන්නේය. අනෙකාගේ පෞද්ගලිකත්වයට ගරු කිරීමට සමත්, අනෙකාගේ පෞද්ගලිකත්වය ඉවසීමට සමත්, පොදු සමාජයීය වුවමනාවන් වෙනුවෙන් තම පෞද්ගලිකත්වය හැඩගස්සවා ගැනීමට සමත් පුද්ගලයෙකු සමාජවාදය තුළදී බිහි වේ.

සමාජවාදය තුළදී තරගය උත්කර්ෂයට නංවන්නේ නැත. එහෙත් ඒ නිසා තරගය අහෝසි වන්නේද නැත. සමාජවාදය තුළදී අහෝසි වන්නේ ධනේශ්වර තරගයයි. ඒ වෙනුවට සමාජවාදී තරගය ගොඩනැංවේ. සාමූහික තරගය ගොඩනැඟෙන්නේ අනෙකා කෙසේ හෝ අභිභවා ලකුණු ලබා ගැනීමට නොවේ. වඩා වැඩි දැනුමක් අත්පත් කර ගැනීම වෙනුවෙනි. ක්‍රීඩාවේදී තරගය ගොඩනඟන්නේ තරු බිහිකිරීමට නොවේ. තම කණ්ඩායමට රටට ජයග්‍රහණ ගෙනදීම වෙනුවෙනි. එවිට තරු බිහිවේ. මේ ආකාරයෙන් පෞද්ගලික ජයග්‍රහණ සඳහා නොව පොදු ජයග්‍රහණ දිනාගැනීම වෙනුවෙන් වූ තරගයත් සමාජවාදය තුළ පවතින අතර එම තරගය තුළදී විශිෂ්ටයන් බිහිවීමද සිදුවේ. යුරි ගගාරින්, කියුබන් ජාතික බොක්සිං ශූර තියෝෆිලෝ ස්ටීවන්සන්, පිහිනුම් ලෝක ශූරයෙකු වන කර්පෙත්යාන්, වැන්නන් බිහි වූයේ එලෙසය.

සමාජවාදයේදී සමාජ ශික්ෂණය සඳහා මානව ජයග්‍රහණ විසින් අත්කර දුන් සියලු මෙවලම් භාවිතා කරයි. සමාජවාදී රජය අධ්‍යාපනයද කලාව හා සාහිත්‍යයද විද්‍යාවේ හා තාක්ෂණයේ නව සොයා ගැනීම්ද ක්‍රීඩාවද ආදී සියලු දේ සමාජ ශික්ෂණ කාර්යය සඳහා යොදා ගනී.

එසේම සමාජවාදයේදී සමාජ ශික්ෂණය තුළින් බිහි කරනු ලබන්නේ Format කරන ලද පුද්ගලයෙකු නොවේ. සමාජවාදය තුළදී බිහිවන්නේ Format කරන ලද යාන්ත්‍රික හා කප්පාදු කරන ලද මිනිසුන්ය යන්න ධනවාදය විසින් ගොතන ලද බොරුවකි. සමාජවාදී ශික්ෂණය විසින් බිහි කරනු ලබන්නේ නිර්මාණශීලී, ස්වාධීන හා නිදහස් මිනිසුන්ය.

ධනවාදී ශික්ෂණයෙන් හැඩගැසුණු පුද්ගලයා, පරිසරය විනාශ කිරීමටද පොදු දේපළ කොල්ලකෑමටද ජාතික සම්පත් විකුණා දැමීමටද පසුබට නොවේ. එහෙත් සමාජවාදය තුළදී ඒ සඳහා ඉඩ නොලැබේ. සමාජවාදය තුළදී වටිනාකම් ලෙස හුවා දක්වන්නේ කුමන ආකාරයකින් හෝ දේපළ ගොඩගසා ගැනීම, සාමූහිකත්වයට සතුරු පෞද්ගලිකත්වය ආදිය නොවේ. තම දක්ෂතාවන්ගෙන් තම හැකියාවන්ගෙන් සමාජය පෝෂණය කිරීමය. පොදු සමාජයීය ජයග්‍රහණ තමාගේ ජයග්‍රහණ ලෙස සැලකීමය. රටේ සම්පත්, පොදු දේපළ ආරක්ෂා කිරීමය. අනෙකාට ගරු කිරීමය. පරිසරය ආරක්ෂා කිරීමය. පරිසරය රැක ගැනීමය. තම රටට ආදරය කිරීමය. අනෙකුත් සංස්කෘතීන්ට ගරු කිරීමය. සූරාකෑමට ආසාධාරණයට හා අයුක්තියට එරෙහි වීමය.

මේ අයුරින් සමාජවාදී ශික්ෂණය මඟින් මනා පෞරුෂයෙන් යුතු මිනිසාට හා පරිසරයට ආදරය කරන, දැනුමේ හා සංස්කෘතියේ ඉහළට වටිනාකම් අත්කරගත් නව මිනිසෙකු බිහි කෙරේ.

# දැන යා යුතු ගමන

රටක පුරවැසින් සියලු දෙනාම එරට නීතියට යටත්ය. නීති විශාරදයන් පවසන්නේ, නීතියට පිටුපා කිසිවෙකුට කටයුතු කළ නොහැකි බවය. එහෙත් රටේ නීතියට, යුක්තියට පිටුපා මෙරට පාලකයන් නොයෙක් වර ක්‍රියා කළ අවස්ථා එමටය.

අද වනවිට ජනපති සිරිසේන රටේ ව්‍යවස්ථාවට, සදාචාරයට පිටුපා තමන්ගේ බලය රැක ගැනීම වෙනුවෙන් රටම ව්‍යාකූල, අස්ථාවර තත්වයකට ඇද දමා ඇත. තමාට හා තම පවුලට එරෙහිව ඇති දූෂණ චෝදනා, විභාග වන නඩුවලින් බේරීම සඳහා මහින්ද රාජපක්ෂටද බලය අවැසිවීම, සිරිසේනගේ දෙවන වරටත් ජනපතිකමේ රැඳී සිටීමේ වුවමනාව හා සමපාතවීම හේතුවෙන් මේ වනවිට රටේ දේශපාලන අර්බුදයක් නිර්මාණය කර ඇත. අනෙක් අතට ජනතා විරෝධී ලෙස කටයුතු කළ රනිල් බලය අත්හැරීමට අකමැත්තෙන් තවමත් අරලියගහ මන්දිරයේ රැඳී සිටී. ඒ අතරතුරේ ඔවුන් එකිනෙකා අතර රහසිගත හා රහසිගත නොවන සාකච්ඡාද පැවැත්වෙමින් තිබේ.

බලය ලබා ගැනීම හා ගත් බලය පවත්වා ගැනීම සම්බන්ධයෙන් එකිනෙකා කුමන්ත්‍රණය කරගන්නා අතරම ඔවුහු සාමාන්‍ය ජනතාවද ඒ සඳහා උපයෝගී කරගනිමින් සිටිති. ඒ අතර කාන්තාවන්ද එක් එක් පාර්ශවයන්ට බෙදී හඬ නගමින් සිටිති.

රටක සමාජීය, දේශපාලන, ආර්ථික ගැටලුවලදී, අර්බුදවලදී කාන්තාවන් නිහඬව නොසිට ඉදිරියට ඒම අගය කළ යුත්තකි. එහෙත් වැදගත් වන්නේ නිවැරදි දැක්මකින් හා එම ගැටලු විසඳා ගැනීමේ සැබෑ වුවමනාවකින් ඒ සඳහා මැදිහත්වීමය. එසේ නොමැතිව තමන් දැන හෝ නොදැන තවත් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ ඉත්තෙකු බවට පත්වීම නොවේ.

වත්මන් දේශපාලන අර්බුදයේදී, කොටසක් සිරිසේන, රාජපක්ෂලා වෙනුවෙන්ද තවත් කොටසක් රනිල්ලා වෙනුවෙන්ද සහයෝගය පළ කරමින් විවිධ උද්ඝෝෂණවල යෙදේ. මේවාට සහභාගි වන කාන්තාවන් හොඳින් වටහා ගත යුතු කාරණයක් වන්නේ තමන් සහයෝගය දක්වන්නේ කාගේ සුජාතභාවය වෙනුවෙන්ද යන්නය.

මේ පාර්ශවයන් මාරුවෙන් මාරුවට බලයේ සිටියදී කාන්තා හා ළමා අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන් කටයුතු කර තිබේද? දිනෙන් දින ඉහළ යන, කාන්තාවන් හා ළමුන්ට එරෙහිව සිදුවන හිංසා පීඩාවන්, අපරාධ වැළැක්වීමට ඔවුන් ගත් ක්‍රියාමාර්ග මොනවාද?, තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම වෙනුවෙන් අධ්‍යාපනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන වැඩි කිරීමට ඔවුන් කටයුතු කර තිබේද?, මැතිවරණයක් අභියස හෝ බලය මාරුවීමකදී කෙරෙන කෙටි කාලීන භාණ්ඩ මිල අඩු කිරීම් නොව, දිනෙන් දින වැඩිවන ජීවන වියදම් අඩු කිරීමට ඔවුන් ගත් දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳව කාන්තාවන් දැනුවත් විය යුතුය. මන්ද අප ආණ්ඩු බලයට පත් කරන්නේ පාලකයන්ට ඇති තරම් ජනතා දේපල මංකොල්ල කෑමට නොව ප්‍රතිපත්ති හා සැලසුම් මත රටක් ඉදිරියට ගෙන යාමටය.

එසේ නොමැතිව පුද්ගල ප්‍රතිරූප කෙරෙහි වන ආකර්ෂණය හෝ අන්ධ භක්තිය මත කටයුතු කිරීම අමනෝඥකමකි. ඔවුන් ලබාදෙන ඉතාම සුළු පුද්ගලික ප්‍රතිලාභ වෙනුවෙන් 'ඒ හොරුන්ට වඩා මේ හොරුන් හොඳය', 'දරුවන්ගේ අනාගතයට හෙණ ගැහුවත් කම් නැත අපේ අහවලා රජවිය යුතුය' යන බුද්ධි හීන මනෝභාවයෙන් දැන්වත් රටේ කාන්තාවන් මිදිය යුතුය.

එසේම මෙවැනි තත්වයකදී එක් එක් කාන්තා කණ්ඩායම් හුදෙකලාව කරන සටන්වලින්ද ඵලක් නොවනු ඇත. රටක් තුළ මතුවන අර්බුදවලදී කාන්තාවන්ට හා ළමුන්ට කියා වෙන වෙනම ආරක්ෂා වීමට හෝ වෙන වෙනම විසඳුම් සෙවීමට හෝ නොහැකිය. ඔවුන්ද මේ සමාජයේම කොටසක් බැවින් එම අර්බුදවලින් මිදී ජීවත් වීමට නොහැකිය. එනිසා කළ යුත්තේ නිහඬව සිටීම හෝ හුදෙකලාව සටන් කිරීම නොව ගැටලු, අර්බුදයන් හොඳින් වටහා ගනිමින් කාන්තාවන් ලෙස රට ගොඩ නැගිය හැකි දේශපාලන දැක්මක්. ප්‍රතිපත්තියක් සහිත පුළුල් දේශපාලන පෙරමුණක් වටා එක් රොක් වීමය. එසේ නොමැතිව වෙනත් විකල්ප නොමැත.



## එක්ව අත්වැල් බැඳ යනිමු...

දෙස් දෙවොල් තියති  
ගස්වැල් පවා  
වෙස් ගැන්මූ නැටුමට  
සිත් බිඳී  
වස් විඳිනූ සැක නෑ  
මිනියටත්  
ඇස් කන් වසා  
මග හැර ගියොත්..

පස් පව් කරන  
එළිපිට වුවත්  
දුස්චරිතයෙන් යුත්  
සිල්වතුන්  
උස් තනතුරින්  
හොබවන දනන්  
නිවටුන් මිස,  
අන් කවරකුන්?

කප්පම් ගන්න'යුරු  
මව්බිමෙන්  
ඇස් කන් වසා  
නරඹන එවුන්  
අකමුල් ගයා  
පළවමු ඉතින්  
එක්වන්ව අත් බැඳ  
ඉක්මනින්..

# ඇය රැකෙන සමාජයක් කරා...



සිදුවීම් සිදුවන්නේ කොක් හඬලා සිනාසීමට හෝ මහ හඬින් හඬා වැලපීමට නොවේ යැයි කියමනක් ඇත.

පසුගිය දිනෙක පෙන්වූ රූපවාහිනී පුවත් අතර නැරඹීමට අපහසු පුවත් කිහිපයක්ම දක්නට ලැබිණි. ඒ අතරින් එක් පුවතක් වූයේ තම පෙම්වතියගේ ගෙල සිරකර මරා දමන පෙම්වතෙක් හා එය නරඹමින් සිදුවීම ජංගම දුරකතනයෙන් වීඩියෝ කරන කිහිපදෙනෙකු සම්බන්ධවයි. එම සිද්ධිය දුටු සියලුදෙනා මහත් කම්පනයකට ලක් වන්නට ඇත. එහෙත් එයින් මෙවන් ඛේදවාචක අවසන් වේද?

එය මිනීමැරුමකි. එය සිදුවූයේ හොර රහසේ, අඳුරු රාත්‍රීයේ නොව මහ දවල් මිනිසුන් ගමන් ගන්නා මාවතක, මිනිසුන් බලා සිටියදීය. එහෙත් එදෙස නාට්‍යයක් නරඹන්නා සේ බලා සිටීමට තරම්, මිනිසත්කම එවන් තත්වයට පත් වූයේ කෙසේද? එකම ලේ, ඇට, මස්, නහරවලින් සැදුණු තවත් තමන් වැනි අයෙකු මිය යන බව ඔවුන්ට හැඟුණේ නැතිද? මරා දමන දෙස "වෙන කරන්න දෙයක් නැහැ", "බලාගෙන ඉමු" යි කියමින් සිටි ඔවුන් රොබෝවරුන් වැනිය.

කාන්තා හිංසනය වසරින් වසර වර්ධනය වී ඇති බව ඒ පිළිබඳ වාර්තා වන පුවත්වලින් හා සංඛ්‍යාලේඛනවලින් පෙනේ. මේ වනවිට රටේ සිදුව ඇති සමාජීය පරිහානියට අනුව ඉහත සඳහන් ආකාරයේ සිදුවීම්වලට තව තවත් ඉඩ කඩ විවර වීම වැළැක්විය නොහැක. නුගත්කම, දුප්පත්කම විසින් මිනිසුන් කාන්තා හිංසනය වෙත තල්ලු කර ඇත. මෙහි අනෙක් පැත්ත වන්නේ සමාජ අපචාරයි. කාන්තාවන් පමණක් නොව ළමුන්ද හිංසනයේ හා අපචාරවල ගොදුරු බවට පත්ව ඇත.

දෙසැම්බර් 10 දිනට මානව හිමිකම් දිනය යෙදී ඇත. කාන්තාවන්, ළමුන් හා වැඩිහිටියන් වෙනුවෙන් ජාත්‍යන්තර වශයෙන් දින වෙන්කර තිබුණද එහිදී බොහෝවිට සිදුවන්නේ ඒ සම්බන්ධව එම දින ආසන්නයේ සාකච්ඡාවට ලක් කිරීම පමණකි. මානව හිමිකම් දිනයද එවැන්නකි.

එම නිසා මෙවන් තත්වයක් නිර්මාණය වී තිබෙන්නේ පවතින සමාජ වටපිටාව අනුවය. කාන්තාවට සමාජය තුළ නිසි ගෞරවය ලැබීමට නම් ඇය රැකෙන සමාජයක් නිර්මාණය විය යුතුය. එම සමාජයේදී සියලු මිනිසුන්ගේ මානව අයිතීන් සුරැකෙනු ඇත. එම සමාජය ගොඩ නැගීම ප්‍රගතිශීලී සියලුදෙනාගේ වගකීම වන අතර කාන්තාව එහි ඉදිරියෙන්ම සිටිය යුතුය.

ඉතිහාසයේ කතාව... 04

# ප්‍රාථමික සමාජය ඇරඹෙයි...!



ඉතිහාසයේ ගමන් මග විවිධ අය විසින් විවිධ ඉගැන්වීම් ගුරුකුල විසින් විවිධ නම්වලින් බෙදා තිබූ බව අප මීට පෙරද සඳහන් කර ඇත. සමහරු ඉතිහාසයේ යුග බෙදීමේදී මිනිසාගේ නිෂ්පාදන ක්‍රමය (දඩයම්, එඬේර, ගොවි ආදී ලෙස) පදනම් කරගත් අතර සමහරු නිෂ්පාදන උපකරණවලට යොදාගත් අමු ද්‍රව්‍ය (ගල්, ලෝකඩ, යකඩ ආදී ලෙස) පදනම්කර ගෙන යුග බෙදූහ. එහෙත් සමාජ ක්‍රම එකක් තවෙකක් වෙන්කර හඳුනා ගැනීමේ නිවැරදිම ක්‍රමය වන්නේ නිෂ්පාදන මාදිලීන්ට (mode of production) අනුව සමාජක්‍රම වෙන්කර ගැනීමය. ඒ අනුව ඉතිහාසයේ අපට හමුවන පළමුවන සමාජ ක්‍රමය හෙවත් නිෂ්පාදන මාදිලිය වන්නේ ප්‍රාථමික සාමූහික සමාජයය.

**ප්‍රාථමික සමාජය යනු කුමක්ද?**

මෙය දර්ශනයේ ශබ්ද කෝෂයේ හඳුන්වා ඇත්තේ ප්‍රාථමික සාමූහික ක්‍රමය (primitive - communal system) ලෙසය. සැබැවින්ම සමාජයේ මෙම පැරණි අවධිය පිළිබඳව 1860 දශකය වනතෙක් නිරවුල් අධ්‍යයනයක් හෝ හඳුනාගැනීමක් කර තිබුණේ නැත. එහෙත් පැරණි පවුල් ආකෘති පිළිබඳව හා පවුලේ ඉතිහාසය පිළිබඳ පර්යේෂණ කළ අමෙරිකානු ජාතික මානව විද්‍යාඥයෙක් වූ ලෙවිස් මෝර්ගන් විසින් 1877 දී පළ කරන ලද 'පැරණි සමාජය' නම් කෘතියත් සමග මානව සමාජයේ ප්‍රාග් ඉතිහාසයේ බොහෝ තොරතුරු හෙළිකරනු ලැබිණි. ඉන්පසු මේ පිළිබඳ සිය භෞතිකවාදී දැක්මේ සිට මාක්ස් හා එංගල්ස් දෙදෙනාද අධ්‍යයනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස එංගල්ස් විසින් 1884 දී 'පවුල පෞද්ගලික දේපළ හා රජය ඇතිවූ සැටි' නම් කෘතිය සම්පාදනය කරන ලදී. එම කෘතිය සඳහා එංගල්ස් බොහෝ විට පදනම් කර ගත්තේ මෝර්ගන්ගේ උගැන්වීම්ය. මෙම ප්‍රාථමික සමාජය එංගල්ස් විසින් හැඳින්වූයේද මිනිසාගේ බිළිඳු අවදිය හෙවත් ප්‍රාග් ඉතිහාසය ලෙසය.

මිනිසා මෙවැනි ප්‍රාථමික සමාජයක් මගින් ඉතිහාසය තුළ ගමන් කළේය යන්න පිළිගැනීමට මුලදී බොහෝ දෙනා මැළිවූහ. විශේෂයෙන් යුරෝපීය ආගමික සංස්ථාව ඊට තදබල ලෙස විරෝධය පළ කළේය. ඒ, ඒ මගින් මැවුම්වාදය බිඳ වැටෙන නිසාය. කෙසේ වෙතත් සත්‍යය යටපත් කළ නොහැකි වූ අතර පසු කලෙක විවිධ පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින්ද මෙවැනි සමාජයක් තිබූ බව තහවුරු විය. අනෙක් අතට මානව වර්ගයාගේ උපත මැවීමක් නොව පරිණාමයක් ලෙස පිළිගන්නේ නම්, මානවයා වානර ප්‍රභේදයකින් පරිණාමය වූ බව පිළිගන්නේ නම්, එම මානවයා මෙම සමාජ ක්‍රමය (එක් එක් රටවල විවිධ වෙනස්කම් සහිතව වුවත්) පසුකර ගිය බව පිළිගැනීමට සිදුවේ.

**සාමූහික සමාජයක් වූ හැටි**

මිනිසාගේ ප්‍රාථමික සමාජය සාමූහික සමාජයක් විය. ඒ ආරක්ෂාව සඳහා එක්ව සිටීමට බලකිරීමත්, යැපීම සඳහා (නිෂ්පාදනයේදී) සියලු දෙනා එක්ව කටයුතු කිරීමට සොබාදහම විසින් බලකර තිබීමත් නිසාය. අපගේ පෘථිවියේ වෙසෙන සියලු සතුන් අතරින් තමන්ගේ යැපීමේ මාධ්‍යයන් 'නිපදවා ගත්තේ' මිනිසාය. ඒ සඳහා ඔහු ආරම්භයේදීම ඉතාම නොදියුණු නිෂ්පාදන උපකරණ වූ පොල්ල, හෙල්ල, ගල් පතුරු ආදිය යොදා ගත්හ. නිෂ්පාදනය වූයේ සතෙකු මරා ගැනීම, අලයක් හාරා ගැනීම, ගෙඩි කඩා ගැනීම, මසුන් අල්ලා ගැනීම වැනි දේය. මෙම කටයුතු කිරීමේදී නිෂ්පාදන උපකරණයන් ඉතාම නොදියුණු හා ප්‍රාථමික වූ නිසා සාමූහික ප්‍රයත්නයක් දැරීමට සිදුවිය. මෙම සමාජය සාමූහික සමාජයක් වූයේ ඒ නිසාය. එබැවින් සමහරු මෙම සමාජය 'ප්‍රාග් කොමියුනිස්ට් අවදිය' ලෙසද හඳුන්වයි.

අනෙක් අතට මෙම මුල් සමාජයේ ජනගහනය ඉතාම අල්ප වූ අතර, ඔවුන් ජීවත් වූයේ ගණ හා ගෝත්‍ර ලෙසය. ගණය යනු කුඩා ඒකකයක් වූ අතර, ගණ කිහිපයක් එක්ව ගෝත්‍රය සෑදිණි. මෙහි විශේෂය නම්, 'පවුල' නමැති රූපිකය මෙහිදී නොපැවතීමය. මෙම සමාජය සාමූහික නිසා නිෂ්පාදනය සාමූහික වූ අතර, බෙදා ගැනීමද සාමූහික විය. එබැවින් පෞද්ගලික දේපළ මෙහි තිබුණේ නැත. ඒ නිසාම දේපළ මත බෙදුන පංති වෙනස්කම් මෙහි තිබුණේද නැත. ඒ නිසාම පංති ප්‍රතිවිරෝධයන් නිසා පසු කලෙක බිහිවූ 'රජය' නම් ආයතනය මෙහි තිබුණේ ද නැත. ඒ නිසාම නීතිද නොවීය.

**සම්ප්‍රදායන්ගේ පාලනයක්**

මෙම ප්‍රාථමික සමාජයේ මිනිසුන් පාලනය වූයේ කෙසේද? මෙය වර්තමානයේ රජයක් තුළ ආණ්ඩු යටතේ නීතිවලින් බැඳී ජීවත්වන අයට හිතා ගැනීම පවා අපහසුය. එහෙත් සත්‍යය නම් මුල්ම සමාජය 'පාලනය' වූයේ නීතියෙන් නොව රීතීන්ගෙන් හා සම්ප්‍රදායන්ගෙන් බවය. ගෝත්‍රය තුළ සමහර විට ගෝත්‍ර නායකයෙක් සිට ඇති නමුත් ඔහු කාගේත් ගෞරවයට ලක්වූ වැඩිමහල්, අත්දැකීම් බහුල පුද්ගලයා වූවා මිස පාලකයෙක් වූයේ නැත. එබැවින් ඔහුට 'බලයක්' නොවීය. එහෙත් ගෞරවය තිබිණි. ඔහු ගෝත්‍රයේ කාගේත් පිළිගැනීම විය. එබැවින් ප්‍රාථමික සමාජය යනු පෞද්ගලික දේපළ නැති, පංති නැති සූරාකෑම නැති, රජයක් හා නීති නැති සාමූහික සමාජයක් විය. එහි පෞද්ගලික දේපළ හා සූරාකෑම නොවීමට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ නිෂ්පාදනය ඉතාම දුර්වල වීමය.

> "ජනගහනය ඉතාම අඩු විය. ජන ගණත්වය වැඩිවූයේ විශාල දඩයම් පෙදෙස්වලින් වටවූ ගෝත්‍රික වාස භූමි තුළය. එම සීමාවලින් පිටත තවත් ගෝත්‍රයකින් වෙන්කරන ස්වභාවික මධ්‍යස්ථ ආරක්ෂක කැලෑවලින් යුක්ත විය. ශ්‍රම විභජනය පිරිසිදු චාම් ස්වභාවික දෙයක් විය. එය ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය අතර විය. පුරුෂයෝ යුද්ධයට ගියහ. දඩයම් කළහ. ස්ත්‍රීහු ගෙදර දොර බලා ගත්හ. ආහාර හා ඇඳුම් පිළියෙල කළහ. ආහාර පිසීම, රෙදි විවීම හා මැසීමද කළහ. හැම කෙනෙක්ම තම තමන්ගේ අංශවල දක්ෂයෝ වූහ. පුරුෂයෝ කැලෑවලද, ස්ත්‍රීහු ගෙවල්වලද ස්වාමිවරු වූහ."


ශ්‍රමය සූරාකෑමේදී හා දේපළ ගොඩගසා ගැනීමේදී අන් අයගේ ශ්‍රමයේ අතිරික්තය සූරාකෑමට නම්, මිනිසෙක් ඔහුට ජීවිතය ගෙනයාමට, අත්‍යවශ්‍ය යැපීම්වලට වඩා වැඩියෙන් නිපදවිය යුතුය. මෙය ආර්ථික විද්‍යාවේ හඳුන්වන්නේ අතිරික්ත ශ්‍රමය නමිනි. එහෙත් ප්‍රාථමික ක්‍රමය තුළ පුද්ගලයෙක් කරන නිෂ්පාදනය ඔහුගේ දිවි පැවැත්මට පවා ප්‍රමාණවත් නොවන තත්වයක් තුළ ඉන් කොටසක් උදුරා ගැනීමට වෙන කෙනෙකුට හැකියාව තිබුණේ නැත. ඒ නිසාම මේ සමාජයේ සූරාකෑම නොවීය. ඒ අනුව මෙම සමාජයේ ස්වරූපය තීරණය කර තිබෙන්නේ නිෂ්පාදන උපකරණවල නොදියුණු මට්ටම විසින් බව අපට පෙනේ. මෙය වැදගත් වන්නේ මානව සමාජයේ වර්ධනයේදී, එහි ගමන් මගේදී විවිධ සමාජ ක්‍රමයන් බිහිවීමේදී එහි පදනමේ පැවතියේ නිෂ්පාදන උපකරණවල දියුණුවේ මට්ටම හා නිෂ්පාදන රටාව බව තහවුරු වන නිසාය. සමාජයක් හැඩගැසීමේදී එහි සිරිත් විරිත් සම්ප්‍රදායන්, අදහස්, මතවාද, ආදිය නිර්මාණය වන්නේ නිෂ්පාදන ක්‍රමය පදනම් කර ගෙන බැව් පැහැදිලි වේ. එසේ නැතිව මතවාද, සිරිත් විරිත් ආදිය මූලික කරගනිමින් නිෂ්පාදන ක්‍රමය හැදෙනවා නොවේ. තනි වචනයෙන් කිවහොත් සමාජයක සමාජ විඥානය තීරණය කරනු ලබන්නේ එම සමාජයේ සමාජ සත්තාව හෙවත් ද්‍රව්‍යමය ජීවිතය විසිනි. නොඑසේව සමාජ විඥානය විසින් සමාජ සත්තාව තීරණය කරන්නේ නැත.

**මාතෘ මූලික සමාජයක්.. !**

මෙම ප්‍රාථමික සමාජයේ පැවති තවත් එක් විශේෂයක් වූයේ මේ සමාජය මාතෘ මූලික සමාජයක් වීමය. එයද මෙම නිෂ්පාදන විධිය හා බැඳී තිබිණි. මෙම මුල් සමාජය මව මූලිකර කරගත් සමාජයක් වීමට බලපෑ සාධක කිහිපයක් තිබිණි. මෙම මුල් අවධියේ සමාජය තුළ වර්තමානයේ අප දකින පවුල වර්ගයේ පවුලක් නොවීය. මිනිසුන් හා ගැහැනුන් පොදුවේ වාසය කළ අතර, පොදු ලිංගික සබඳතාවක්ද පැවැත්විය. ආරම්භයේදීම සියලුම පිරිමින් සියලුම ස්ත්‍රීන් සමග (සත්ව ලෝකයේ පවතින පරිදි) ලිංගික සබඳතා පවත්වා ඇති අතර, පසුව වරින්වර සමාජමය හා ජීව විද්‍යාත්මක හේතු මත දෙමාපියන් හා දරුවන් අතර ලිංගික සබඳතාද පසුව සහෝදර සහෝදරියන් අතර ලිංගික සබඳතාද නතර වී ඇත. කෙසේ වෙතත් සමාන වයස්වල කාන්තාවන් හා පිරිමින් පොදුවේ එකට ජීවත්ව තිබේ.

එහි ප්‍රතිඵලය වන්නේ, දරුවන්ගේ පියා කවුදැයි තීරණය කිරීමට නොහැකි වීමය. පොදු ලිංගික සබඳතාවකදී දරුවන්ගේ අයිතිය තීරණය කිරීමට හැකි වූයේ මවගේ පැත්තෙනි. දරුවාගේ පියා නිශ්චිත නොවන අතර, මව නිශ්චිත විය. ඒ අනුව එදා සමාජයේ ප්‍රධානතම සම්පත වූ දරුවන්ගේ අයිතිය මවට හිමිවීම මෙම සමාජය මාතෘ මූලික වීමට බලපෑ එක් සාධකයක් විය.

අනෙක් අතට මේ සමාජයේ නිෂ්පාදනය ඉතා සීමිත විය. සතෙකු මරා ගැනීම ඉතාම දුෂ්කර විය. එබැවින් ගෝත්‍රයට කෑම සැපයීමේ ප්‍රධාන වගකීම කාන්තාවන් මත පැටවිණි. අල හෑරීම, මසුන් ඇල්ලීම හා උයා-පිහා ගැනීම ඔවුන්ට අයත් විය. දරුවන් බලා ගැනීමද ඔවුන්ට අයත් විය. එහෙත් දරුවන් බලා ගැනීම් හා උයා-පිහා ගැනීම අද මෙන් පවුලේ පෞද්ගලික කාර්යයක් නොවීය. එය ගෝත්‍රයේ පොදු සමාජ කාර්යයක් විය. එය ඒ මොහොතේ පිරිමින් කළ කාර්යයට වඩා වටිනාකමෙන් වැඩි විය. ඒ නිසාම ගෝත්‍රය තුළ මව (කාන්තාව) මූලික විය. එබැවින්
මෙම ප්‍රාථමික සමාජය මාතෘ මූලික සමාජයක් වූයේද කිසිවෙකුගේ කැමැත්ත 15 වැනි පිටුවට



"ද්‍රව්‍යවාදී සංකල්පනය අනුව, අවසාන වශයෙන්, ඉතිහාසයේ තීරණාත්මක සාධකය වනුයේ ක්ෂණික ජීවිතයේ ජනනය හා ප්‍රතිජනනයයි. එහෙත් මෙය දෙයාකාර ස්වරූපයක් දරයි. එක් අතකින් පැවැත්මට වුවමනා නිෂ්පාදන මාධ්‍යයක් වන ආහාර හා වස්ත්‍ර නිපදවීමද, නිවාස ගොඩනැගීමද ඊට අවශ්‍ය උපකරන නිපදවීමද වේ. අනික් අතින් මිනිසුන් හෙවත් මිනිස් පරපුර බිහිකිරීම වේ."

**එංගල්ස්**
**පවුල පෞද්ගලික දේපළ හා රජය ඇතිවූ සැටි, පළමු මුද්‍රණයේ පෙරවදන**

# ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කළ
# විධායක ජනාධිපතිධුරය


විධායක ජනාධිපතිධුරය යටතේ ජනාධිපතිවරයා තේරීපත් වන්නේ ජනතාවගේ සෘජු ජනවරමකිනි. එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත්වන්නේ වෙනම ජනවරමකිනි. ප්‍රායෝගිකව පැවසුවහොත් 2015 ජනවාරි මස 08 ජනවරමින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා පත්වූ අතර 2015 අගෝස්තු 17 පාර්ලිමේන්තුව තේරීපත් විය. මෙලෙස පත්වූ පාර්ලිමේන්තුව ජනාධිපතිවරයා විසින් 2018.11.02 වන දින විසුරුවා හරින ලදී. එසේම කුමන්ත්‍රණකාරී ලෙස 2018.10.26 වන දින අග්‍රාමාත්‍යවරයෙකු ලෙස මහින්ද රාජපක්ෂ මහතා පත් කරන ලදී. වර්තමානයේ මතුවී ඇති ගැටලුව වන්නේ ජනාධිපතිවරයාට හදිසියේම එවැනි ක්‍රියාවක් කිරීමට බලය පවතින්නේද යන්නයි. 19වැනි සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 70(1) උප වගන්තියේ මෙසේ සඳහන් වේ.

"ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයක් මගින් පාර්ලිමේන්තුව කැඳවීම, පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීම සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කළ හැක්කේය.

එසේ වුවද, පාර්ලිමේන්තුව විසින් එහි නොපැමිණි මන්ත්‍රීවරයන්ද ඇතුළුව මුළු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරගනු ලැබූ දිනයෙන් අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වන තෙක් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නොකළ යුත්තේය."

**17වැනි සහ 19වැනි ව්‍යවස්ථා සංශෝධනයන් තිබියෙදී ජනාධිපතිවරයා මෙසේ ක්‍රියාකළ හේතුව මුළු රටම හොඳින් දනී. තනිකරම ඊට බලපෑවේ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ මීළඟ ජනාධිපතිවරයා වීමේ අභිලාෂයත් මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු පවුලේ අයට එල්ල වී ඇති අපරාධ නඩු ප්‍රමාණයත් ඒවා ප්‍රමාද කිරීමේ අරමුණුවලත් කූටප්‍රාප්ත එකඟතාවයකිනි. උක්ත අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පාර්ලිමේන්තුව ජනාධිපතිවරයා විසින් කල් තැබනු ලැබිණි. කල්තබා කිසියම් කාලයක් මන්ත්‍රීවරු වෙන්දේසි වීමටද ඔහු ඉඩ හැරියේය. එයද අසාර්ථක වූ තැන පාර්ලිමේන්තුව විසුරුවා හැරියේය.** එම තත්වය අධිකරණය මගින් තාවකාලිකව අත්හිටුවා ඇති තත්වය මෙම ලිපිය විෂය පථය වේ.

"ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කළ විධායක ජනාධිපතිධුරය" නමින් ග්‍රන්ථයක් ජොෂ්ඵ නිතිඥ පරාක්‍රම අගලවත්ත මහතා විසින් ජනතා නීතිඥ සංගමයේ මූලිකත්වයෙන් වර්ෂ 2010දී එළිදැක්වූයේය. එම පොතේ නම කෙතරම් අදට ගැලපෙන්නේද යන්න සිහිපත් වන්නේ වර්තමානයේ විධායක ජනාධිපතිවරයා විසින් 225ක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයත් සමස්ත ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදයත් අමු අමුවේ උල්ලංඝනය කරමින් පවතින වටපිටාවක් ඇතුළතය.



## කථාවේ ඉතිහාසය

විධායක ජනාධිපතිධුරය හඳුන්වා දුන් 1978 වර්ෂයේ සිට මේ දක්වාම ජනතා විමුක්ති පෙරමුණ විසින් මූලිකවම මතු කරන ලද තර්කය වූයේ, 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙන මෙම විධායක ජනාධිපතිධුරය විසින් විශේෂයෙන්ම එහි 35වැනි වගන්තිය මගින් නීතියට ඉහළින් පුද්ගලයෙකු නැතහොත් විධායක ජනාධිපතිධුරය පවතින බවත්, ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) උප වගන්තිය මගින් නීතිය ඉදිරියේ සියලු පුරවැසියන් සමානයැයි වගන්තියක් ඇතුළත් කර තිබුණද එය හුදෙක් විධායක ජනාධිපතිධුරය අභියස වාක්‍ය ඛණ්ඩයක් පමණක් වන බවත්ය. අතීතය දෙස බලන විට මෙහි නිර්මාතෘ ජේ.ආර්. ජයවර්ධන මහතාගේ සමයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස්වීම් ලිපි සාක්කුවේ දමා ගනිමින් ඉන්දු ලංකා ගිවිසුම වැනි රටට එරෙහි ගිවිසුම් අත්සන් කරන ලද්දේ මෙම විධායක ජනාධිපතිධුරයේ බලතල මතය. අනතුරුව චන්ද්‍රිකා බණ්ඩාරනායක සිය බලතල අත්පත් කර ගනු ලබන්නේ එක්සත් ජාතික පක්ෂයේ 17 වසරක සාපයට හිලව් වන්නටය. එසේ හෙයින් චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට ප්‍රමුඛතම පොරොන්දුවක් ලෙස 1994 පැවති ජනාධිපතිවරණයේදී විධායක ජනාධිපතිධුරය අහෝසි කරන බවට පොරොන්දුවක් දීමට සිදුවිය. එහිදී ජනාධිපතිවරණයට ඉදිරිපත්ව සිටි නිහාල් ගලප්පත්ති සහෝදරයා සිය ජනාධිපතිවරණ සටනින් ඉවත් වන්නේද චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමේ පොරොන්දුවට යටත් කර ගනිමිනි.

කරුණු මෙසේ වුවද වර්ෂ 2005 දක්වා බලයේ රැඳී සිටි චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය විධායක පුටුවේ වාඩිවූවාට පසු එම ධුරය අහෝසි කිරීමට අදාළ වචනයක් හෝ ප්‍රකාශ කළේ නැත. එම කාලය තුළ ඇය සුනාමි සහන මණ්ඩලය පිහිටුවීම ඇතුළු රටට අහිතකර ගිවිසුම් රාශියක් පිළිබඳ තීන්දු තීරණ විශාල ප්‍රමාණයක් ගත් බව නොරහසකි. ඒ හේතුවෙන්ම පැන නැගුණු විරෝධය තුළ 2005 වසර පමණ වන විට පැවැත්වීමට නියමිතව තිබූ ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රබලතම සටන් පාඨය වූයේ විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමය.

ඒ අනුව ඔහු ජනතා විමුක්ති පෙරමුණ සමඟ ලිඛිත මැතිවරණ ගිවිසුමකට පවා එළඹුණු බව ශ්‍රී ලංකාවාසීහු හොඳින් දනිති. නමුත් අවසානයේ සිදු වූයේ කුමක්ද? ඔහුගේ දෙවන ධුර කාලය දක්වාම විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමට අදාළව කිසිදු වචනයක් කතා නොකළ ඔහු 18වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් දෙවන ධුර කාලයට පමණක් සීමා වූ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති සංශෝධනය කරමින් චිරාත් කාලයක් සිය තනතුරේ රැඳී සිටීමට හැකිවන පරිදි ව්‍යවස්ථාවද සංශෝධන කර ගන්නා ලදී. එසේ කළේ එවකට පැවති පාර්ලිමේන්තු ජනවරමේ මහින්ද රාජපක්ෂ මහතාට තුනෙන් දෙකක ජනවරමක් නොතිබුණද පසුව විධායක බලයේ බල මහිමයෙන් මුදලට සහ බලයට යටත් කර ගනිමින් විකෘති 2/3 පෙන්නා සම්මත කර ගන්නා ලදී.

> 17වැනි සහ 19වැනි ව්‍යවස්ථා සංශෝධනයන් තිබියෙදී ජනාධිපතිවරයා මෙසේ ක්‍රියාකළ හේතුව මුළු රටම හොඳින් දනී. තනිකරම ඊට බලපෑවේ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ මීළඟ ජනාධිපතිවරයා වීමේ අභිලාෂයත් මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු පවුලේ අයට එල්ල වී ඇති අපරාධ නඩු ප්‍රමාණයත් ඒවා ප්‍රමාද කිරීමේ අරමුණුවලත් කූටප්‍රාප්ත එකඟතාවයකිනි. උක්ත අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පාර්ලිමේන්තුව ජනාධිපතිවරයා විසින් කල් තැබනු ලැබිණි. කල්තබා කිසියම් කාලයක් මන්ත්‍රීවරු වෙන්දේසි වීමටද ඔහු ඉඩ හැරියේය. එයද අසාර්ථක වූ තැන පාර්ලිමේන්තුව විසුරුවා හැරියේය.

අනතුරුව වර්ෂ 2015 ජනාධිපති සමය වනවිට විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමට අදාළ සටන් පාඨය ඉතාමත් තීව්‍ර තැනකට පැමිණ තිබුණේය. ඒ අනුව මෛත්‍රීපාල සිරිසේන මහතා හට සිය ජනාධිපතිවරණ සටනේ ප්‍රකාශ කිරීමට සිදුවූයේ ඒකාධිපති වියරු පවුල් පාලනයක් රටේ පවතින බවත් එම ඒකාධිපති වියරුව නිර්මාණය වී ඇත්තේ විධායක බලයේ ආශිර්වාදය මත බැවින් විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීම මාතෘ භූමියේ එකම අභිලාශය විය යුතු බවත්ය. ඒ අනුව 'වෙනසකට එක්වෙමු. මෛත්‍රී පාලනයක් දින 100 අලුත් රටක්' ප්‍රතිපත්ති මාලාවටද විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමට අදාළ පොරොන්දුව දෙමින් ප්‍රකාශ කර සිටියේ තමා පැමිණෙන්නේ විධායක ජනාධිපතිධුරය අහෝසි කර එම තනතුරට අදාළ අවසන් ජනාධිපතිවරයා බව සනිටුහන් කිරීමට බවත් නැවත ලක් ඉතිහාසයේ එවැනි ජනාධිපතිවරණයක් නොපවත්වන බවත්ය.

නමුත් වසර 04කට ආසන්න කාලයක් ගෙවී යන මේ මොහොතේ මෛත්‍රීපාල සිරිසේන මහතා නැවත ජනාධිපතිවරණයකට අරඅඳිමින් සිටී. 17වැනි හා 19වැනි ව්‍යවස්ථා සංශෝධන මගින් විධායක බලයේ මහිමයන් තරමක්දුරට අඩු කිරීමට හැකිවීම ජනතා ජයග්‍රහණයකි. එසේ වුවද මේ මොහොතේ මෛත්‍රීපාල සිරිසේන මහතා හැසිරෙන්නේ එදා ජේ.ආර්. ජයවර්ධන මහතාටත්, මහින්ද රාජපක්ෂ මහතාටත් එහාගිය ඒකාධිපති වියරුවකය. ඔහු 19වැනි ව්‍යවස්ථා සංශෝධනය පසෙකලා අවුරුදු 4 මාස 6ක් යනතුරු විසුරුවා හැරීමට නොහැකි පාර්ලිමේන්තුව එක විටම විසුරුවා හැරීමටත්, අග්‍රාමාත්‍යවරයෙකු සිටියෙදී තවත් අග්‍රාමාත්‍යවරයෙකු දිවුරුම් ලබාගැනීමටත් මන්ත්‍රීවරු මිලදී ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධවීමටත් ක්‍රියාකළේ හුදෙක් දෙවන වරට විධායක ජනාධිපතිවරයා වීමේ ඇති පටු පෞද්ගලික දේශපාලන අරමුණ වෙනුවෙනි.

## ජනතා වගකීම

මේ වන විට රාජපක්ෂ පවුලේ පෞද්ගලික අපේක්ෂාවන් සහ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පෞද්ගලික අභිලාෂයන් විසින් මුළු රටක්ම අස්ථාවර කරනු ලැබ ඇත. අධිකරණය නොතිබෙන්නට 2015 අගෝස්තු 17 ජනවරමද ගිල ගන්නට තරම් මෛත්‍රීපාල සිරිසේන මහතා බලලෝභියෙකු විය. අද මුළු රටම ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා සිටී. මේ මොහොතේ ජනතා විමුක්ති පෙරමුණේ භාවිතය දෙස රටක්ම බලා සිටින තත්වයක් උදාවී ඇත. කිසිදා ජනාධිපති පුටුවක වාඩිවූ තැනැත්තෙක් මෙය අහෝසි නොකරන බවත් පවතින නීතිමය තත්වයන් තම පටු දේශපාලනික අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා භාවිතයට ගන්නා බවත් පැහැදිලිය. 'නීතිය වනාහි පාලකයාගේ අවියයි' යනුවෙන් එදා කාල් මාක්ස් සහෝදරයා ප්‍රකාශ කළ දේ මොන තරම් යථාර්ථයක්ද යන්න පැහැදිලිය. පාලකයන් විසින් නොකරන ලද කාර්යය 225 ක්වූ මන්ත්‍රී ප්‍රමාණයෙන් 6 දෙනෙකු පමණක් සිටින ජනතා විමුක්ති පෙරමුණ විසින් 20වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කර තිබේ. අවම වශයෙන් 20වැනි සංශෝධනය සම්මත කර ගැනීමට මෙම පාර්ලිමේන්තුව යුහුසුළු වූයේ නම් මෙවැනි අවුලකට රට පත් වන්නේ නැති බව කෝඳුරු ඔළුවක් ඇති මොළයකට වුවද වැටහෙනු ඇත. දැන්වත් ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කළ 20 සංශෝධනය සම්මත කර ගැනීමට මහජනයා පෙළගැසිය යුතු කාලය එළඹ ඇත. එතුළින් පාර්ලිමේන්තුවෙන් පත් කර ගන්නා අග්‍රාමාත්‍යවරයෙකු යටතේ පාර්ලිමේන්තුවට සෘජුව වගකියන නායකත්වයක් නිර්මාණය වනු ඇත.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2018 නොවැම්බර් 29

# කුමන්ත්‍රණ පූර්වාදර්ශය සදහටම 'ඩිලීට්' කළ යුතුයි

(අග්‍රාමාත්‍ය තනතුරට හිමි රාජ්‍ය මුදල් අවභාවිත කිරීම පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා



අද දින ඉදිරිපත් කර තිබෙන යෝජනාව මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයා, අග්‍රාමාත්‍ය තනතුරට හිමි රාජ්‍ය මුදල් අවභාවිතා කිරීම පිළිබඳ කරුණයි. ඔහු මේ රටේ හිටපු ජනාධිපතිවරයෙක්. හිටපු අගමැතිවරයෙක්. එතුමා කිවුවා එතුමා කුඩා කල සිටම ඉඳල පාර්ලිමේන්තුවේ හිටියෙ කියලා. ඒ නිසා එතුමා හොඳින්ම දන්නව මේ නීති විරෝධී දෙයක් කරන්නේ කියලා. ඒ නිසා ඔහු දැන දැන රාජ්‍ය මුදල් අවභාවිතා කර තිබෙනවා, ඔක්තෝබර් 26 දින සිට අද දක්වා. ඒ නිසා ඉතා පැහැදිලිවම මේ යෝජනාවට අනුව අදින් පටන් අරගත්තට පස්සේ මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයාගේත් අනෙකුත් ඒ නීති විරෝධී අනීතික ආණ්ඩුවේ ඇමතිවරුන් කියල හඳුනා ගන්න මන්ත්‍රීවරුන්ගේත් මුදල් කප්පාදු කිරීමට ජනතා විමුක්ති පෙරමුණ සහයෝගය ලබාදෙනවා.

ඒ වගේම මුදල්වලට වඩා මේවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ පොදුජන පෙරමුණේ තනතුරු නොවෙයි. මේවා මේ රටේ තනතුරු. මේ රටේ තනතුරු තමයි අද මේ මන්ත්‍රී කණ්ඩායමක් බලහත්කාරයෙන් වැරදි බව දැන දැන පාවිච්චි කරන්නේ. ඒනිසා නොදැන කරන වැරදිවලට වඩා දැන දැන කරන වැරදි බලවත්. මේ මුදල් කප්පාදු කිරීම අත්‍යවශ්‍ය වෙන්නේ ඒ නිසා. මේ දූෂිත, තක්කඩි ආණ්ඩුව බලය තාමත් අල්ලන් ඉන්නේ කිසි බලයකින් නොවෙයි. මෙය සිද්ධ වෙච්ච දවසෙම අපි කිවුවා, ජනතා විමුක්ති පෙරමුණ විදිහට මේක අපි පරද්දනවා කියලා. අපි පක්ෂයක් වශයෙන් දෙයක් පිළිබඳව නිකම් තීරණවලට එන්නේ නැහැ. අපි ගැඹුරින් සාකච්ඡා කරල අනාගතය දැකලා තමයි මැදිහත් වෙන්නේ. අපි සතුටු වෙනවා මේක අධිකරණයේ අර්ධ වශයෙන් පැරදිලා තියනවා. ව්‍යවස්ථාදායකයේ දිගටම පරදිනවා. ජනතාව අතර පැරදිලා තිබෙනවා. ඒවගේම ලෝකෙ රටවල් අතර පැරදිලා තිබෙනවා. දැන් කියනවනේ මේක බටහිර රටවල්නේ මේකට විරුද්ධ වෙලා තියෙන්නේ කියලා. දැන් බටහිර රටවල් සම්බන්ධ ප්‍රශ්නෙට වෙනම සාකච්ඡා කරමුකො. මහින්ද රාජපක්ෂ මහත්තයාගෙ ඉතාම මිත්‍රශීලී රට තමයි ස්වාසිලන්තය. දැන් ස්වාසිලන්තය පිළිඅරගෙන තියෙනවාද? මාලදිවයින පිළිඅරගෙන තියෙනවාද? මේ කුමන්ත්‍රණයට දවස් 5කට කලින් මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ගියා සීෂෙල්. සීෂෙල් පිළිඅරගෙන තියෙනවාද? දකුණු ආසියාවෙ එක රටක් පිළිඅරගෙන තියෙනවාද? පිළිඅරගෙන නැහැ.

ඒනිසා මේක අධිකරණය තුළ ව්‍යවස්ථාදායකය තුළ ජාත්‍යන්තරය තුළ විතරක් නොවෙයි මේක ජනතාව තුළත් පැරදිලා තියෙන්නෙ. මේ රටේ ජනතාවගෙ හෘද සාක්ෂිය තුළ, කුමාරවෙල්ගම මන්ත්‍රීතුමාගෙ හෘද සාක්ෂියට වඩා මේ ප්‍රශ්නෙදි අඩුග ානෙ එක අඩියක් හරි ඉස්සරහින් තියෙන්නෙ. සමහර අය කියනවනෙ ජනමතය තියෙනවා, රාජපක්ෂට මිනිස්සු කැමතියි කියල. නමුත් රටේ ජනතාව කුමාර වෙල්ගම මන්ත්‍රීතුමාට වඩා අඩියක් හරි ඉස්සරහින් ඉන්නෙ. ඒ නිසා ජනතාව අතරත් පැරදිලා තියෙන්නෙ. නමුත් අද මේ බලයේ ඉන්නෙ කොහොමද? අද මේ ඇමති ධුර දරන්නේ කොහොමද? **දරන්නේ කළු මාධ්‍ය ජාලයක බලයෙන්. කළු, රාජපක්ෂලා හදපු, ඒක මත යැපෙන, මෛත්‍රීපාල සිරිසේනලා එක්ක බිස්නස් කරන කළු මාධ්‍ය ජාලයක බලයෙන් තමයි ඒක තියෙන්නෙ. දැනුත් එස්එම්එස් එක එන්නෙ කොහොමද? දැනුත් ඇලට් එක එන්නෙ අමාත්‍ය කියල. මේ රටේ මේ දූෂිත, තක්කඩි, නීතිවිරෝධී පාලනය එහෙට මෙහෙට පනින සහ පනින්න ඉන්න කට්ටියගේ මත නොවෙයි මේ දුවන්නෙ; තනිකරම කළු මාධ්‍ය ජාලයක බලයෙන්.**

විශේෂයෙන් ජනාධිපතිවරයා මේ වැඩසටහන පටන්ගත්තේ කුමක් වෙනුවෙන්ද? අපේ රටට මේ කුමන්ත්‍රණයෙන් ලැබිල තියෙන ප්‍රතිඵලය කුමක්ද? අඩුගානෙ මේ රනිල් වික්‍රමසිංහ මහත්මයලාගෙ ආණ්ඩුව හම්බන්තොට වරාය විකුණීමට පෙර අඩු ගානෙ ඒ බදු ගිවිසුම සාකච්ඡා කරනවා කියලා පොරොන්දු වෙලා තියෙද්දි ඒ පොරොන්දුව කඩන වෙලාවෙවත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කිවුව නම්, මම හම්බන්තොට වරාය විකිණීම නතර කරන්න තමයි මේක කළේ කිවුව නම් අඩුතරමෙ අපිට වෙනස් දෙයක් හිතන්න තිබුණ. එතුමා විධායක බලතල කිසිම විටෙක රට වෙනුවෙන් පාවිච්චි කළේ නැහැ. ඇත්තටම එතුමා විධායක බලතල පාවිච්චි කළේ මොනවටද? ශ්‍රී ලංකා එයාර් ලයින් එකේ කජු නරක් වුණාම කජුකාරයා එළවන්න පාවිච්චි කළා. මේ පාර්ලිමේන්තුවේ හිටපු වැදගත් මහලේකම්වරියක් මම හිතන්නේ ලංකාවේ පළමුවෙනි මහලේකම්වරිය- ප්‍රියානි විජේසේකර මැතිනිය, ඔස්ට්‍රියා තානාපති වශයෙන් පත්කළා. ඔස්ට්‍රියා තානාපති කාර්යාලයට ජනාධිපති ටෙලිෆෝන් කරද්දි එතුමිය සහ එම කාර්ය මණ්ඩලය ටෙලිෆෝන් එකට කතා කළේ නැහැ කියල තානාපතිවරිය පමණක් නොවෙයි, ඩ්‍රයිවර්ලත් එක්ක ලංකාවට ගෙන්න ගත්තා. ඔන්න ජනාධිපති විධායක බලතල පාවිච්චි කළ දෙවෙනි අවස්ථාව. ඊට පස්සේ විධායක බලතල පාවිච්චි කළා වෙන මොකටද, වනජීවී දෙපාර්තමේන්තුව අලි දෙන්නෙක් හින්ද ප්‍රශ්නයක් තියෙන බව කියද්දි ඒ අලි දෙන්නා සිංහරාජෙ තියන්න ඔහු විධායක බලතල පාවිච්චි කළා. රටේ ආරක්ෂාව වෙනුවෙන්, ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් සිංගප්පූරු ගිවිසුම නතර කරන්න, හම්බන්තොට වරාය ගිවිසුම නතර කරන්න එකකටවත් ඔය බලතල පාවිච්චි කළේ නැහැ. තව දේකට පාවිච්චි කළා; හොරු රකින්න. එතුමා අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඉවත් කළේ මොකටද? අද දරුවන් 11ක් පැහැරගෙන ගිහිල්ල කප්පම් ඉල්ලපු (අද අපි සතුටුවෙනවා අධිකරණයේ විනිශ්චයකාරතුමාලට තියෙන කොන්ද ගැන) මේ යුද්ධ කථාවක් නොවෙයි. යුද්දෙ වෙනුවෙන් වුණත් එහෙම කරන එක වැරදියි. යුද්දෙ නෙමෙයි. කප්පම් ගන්න. දරුවන් පැහැරගෙන ගිහිල්ල කටයුතු කරපු අය ආරක්ෂා කරන්න කටයුතු කරපු අයව බේරන්න තමයි විධායක බලතල පාවිච්චි කළේ. උසාවි නියෝගයක් දීල තියෙද්දි අත්අඩංගුවට ගන්න කියලා, ජනාධිපතිගෙ විශේෂ නියෝජිතයෙකු වශයෙන් යැවුවා මෙක්සිකෝවට. මේ මාසෙකට කලින්. එහෙමයි ඔය මෛත්‍රීපාල සිරිසේන මහතා තමන්ගේ විධායක බලතල පාවිච්චි කළේ.

අද අපිට පේනවා, දැන් ඩීල් එකක් පටන් අරගෙන තියෙනවා අපි දැක්කා මීට සතියකට දෙකකට කලින්. මේ පාර්ලිමේන්තුව අධම තත්ත්වයට පත්කරපු මන්ත්‍රී කණ්ඩායමක් ඉන්නවා. උදේට පනිනවා, හවසට පනිනවා, රෑට පනිනවා. ඒක වුණෙත් 19 වෙනි සංශෝධනයෙන් මන්ත්‍රීවරුන්ට පක්ෂ මාරු කිරීම තහනම් කරන වගන්තිය ඉවත් කරපු නිසා. අපි 20 වෙනි සංශෝධනයේ ඒක නැවත ඒක ගෙනාවා. අද රටේ මිනිස්සු මේ අයට කියන්නේ මන්ත්‍රීවරු කියල නෙවෙයි. අපි මිනිස්සුන්ට ගරු කරනවා. දේශපාලන ප්‍රතිපත්ති සම්බන්ධ විවේචන තිබුණත් පුද්ගලයන්ගේ පෞරුෂයන්ට ගරු කරනවා. ඔවුන් දරන දේශපාලන අදහස්වලට කුමක් වුවත් අපි ගරු කරනවා. නමුත් මේ මොකක්ද? මේක පිළිකාවක්. අපිට ප්‍රශ්නයක් නැහැ ආණ්ඩුවක් කඩා ගන්න පනින එකට. නමුත් මේ කඩල තියෙන්නේ මේ මාතෘ භූමියේ ප්‍රතිරූපය. දැන් මේ එහෙට මෙහෙට පැනලා තමන්ගේ වැරදි නිවැරදි කරගන්න කතා කරන උදවියත් තව එන්න ඉන්න කට්ටියත් මාස දෙකක් තිස්සේ මේ රටට කරපු විනාශයට ගෙවන්නේ කොහොමද? පනින්න ගත්ත සල්ලිවලින් මේ ඩැමේජ් එක වෙනස් කරන්න පුළුවන්ද? අපිට තියෙන ප්‍රශ්නය ඒකයි.

අපි ඒකයි කියන්නේ මුලින්ම මෛත්‍රීපාල සිරිසේන මහතා තමන්ගේ වැරැද්ද නිවැරදි කරගත යුතුයි. එතුමා ජාතියෙන් සමාව ගත යුතුයි. මම මේ කියන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙ ආණ්ඩුව එළවපු එක ගැන නොවෙයි. ඒක කොහොමත් එළවන්න තිබුණු ආණ්ඩුවක්, ඡන්දයක් ආවාට පස්සෙ. නමුත් ජනාධිපතිවරයා තමන්ට දෙවෙනි වතාවට ජනාධිපති ධුරයට පත්වීම සඳහා කරපු කුමන්ත්‍රණය හේතුවෙන් මේ රටේ ආර්ථිකයට, ප්‍රතිරූපයට, ලෝකය ඉදිරියේ අපට වෙච්ච හානියට වෙච්ච අලාභය ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ගෙවනවාද? මේ එහෙට මෙහෙට පැනිලිවලින් ඒක වෙනස් වෙනවාද? ඒක වෙනස් වෙන්නේ නැහැ. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ යම්කිසි ගරුත්වයක් ඇති වුණා මේ පාර්ලිමේන්තුවේ වැඩි මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ඒ විකිණෙන බිස්නස් එකට ගියේ නැහැ. මම දන්නෙ නැහැ ඉන්න සල්ලි ගත්තද නැද්ද කියලා. නමුත් විකුණුනා කියලා අපිට පෙනුන ප්‍රමාණය විකිණිච්ච ප්‍රමාණයට වඩා අඩුයි.

නමුත් අපි කියන්නේ වහාම මේ පාර්ලිමේන්තුව තේරීම් කාරක සභාවක් හරි විශේෂ කාරක සභාවක් හරි පත්කරන්න ඕනෑ. මේක ජනාධිපතිතුමාගෙ වැරදි ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් මේක. මම ජනාධිපති නීතිඥයෙක් නොවෙයි. මම නීතිඥයෙක්වත් නොවෙයි. අපිට තේරෙන්නේ හොඳ නරක පමණයි. ඒක අපේ අම්මලා තාත්තලාගෙන් අපේ පක්ෂයෙන් අපේ පාසල්වලින් අපේ රටේ සාමාන්‍ය පුංචි මිනිසුන්ගේ හෘද සාක්ෂියෙන් ඉගෙන ගත්ත දේවල්. අපිට විකිණෙන්නේ නැතිව කොන්දක් තියාගෙන කෙලින් කතාකරන්න පෞරුෂය හම්බ වෙලා තියෙන්නෙ ඒකෙන්. කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා පාර්ලිමේන්තුව මාසෙක විතර කාලයක් හරි වෙන්කරලා රටේ උගතුන්, හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් ගෙන්වලා දැවැන්ත සාකච්ඡාවක් ඇති කරන්න ඕනෑ. කාරක සභා වෙන්කරලා ඇති කරන්න ඕනෑ. මේ කුමන්ත්‍රණය කොතරම් වැරදියිද කියලා, අපේ රටේ නීති විද්‍යාලවල උගන්නන්න පටන් ගන්න ඕනෑ. මේ පූර්වාදර්ශය සදහටම 'ඩිලීට්' කරන්න ඕනෑ. හිට්ලර්ගෙන් පස්සේ ජර්මනිය 'ඕවර්රෝල් කැම්පේන්' එකක් පටන් ගත්තා, ඩීනාසිෆිකේෂන් කියලා. ඒක නීතියට, පොලිසියට, පාසල්වලට, විශ්වවිද්‍යාලවලට ගෙනාවා. සහමුලින්ම ඒ වැරැද්ද නිවැරදි කිරීම ජනගත කළා. දරුවන්ට ජාන ගත කළා.

මේ කුමන්ත්‍රණය කළේ කවුද? පාර්ලිමේන්තුවේ බලය නැති ජනාධිපති කෙනෙක්. එහෙම ජනාධිපති කෙනෙක් විධායක බලතල පාවිච්චි කරලා මෙහෙම රටට හානියක් කරන්න පුළුවන්නම්, මේ දැනට වෙලා තියෙන පූර්වාදර්ශය සහමුලින්ම අපේ මනසින් පවා ජනතාවගේ මනසින්

15 වැනි පිටුවට

> අද මේ ඇමති ධුර දරන්නේ කොහොමද? දරන්නේ කළු මාධ්‍ය ජාලයක බලයෙන්. කළු, රාජපක්ෂලා හදපු, ඒක මත යැපෙන, මෛත්‍රීපාල සිරිසේනලා එක්ක බිස්නස් කරන කළු මාධ්‍ය ජාලයක බලයෙන් තමයි ඒක තියෙන්නෙ. දැනුත් එස්එම්එස් එක එන්නෙ කොහොමද? දැනුත් ඇලට් එක එන්නෙ අමාත්‍ය කියල. මේ රටේ මේ දූෂිත, තක්කඩි, නීතිවිරෝධී පාලනය එහෙට මෙහෙට පනින සහ පනින්න ඉන්න කට්ටියගේ මත නොවෙයි මේ දුවන්නෙ. මේ නීති විරෝධී පාලනය දුවන්නේ, තනිකරම කළු මාධ්‍ය ජාලයක බලයෙන්.

# දේශපාලන කුමන්ත්‍රණ පළමු පැයේම පරාජය කළ යුතුයි

ජනතා විමුක්ති පෙරමුණේ නායක
අනුර දිසානායක සහෝදරයා

*ඒකාධිපතිවාදය පරදවන ප්‍රජාතන්ත්‍රවාදය දිනවන ජනතා රැලිය පසුගිය නොවැම්බර් 21වැනි දින මහරගමදී පවත්වන ලද අතර එහිදී ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා විසින් පවත්වන ලද කතාවේ ලිඛිත සටහන කාලීන වැදගත්ම සලකා මෙසේ උපුටා පළකරමු.*




පසුගිය 26 වෙනිදා රාත්‍රියේ මේ දේශපාලන කුමන්ත්‍රණය සිදුවූ මොහොතේදීම අපේ පක්ෂය තීරණයකට ආවා, මේ කුමන්ත්‍රණය පරාජය කළ යුතුයි කියලා. අද අපි මහරගමදි ඔබ හමුවෙන කොට මේ කුමන්ත්‍රණය සැලකිය යුතු ප්‍රමාණයකින් පරාද කොට අවසන් බවට සහතික කරනවා. මේ සිදුවීමෙන් අමන්දානන්දයට පත්වූ කොටසක් ඉන්නවා. මේ සිදුවීමෙන් හිත රිදුණු කණ්ඩායමක් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ ඒ කණ්ඩායම් දෙකටම අයිති නොවෙන කණ්ඩායමක්. අමන්දානන්දයට පත්වී තිබෙන්නේ කවුද? වංචාවල නිරත වුණු, නඩු ගොනු වුණු බලය නැතිව හාමතේ වේලි වේලි හිටපු බලය අහිමිවීමේ වේදනාවෙන් කෙඳිරිගාපු රාජපක්ෂගේ කණ්ඩායමට යම් උත්තේජනයක් ඇවිත් තිබෙනවා. හැබැයි ඒකෙත් ශිෂ්ට සම්පන්න භාවය අපේක්ෂා කරන, දේශපාලන සදාචාරය අපේක්ෂා කරන පිරිස් රාජපක්ෂ මහත්තයට මේ වෙච්ච වියවුල ගැන ලැජ්ජාවෙනුත් ඉන්න බව පේනවා. සමහර අය කියනවා ලස්සනට මල් වට්ටියක් අතේ තියාගෙන ගියපු මහින්ද රාජපක්ෂ මහත්තයාට ගොම හට්ටියක් දුන්නා කියල. හැබැයි සතුටට පත්වෙන කණ්ඩායමක් ඉන්නවා කියල අපි දන්නවා. ඒ වගේම රනිල් වික්‍රමසිංහ මහත්තයා වටේ හිටපු, ඒ ආණ්ඩුව දිහා බලාගෙන හිටපු ඒ ආණ්ඩුවෙන් යමක් අපේක්ෂා කරපු කණ්ඩායමකට හිත රිදිල තියෙනවා.

### ඇයි මේ කලබලය

හැබැයි ජනතා විමුක්ති පෙරමුණට මොකටද මේ වේගය සහ කලබලය කියල අපෙන් අහනවා. මෙය තේරුම් ගත යුතුයි බැරෑරුම් ලෙස. විශේෂයෙන් මේ ඇති වී තිබෙන තත්වය පිළිබඳව දේශපාලන භේදය පැත්තකින් තියන්න. තම තමන් පැළඳගෙන ඉන්න කණ්ණාඩි පසෙක ගලවා තබන්න. විශේෂයෙන් රාජපක්ෂ මහත්තයාගේ දේශපාලනය ගැන ප්‍රාර්ථනා කරපු පිරිසට මම ආරාධනා කරනවා මේ ඇති කර තිබෙන තත්වය ගැන විවෘත මනසින් බලන්න සූදානම් වෙන්න කියලා. ඒ ඇයි? අපි දන්නවා අපේ රටේ ආණ්ඩු මාරුවෙන්නේ කොහොමද කියලා. සාමාන්‍යයෙන් ආණ්ඩු මාරුවෙනවා ඡන්දෙන්. ඡන්දය ප්‍රකාශයට පත්කරනවා. මැතිවරණය ඡන්දය දියත් කරනවා. ජනතාව ඡන්දෙ දෙනවා. ප්‍රතිඵල අහනවා පහුවදාට ආණ්ඩුවක් හදනවා. මම කියන්නේ නැහැ ඒ තුළ ප්‍රජාතන්ත්‍රවාදීව සියලු දේ ආරක්ෂා වි තිබෙනවා කියලා. නමුත් යම් ජනතාවගේ අදහස් විමසීමක් එක්ක ආණ්ඩුවක් හදනවා.

### ආණ්ඩු මාරු කරන හැටි

තව පාර්ලිමේන්තුවේදී ඡන්දෙක සිට ඊළඟ ඡන්දෙ අතර කාල පරිච්ඡේදයකදි, එය යුක්ති සහගත නොවුණත් පාර්ලිමේන්තුවේ බල හුවමාරුවකින් ආණ්ඩුවක් හදන්න පුළුවන්. බහුතර මන්ත්‍රී කණ්ඩායමක් පෙනී හිටල කියන්න පුළුවන්, තිබෙන ආණ්ඩුව තිබෙන ආණ්ඩුවට බහුතරය නැහැ ඒ නිසා බහුතරය තිබෙන කණ්ඩායමට ආණ්ඩුව දෙන්න කියලා ඉල්ලන්න පුළුවන්. එහෙමත් ආණ්ඩු මාරුකරන්න පුළුවන්. තවත් ලෝකෙ පුරා ආණ්ඩු මාරුවෙලා තියෙනවා මහජන අරගල හරහා. නායකයො ජනතාවටත් රටටත් එරෙහිව කුමන්ත්‍රණකාරීව වැඩ කරන කොට ජනතාව පාරට බැහැලා පාලකයෝ එලවා දමා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අපි ඒ ආකෘතියත් පිළිගන්න දේශපාලන ව්‍යාපාරයක්. හැබැයි පසුගිය 26වැනිදා රාත්‍රියේ සිදුවුණේ කුමක්ද? එතන සිදුවුණේ දේශපාලන කුමන්ත්‍රණයක්. ජනාධිපතිවරයා මහින්ද රාජපක්ෂට එන්න කියලා හඳපානේ මේසයක් දෙපැත්තේ හිටගෙන 'මම ජනපති, උඹ අගමැති' කියල ආණ්ඩුවක් හදනවා.

මෙහෙම හදන්න පුළුවන්ද ආණ්ඩු. ඔබ පිළිගන්නවාද මේ වර්ගයේ ආණ්ඩු. මේ වගේ ආණ්ඩු පිහිටුවීම යුක්ති සහගතද? මම මේ රටේ පොලිස් නිලධාරී මහත්වරුන්ගෙන් මේ රටේ හමුදාවෙන් ඉල්ලා සිටින්නේ -මේ රටේ නීතිය හා සාමය වෙනුවෙන් පෙනී සිටින්න රටේ ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න බැඳී සිටින්න. මේ රටේ කවර හමුදාවක්ද, කවර පොලීසියක්ද මේ වර්ගයේ අනීතික ක්‍රියාවක් අනුමත කළ යුත්තේ. මේ රටේ පොදු ජනයා මේක අනුමත කළ යුතුද? මතක තබා ගන්න ලෝකයේ වෙන රටවල මේ දේ වුණා නම්, මහා ලේ වැගිරීමක්. අපි ස්තුතිවන්ත වෙනවා අපේ රටේ ජනතාවට එවැනි ලේ වැගිරීමකට ගමන් නොකිරීම ගැන. මේව තමයි දේශපාලන කුමන්ත්‍රණ. අපි මේ සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ, තමන්ගේ පක්ෂය පසෙක තබන්න. මෙවැනි වර්ගයේ දේශපාලන කුමන්ත්‍රණ හා ආණ්ඩු පෙරළි ඔබ පිළිගන්නවාද? මතක තබා ගන්න පසුගිය 26වැනි සිකුරාදා රාත්‍රියේ ලේ වැගිරීම් සිදු නොවුණු බව ඇත්ත. හැබැයි මේ ආභාෂය යළි සිදුවුණුහොත් ලේ වැගිරෙන්නේ නැහැයි කියල දෙන සහතිකය කුමක්ද? ඒ නිසා මෙවැනි වර්ගයේ දේශපාලන කුමන්ත්‍රණ ලබාදෙන පළමු ආදර්ශයම පරාජයට පත්කිරීම තමයි ජනතා විමුක්ති පෙරමුණේ අභිලාෂය.

### පුරවැසියන්ගේ වගකීම

මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ආණ්ඩු පෙරළීමේ ඉතිහාසයක් තිබෙනවා. සම්ප්‍රදායක් තිබෙනවා. යුක්තියක් නීතියක් තිබෙනවා. ඒව පසෙකලා දෙන්න එකට එකතුවෙලා ආණ්ඩු හදන්න පුළුවන් නම්, දෙන්නෙකුට එකතු වෙලා ආණ්ඩු පෙරළන්න පුළුවන් නම්, මේ රටේ පුරවැසියන් හැටියට අපි කවුද? අපි පිළිගත යුතුද එය. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේනගේ ඔක්තෝබර් මාසයේ 26 කළ කුමන්ත්‍රණය පරාජය කළේ නැත්නම් අපේ රටේ ආදර්ශය ආභාෂය බවට මේක පත්වීම වළක්වන්න බැහැ. ඊළඟට හිතමු එතුමගේ න්‍යාය පත්‍රය අනුව ජනවාරි මාසෙ 5 දා ඡන්දය තිබ්බා කියලා. 6 දා ආණ්ඩුවක් හදනවා. 7 වෙනිදා දෙන්න එක්ක එකතුවෙලා වෙන ආණ්ඩුවක් හදනවා. එහෙම කරන්ඩ බැරිද? මේ අනීතික අයුක්ති සහගත ක්‍රියාදාමයන් අපි පිළිගන්නවා නම්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, මේ රටේ මහජනයාගේ පරමාධිපත්‍ය බලය පිළිබඳව ඒව සංකල්ප විතරයි. ඒවා මහ පොළොවේ යථාර්ථයක් බවට පත්වෙන්නේ නැහැ. ඒනිසා තමයි ජනතා විමුක්ති පෙරමුණ මේක හරි බරෙන් ගන්නේ. රනිල් වික්‍රමසිංහ අරන් තියෙන්නේ අගමැතිකම නැතිවීමේ වේදනාව. හැබැයි ජනතා විමුක්ති පෙරමුණ අරගෙන තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වී තිබෙන බරපතළම මාරාන්තික ප්‍රහාරය. වෙන කොහේද තියෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්ෂණ, ප්‍රජාතන්ත්‍රවාදයේ හැඩරුව ගොඩාක් ක්ෂේත්‍රවල පැතිරිලා තිබෙනවා. හැබැයි එහි මුඛ්‍යම

> අද තිබෙන්නේ රනිල්ට අගමැතිකම නැතිවීම හෝ මහින්දට අගමැතිකම ලැබීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. රටේ මූලික නීතිය පිළිබඳ ප්‍රශ්නයක්. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක්. ජනාධිපති කෙනෙකුට බැහැ තමන්ගේ හිතලු විදිහට රටක් කරන්න. මේක රාජාණ්ඩුවක් නොවයි.

ක්ෂේත්‍රය තමයි ජනතාව විසින් ආණ්ඩුවක් හදන එක, ජනතාව විසින් ආණ්ඩුවක් පෙරළන එක. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන මුඛ්‍යම තැන. ප්‍රමුඛම තැන. ජනතාව විසින් ආණ්ඩු හදනවා. ජනතාව විසින් ආණ්ඩු පෙරළනවා. ඒ වෙනුවට මෛත්‍රීයි-මහින්දයි ආණ්ඩු හදනවා. සාධාරණද. ඒනිසා ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රමුඛතම නිලයට තමයි මේ ප්‍රහාරය එල්ල කොට තිබෙන්නේ. අන්න ඒ නිසා තමයි ජනතා විමුක්ති පෙරමුණ කලබලවී තිබෙන්නේ කියන එක මේ රටේ ජනතාවට අවධාරණය කරන්න අපි කැමතියි.

### ජ.වි.පෙ. අරමුණ

සමහර අය කියනවා ජනතා විමුක්ති පෙරමුණ වේගවත්. ඔව් තවත් වේගවත් ලෙස වැඩිකිරීම තමයි ජනතා විමුක්ති පෙරමුණේ අරමුණ. මේ කුමන්ත්‍රණය පරාජය කළ යුතුයි. එතනින් නතර වුණේ නැහැ. ඊළඟ කුමන්ත්‍රණය සාර්ථක කර ගැනීම වෙනුවෙන් පාර්ලිමේන්තු සැසි වාරය අවසන් කළා. සැසි වාරය අවසන් කරලා මන්ත්‍රීවරු බිලී බාගන්න හැදුවා. ඒක අසාර්ථක වුණාට පස්සේ ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට පැවරී නැති බලතල උපයෝගී කරගෙන පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. මෛත්‍රීපාලට කොහෙන්ද එහෙම බලයක් ව්‍යවස්ථාවෙන් එතෙක් ජනාධිපතිවරයාට තිබුණු පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සඳහා වසරක් ගියාට පස්සේ විසුරුවා හැරීමේ බලය 19 සංශෝධනයෙන් අවුරුදු හතර හමාර කළා. 19 ව්‍යවස්ථා සංශෝධනය ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකියන කෙනෙක් බවට පත්කළා. ඒක තමයි 19 සංශෝධනයේ මුඛ්‍ය අරමුණ. ඒ අරමුණ එසේ තිබියදී තමයි, මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ව්‍යවස්ථා විරෝධී ලෙස මේ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන්නේ. දැන් අවස්ථා දෙකක් තිබුණා. එක පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අවලංගු කර ගැනීම. ඒ වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ජනතා විමුක්ති පෙරමුණ ගියා. තවත් පක්ෂ ගියා. එතකොට කියනවා අරගොල්ලො ගියා, ඕගොල්ලොත් යනව එක වගේ නේද කියලා. සත්‍යය යුක්තිය පිළිබඳ තියෙන්නේ එක සටනයි. සටන් දෙකක් නැති බව මතක තබාගත යුතුයි. රනිල් වික්‍රමසිංහල ප්‍රජාතන්ත්‍රවාදයේ ඇත්ත සටන්කරුවන් නොවන බව අපි දන්නවා. රනිල් වික්‍රමසිංහ ප්‍රජාතන්ත්‍රවාදයේ හොර මුරකරුවෝ. ඒකත් අපි දන්නවා.

### අධිකරණයෙන් ලද පරාජය

අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ස්තුතිවන්ත වෙනවා, ලංකාවේ පළමු වතාවට විධායකය විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අතිහිටුවීමේ නියෝගයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙනු ලැබුවා. අත්හිටුවීමේ ඊළඟ ප්‍රතිඵලය තමයි පාර්ලිමේන්තුව කැඳවීම. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය පසුගිය 13 දා කුමන්ත්‍රණයේ පළමු පියවර පරාජයට පත්කරනු ලැබුවා. ඊළඟ 14 පාර්ලිමේන්තුවේදි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ආපු මොහොතෙම ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ මහජනතාවට කිවුවා, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව විසින් කුමන්ත්‍රණයේ එක කොටසක් පරාජයට පත්කොට තිබෙනවා දැන් ව්‍යවස්ථා කඩපු, නීති කඩපු, හඳපානේ ආණ්ඩු හදපු මෛත්‍රීපාල සිරිසේන විශ්වාසභංගයේ හිල් හොයනවා. පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වෙන්නේ ප්‍රධාන කරුණු දෙකක් මත. එකක් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග. දෙක පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන්. මේකට අනුව තමයි පාර්ලිමේන්තුව මෙහෙය වෙන්නේ. පාර්ලිමේන්තුව මෙහෙය වෙන්නේ නැහැ මෛත්‍රීපාලගේ හිතලු අනුව. පාර්ලිමේන්තුවේදි ජනතා විමුක්ති පෙරමුණේ අපේ යෝජනාව ස්ථාවර නියෝගවලට අනුකූල වන පරිදි තමයි 14 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ අපි ඉතා කැමැත්තෙන් හිටියා යෝජනාව විවාදයට ගන්න. හැබැයි

15 වැනි පිටුවට

## ජනතාව අයිතිවාසිකම්... 03 පිටුවෙන්



අවස්ථාව ලබාදිය යුතුයි කියන එක. මැතිවරණයක් සඳහා ජනතාවට දොරටු විවෘත කළ යුතුයි. ජනතා විමුක්ති පෙරමුණ ඒ සඳහා කාලාන්තරයක් මුළුල්ලේ සූදානම් වෙමින් සිටිනවා. විශේෂයෙන් අපි කල්පනා කරනවා මේ රට අවුරුදු 70ක් පාලනය කරන ලද මේ දුබල ධනේශ්වර කඳවුරු දෙකට අපේ රට ඉදිරියට ගෙන යන්න බැරි බව. ඔවුන් ඒ බව ඕනෑවටත් වඩා ඔප්පු කරමින් තිබෙනවා. මේ නිසා ජ.වි.පෙ. දේශපාලන නායකත්වය ඇති පුළුල් මහජන ව්‍යාපාරයක් මගින් එළඹෙන මහ මැතිවරණයට තරග කිරීම තමයි අපේ අපේක්ෂාව වී තිබෙන්නේ.

***නියමුවා:- මේ දේශපාලන අර්බුදය මැද අවලාදකරුවන් ජ.වි.පෙ.ට එරෙහිව තමන්ගේ ක්‍රියාකාරිත්වය තීව්‍ර කර තිබෙනවා. ඒ ඇයි?***

***අනුර දිසානායක සහෝදරයා:-*** අපගේ දේශපාලන විරුද්ධවාදීන් ඉතා වේගයෙන් අවලාදවලට යොමුවීමක් දැකිය හැකියි. ඒ බව සමාජ ජාලවල වගේම ප්‍රධාන ධාරාවේ ඇතැම් මාධ්‍ය තුළත් මෙම තත්වය දැකිය හැකියි. විශේෂයෙන් මේ දේශපාලන කුමන්ත්‍රණය පරාජය කිරීම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ කේන්ද්‍රීය කාර්යභාරය කළා වගේම කේන්ද්‍රීය සාධකය බවට පත්වුණා. ඒ නිසා කුමන්ත්‍රණකරුවන් අන් කවරදාටත් වඩා වැඩියෙන් කළබල වී තිබෙනවා. වේගවත් වී තිබෙනවා. ඔවුන් කල්පනා කරනවා නම් ඒ අවලාදවලින් අප ගනු ලබන දේශපාලන තීන්දු තීරණ ආපසු හරවන්න පුළුවන් කියලා, අපේ ක්‍රියාකාරිත්වය අඩපණ කරන්න පුළුවන් කියලා, ඒ අවලාදකරුවන්ට අපට කියන්න තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ ගැන නුඹලා කිසිවක්ම දන්නේ නැති බවයි. ඔවුන් ජ.වි.පෙ. පිළිබඳ නිසි තක්සේරුවක් කර ගත යුතුව තිබෙනවා. මේ අවලාදකරුවන් ඉදිරියට පැමිණීමෙන් පෙන්නුම්කර තිබෙන්නේ, දේශපාලන භූමිකාව තුළ තිබෙන අපේ ශක්තිමත්භාවයයි. අපේ දේශපාලන භූමිකාව තුළ ඇති සක්‍රීයභාවයයි

***නියමුවා:- ජනතාව තමන්ගේ දෛනික ගැටලු පසෙකලා ඉහළින් සිදුවන දේශපාලන අර්බුදයේ නරඹන්නන් වී තිබෙනවා. නමුත් ඔවුනට මෙම අර්බුදය පාඩමක් ලෙස ගනිමින් රටේ ගමන්මග නිවැරදි කර ගැනීමට පාවිච්චි කර ගත හැකිවීම පිළිබඳ ඔබේ අදහස.***

***අනුර දිසානායක සහෝදරයා:-*** ඔව්. මොවුන් උත්සාහ කරමින් තිබෙනවා, විටින් විට මෙවැනි පන්නයේ දේශපාලන අර්බුදයන් නිර්මාණය කර ජනතාව එහි නරඹන්නන් බවට පත්කොට මුළු අර්බුදය යටපත් කරන්න. සැබවින්ම අද අපේ රටේ ජනතාවගේ බරපතළ ආර්ථික ගැටලුවක් තිබෙනවා. ඒ වගේම අපේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳව ගැටලුවක් මතුවී තිබෙනවා. ඒ වගේම තරුණ තරුණියන්ට රැකියා පිළිබඳ ගැටලුවත්, ධීවරයන්ට, ගොවීන්ට තමන්ගේ ජීවිත පවත්වාගෙන යෑමේ ගැටලු මතුවී තිබෙනවා.

ඒ නිසා මේ රටේ ජනතාවගෙන් අපි ඉල්ලා සිටින්නේ, කලින් කලට පාලකයන් විසින් රඟ දක්වන නාට්‍යයන් රංගනයන්ගේ නරඹන්නන් බවට පත්වී එයින් අමන්දානන්දනයට හෝ කෝපයට පත්වෙනවා වෙනුවට සැබෑ අයිතිවාසිකම් වෙනුවෙන් පෙළගැහෙන්න කියලා. ජනතාව සැබෑ අයිතිවාසිකම් දිනාගැනීම වෙනුවෙන් ඉදිරියට පැමිණිය යුතුව තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ මේ මොහොත වනවිටත් ජනතාව දැනුවත් කරමින් සැබෑ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා අවශ්‍ය වන දේශපාලන මඟ පෙන්වීම දේශපාලන පෙරමුණක් ගොඩනැගීම දක්වා සාකච්ඡාව දියත් කර තිබෙනවා. අපි සියලු දෙනා ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය, ජාතික සමගිය, දේශපාලනයේ සදාචාරය ගොඩනැගීම පදනම් කරගත් හා රට ආර්ථික වශයෙන් දියුණු කළ හැකි ප්‍රතිපත්ති සහිත නව දේශපාලන බලවේගයක් ගොඩනැගිය යුතුයි; එය ජයග්‍රහණය කරවිය යුතුයි.

## අයවැය නැතිව ආර්ථිකයට... 07 පිටුවෙන්



150 (3) යටතේ ඉතා පැහැදිලි ලෙස දක්වා ඇත්තේ ජනාධිපතිවරයාට අවශ්‍ය ඕනෑම වෙලාවක මුදල් වෙන්කිරීමක් ගැන නොව "යම්කිසි වර්ෂයක විසර්ජන පනත් කෙටුම්පත නීතිය බවට පත්වීමට පෙර ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක" රජයේ සේවාවන් සඳහා මුදල් වෙන්කර නොමැත්තේ නම්, අභිනව පාර්ලිමේන්තුව රැස්වීමට නියමිත දින සිට මාස 3ක් ඉකුත් වන තෙක් රජයේ සේවාවන් සඳහා මුදලක් වෙන් කිරීමට ජනාධිපතිවරයාට ඇති බලයයි. දැන් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබ ඇති හෝ මුදල් වෙන්කිරීමට පාර්ලිමේන්තුව රැස්වීමට බැරි වටපිටාවක් නොමැත. ඒ නිසා මෙම අතුරු සම්මත ගිණුම කැබිනට්ටුවෙන් මුදල් වෙන්කිරීම හුදෙක්ම අර්බුදයට පත් රට තවත් අවුලෙන් අවුලටම ඇද දමන විකාර තීරණයක් මිසක ව්‍යවස්ථානුකූල තීරණයක් නොවේ.

ඒ නිසා මෙම අර්බුදයෙන් රට ගොඩ ගැනීමට මෙම බලලෝභී ධනපති පාලකයින්ගේ ප්‍රතිපත්ති හෝ විසඳුම්වලට නොහැකි බව දැන් වඩ වඩාත් ප්‍රායෝගික උදාහරණවලින්ම තහවුරු වෙමින් පවතී. ඒ නිසාම මෙම දේශපාලන අර්බුදය ධනපති පංතියේ මැදිහත්වීමෙන්ම තාවකාලිකව සමනයට පත්විය හැකි වුවද ලාංකේය දේශපාලනයේ සමාජ බලවේග ඒකරාශී කරගත් සමාජ ව්‍යාපාරයක පුළුල් මැදිහත්වීමකින් ස්ථිරසාර ආර්ථික දේශපාලන විසඳුමක අවශ්‍යතාවය මේ අර්බුදය විසින්ද අවධාරණය කරනු ලැබ ඇත.

## බලය වෙනුවෙන්... 05 පිටුවෙන්



ජනතා විමුක්ති පෙරමුණ නිසාත්ය.

ඒ අතර දැන් අවසන් මොහොතේ කුමන්ත්‍රණයේ පරාජය ස්ථිර වනු දුටු මෛත්‍රී යළි පාවාදී තම ගැලවීම සඳහා කටයුතු කරනු පෙනේ. පාර්ලිමේන්තුවේ සම්මත වූ විශ්වාසභංග යෝජනාවේ තමන්ට හානි කොටස ඉවත්කොට මහින්දගේ අගමැති ධුරය අහෝසි වන යෝජනාවක් සඳහා මෛත්‍රී මැදිහත් වූ බවට දේශපාලන ආරංචි මාර්ග විසින් පවසනු ලබන කරුණු සත්‍යනම් ඒ මගින්ද මොවුන්ගේ දේශපාලන අවස්ථාවාදයේ තරම පෙන්වා තිබේ.

දැන් අපේ සමාජයට වගකීමක් තිබේ. ඡන්දදායකයන් ඉදිරියේ සුදුවතින් සැරසී, පිරිත්නූල් ගැටගසාගෙන 'බෝධිසත්වයන්' මෙන් පෙනී සිටින ධනපති දේශපාලකයින් සැබවින්ම වෙස්වළාගත් 'රකුසන්' බව අවබෝධ කර ගැනීම ඉන් පළමුවැන්නය. බලය ඩැහැගැනීමට අවශ්‍ය වූ විට, ඊට බාධා එල්ලවූ විට ඔවුන්ගේ හැසිරීමේ සැබෑ වියරුව මඟින් ඔවුන් කවුද යන්න දැන්වත් වටහා ගත යුතුය. එම දේශපාලන කුණුකන්දල් දේශපාලන බිමෙන් ඉවත් කිරීම පොදු ජනතාවගේ වගකීමකි.

එසේම අපේ රටේ, ප්‍රජාතන්ත්‍රවාදය පවතින්නේ අනතුරකය. එය තේරුම් ගත යුතුය. රජගෙදර කුමන්ත්‍රණවලින් ආණ්ඩු මාරුකරන, ජනතා පරමාධිපත්‍යයට විහිළු කරන මෙම දේශපාලන සංස්කෘතිය පැරදවිය යුතුය. ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදය සමාජ සාධාරණය, ජාතික සමගිය, දේශපාලනයේ සදාචාරය ප්‍රධාන කරගත් දැවැන්තම දේශපාලන ව්‍යාපාරය ගොඩනැගිය යුතුය. එය ගොඩනැගීම සඳහාත් එය දිනවීම සඳහාත් පෙරමුණ ගැනීම මේ මොහොතේ සැම වමේ බලවේගයකම ප්‍රගතිශීලී හා ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයකම වගකීම වේ. මේ ඒ සඳහා හොඳම අවස්ථාවයි.

## කුමන්ත්‍රණ පූර්වාදර්ශය... 13 පිටුවෙන්



සහමුලින්ම අයින් කළේ නැතිනම්, අපිට මේ විසිවැනි සංශෝධනයෙන් ජනාධිපතිධුරය අහෝසි කරගන්න බැරි වුණොත් ඊළඟට එන ජනාධිපතිවරයෙක් පාර්ලිමේන්තුවේ බලයත් එක්ක කුමන දේ නොකරයිද? මොවුන් ආවරණයට පාවිච්චි කරන්නේ මොකක්ද? 2015 ජනවාරි 09වැනිදා රනිල් වික්‍රමසිංහ මහත්තයාට අගමැතිකම දුන්නු එක. අපි දන්නවා ඒක දේශපාලන සදාචාරයට වැරදියි. ඒ වෙලාවෙ ඒක නීතියට එකඟ වෙන්න පුළුවන්. නමුත් ඒක තමයි පාවිච්චි කළේ. ඒ වෙලාවේ වුණත් ඒකට හරි විරෝධයක් පළ වුණා නම්, ඒක පාර්ලිමේන්තු අනුමැතියෙන් කර ගන්න තිබුණා. රාජපක්ෂලා ඒකට විරුද්ධ වුණේ නැහැ. නමුත් අපි කියන්නේ ප්‍රධාන වශයෙන් මේ පූර්වාදර්ශය සහමුලින් අතුගාලා දාන්න ඕනෑ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා මේ නීති විරෝධී තත්වය සමහන් වුණාට පස්සේ විශේෂ කාරක සභාවක් පත්කරලා කොහොමද රටේ නීතිය, පාර්ලිමේන්තු සම්ප්‍රදාය විනාශ වුණේ කොහොමද කියන එක පිළිබඳව හොඳ අධ්‍යාපනයක් රටට ලබාදිය යුතුයි.

දෙවැන්න, දැන් රටට වෙච්ච අලාභය කොහොමද ගෙවන්නේ. අරලියගහ මන්දිරය කරන අලාභය පමණක් නොවෙයි. අද ලෝකය ඉස්සරහ අපේ මාතෘ භූමියට වෙලා තියෙන ජාත්‍යන්තර ප්‍රතිරූපය අහිමිවීම අපි කොහොමද ගෙවන්නේ. අපි කියන්නේ ඒක තක්සේරු කළ යුතුයි. මුදල්මය සහ දේශපාලන වශයෙන්. තක්සේරු කරලා මේ කුමන්ත්‍රණය කරන්න දායක වුණු, උපදෙස් දුන්නු අයගේ සිට අද හෙට මේ පනින්න ඉන්න අයගෙන් පවා ඒ මුදල් අයකර ගත යුතුයි. මේ අහොසි වෙච්ච සංචාරකයන්ගේ පැමිණීම, මාතෘ භූමියේ නම කැතවීම ඒවා අපි කොහොමද නැවත උපයා ගන්නේ. ඒ නිසා අපි යෝජනා කරනවා කාරක සභා දෙකක් පත්කරලා පැහැදිලිවම මේ පූර්වාදර්ශය සහමුලින්ම අහෝසි කරන්නත් මේ වෙච්ච අලාභය අදාළ පුද්ගලයන්ගෙන් අයකර ගන්නත් ඕනෑ.

ඒ වගේම මේ සටනෙදි මේ රටේ නීතියට සහ ව්‍යවස්ථාවට අනුකූලව තමයි මේක විසඳෙන්න ඕනකම තියෙන්නේ. මේ වැරැද්ද සම්පූර්ණයෙන් ජනගත කරන්න නොදී අතරමග වෙන ඩීල් හරහා දැන් මේක බේරගන්න හදන බව අපට පේනවා. එක්සත් ජාතික පක්ෂයේ ක්‍රමය ඒක වෙන්න පුළුවන්. මේ රටේ ජනතාව මහන්සි වෙන්නේ මොකටද? මෛත්‍රීපාල සිරිසේන මහත්තයත් එක්ක කෑම මේසෙ සාකච්ඡාවක් කරලා මේ ප්‍රශ්නෙ ගොඩින් බේරගන්නද? මේක සහමුලින් ඉවර කරන්න ඕනෑ. එතුමා නීත්‍යානුකූල ජනාධිපති. ඒක ගැන අපිට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ කරපු වැරැද්දට එතුමා ගෙවන්න ඕනෑ. ජාතියෙන් සමාව ගන්න ඕනෑ. අනිවාර්යයෙන් රටට කරපු හානියට ගෙවන්න ඕනෑ, මුදලින්. මෛත්‍රීපාල සිරිසේනගේ සිට රාජපක්ෂගේ සිට ඔක්කෝම. එනිසා අන්න ඒ කටයුත්ත අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා.

## ප්‍රාථමික සමාජය... 11 පිටුවෙන්

හෝ අකමැත්ත මත නොව නිෂ්පාදන සාධක මත බව පැහැදිලිය.

මෙම සමාජයේ ස්වභාවය ගැන එංගල්ස් සිය 'පවුල, පෞද්ගලික දේපළ හා රජය ඇතිවූ සැටි' නම් කෘතියේ මෙසේ විස්තර කරයි. (159-160 පිටු)

**"ජනගහනය ඉතාම අඩු විය. ජන ඝනත්වය වැඩිවූයේ විශාල දඩයම් පෙදෙස්වලින් වටවූ ගෝත්‍රික වාස භූමි තුළය. එම සීමාවලින් පිටත තවත් ගෝත්‍රයකින් වෙන්කරන ස්වභාවික මධ්‍යස්ථ ආරක්ෂක කැලෑවලින් යුක්ත විය. ශ්‍රම විභජනය පිරිසිදු චාම් ස්වභාවික දෙයක් විය. එය ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය අතර විය. පුරුෂයෝ යුද්ධයට ගියහ. දඩයම් කළහ. ස්ත්‍රීහු ගෙදර දොර බලා ගත්හ. ආහාර හා ඇඳුම් පිළියෙල කළහ. ආහාර පිසීම, රෙදි විවීම හා මැසීමද කළහ. හැම කෙනෙක්ම තම තමන්ගේ අංශවල දක්ෂයෝ වූහ. පුරුෂයෝ කැලෑවලද, ස්ත්‍රීහු ගෙවල්වලද ස්වාමිවරු වූහ."**

කාන්තාවන් නිවසේ ප්‍රධානියා වූයේ ඇයිද යන්නත් සමාජය මාතෘ මූලික වූයේ ඇයිද යන්නත් ඉන් වටහා ගත හැක. කාන්තාවන් සමාජීය කටයුතුවලින් ඉවත්කර පවුලේ පෞද්ගලික වැඩවලට සීමාකර තිබෙන තාක් කාන්තාවගේ විමුක්තිය නොලැබෙන බව ලෙනින් කීවේ මේ අනුවය. එහෙත් ප්‍රාථමික සමාජයේදී කාන්තාවන් කළ කටයුතු පුරුෂයන්ට සාපේක්ෂව ගෝත්‍රයේ පැවැත්ම හා ළඟින් බැඳී තිබුණු අතර එය සමාජමය කාර්යයක් විය. ඒ නිසාම සමාජය මාතෘ මූලික විය.

මෙම සමාජය වෙනස්වී නව සමාජයක් බිහිවූයේ කෙසේද? එය මීළඟට විමසා බලමු.

## දේශපාලන කුමන්ත්‍රණ... 14 පිටුවෙන්

ඒගොල්ලෝ විවාදයට ඉඩ දෙන්නේ නැහැ. අපිට ඕනෑකම තිබුණා පළමුවෙනි වතාවට මහින්ද රාජපක්ෂ මහත්මයා මා ඉදිරිපිටම අනික් පැත්තේ පුටුවේ වාඩිවෙලා. මූණ හොඳට පේනවා. එයාගෙ මූණ බලාගෙන කියන්න කතාවක් අපිට තිබ්බා. රනිල් වික්‍රමසිංහ මහත්තයා අපේ පුටුවලට ටිකක් පිටිපස්සෙන් ඉන්නවා. එයාටත් ඇහෙන්න කතාවක් කියන්න තිබුණා. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා අහගෙන හිටියා නම් එයාටත් ඇහෙන්න කියන්න කතාවක් තිබුණා. මේ නායකයන් තුන්දෙනාම ආර්ථිකය, වංචා දූෂණ, නාස්තිය ඒ සියල්ල පසෙකින් තිබ්බත් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කරන ලද විනාශය ගැන අපිට කියන්න කතාවක් තිබ්බා. හැබැයි ඒ කතාවට ඉඩ තිබ්බේ නැහැ. අපි හරි කැමැත්තෙන් ඒ විවාදයට ගියේ. හැබැයි විවාදයට ඉඩ දුන්නේ නැහැ. විවාදය කඩාකප්පල් කළා.

ඇයි දැන් මහින්ද මහත්තයා රනිල් කාපු අඹ කොටය කන්න බදා ගත්තේ? මේ අයට අවශ්‍ය වුණේ තමන්ගේ නඩුහබවලින් බේරෙන්න. බලය ගත්තු ගමන් අපරාධ රැසක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වපු පොලිස් නිලධාරියා මාරු කළා. නමුත් පොලිස් කොමිසම ඒ මාරුව නැවැත්තුවා. ආණ්ඩු මාරුවේ ප්‍රතිඵල ඔවුන් භුක්ති විඳිමින් ඉන්නවා. ආණ්ඩුව ගත්තේ අහවල් හේතුව වෙනුවෙන් කියලා විවිධ හේතු කියමින් ඉන්නවා. ඒ සේම බොරු. මේ ජනාධිපති පුටුවේ මැතිවරණයකින් වැඩිවුණු හැමෝම දෙපාරක් වාඩිවුණා. මෛත්‍රීපාල මහත්තයාට එකපාරෙන් යන්න වෙනවා. ඔහුට නැවත එන්න තිබුණු හීනය බොඳ වුණා. ඒ නිසා ඔහු කල්පනා කළා දැන් ගමන යා යුත්තේ කා සමගද කියලා. ඔහු තෝරා ගත්තා මහින්දව.

රනිල් වික්‍රමසිංහලා වගකියන්න ඕනෑ රාජපක්ෂලාට යළිත් මේ විදිහට සෙල්ලම් දාන්න පුළුවන් වුණ එකට. මොකද මේ අයට එරෙහිව තිබූ නඩු කිසිම පැමිණිල්ලක් විමර්ශනය කරලා නඩු පවරන්න ඒවා විභාග කරන්න උත්සාහ කළේ නැහැ. ඒවා යටපත් කරලා උදව් කළා. ඔහු හිතුවේ මහින්ද ඉන්න ඕන ශ්‍රී ලංකා එක බෙදන්න කියලයි. ඒ නිසා කම්බ හොරු ආරක්ෂා වුණා. අද අපට එක්සත් ජාතික පක්ෂයට පූට්ටු කරලා අපට අවලාද ගහනවා. ඒත් රනිල් වික්‍රමසිංහට එරෙහි විශ්වාසභංග යට ඡන්ද දෙන්න අද ඔය ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ ආවේ නැහැ. ජවිපෙ අපි ඡන්ද දුන්නා. අපි අපේ වගකීම ඉටු කළා. එහෙව් අපට ඔවුන් කරන චෝදනා අදාළ වන්නේ නැහැ.

අද තිබෙන්නේ රනිල්ට අගමැතිකම නැතිවීම හෝ මහින්දට අගමැතිකම ලැබීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. රටේ මූලික නීතිය පිළිබඳ ප්‍රශ්නයක්. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක්. ජනාධිපති කෙනෙකුට බැහැ තමන්ගේ හිතලු විදිහට රටක් කරන්න. මේක රාජාණ්ඩුවක් නොවයි. මෙතුමා මේ අත වනන්නේ අනාගත ලේ වැගිරීමකටයි. ඒ තත්වයට එවැනි ව්‍යාසනයකට ඉඩ තැබීමට අපි සූදානම් නැහැ. අපි සූදානම්, අධිකරණය තුළින් පාර්ලිමේන්තුව තුළින් වගේම මහජනතාව සමග එක්ව මේ කුමන්ත්‍රණය පරාජයට පත් කරගන්න. සහතික ලෙසම අපි එය කරනවා. අද බූවල්ලාගේ අඬු දෙකක් අධිකරණයෙන් හා පාර්ලිමේන්තුවෙන් කපා තිබෙනවා. ඉතිරි ටිකත් අපි කපා දමනවා.

මේ පාර්ලිමේන්තුව තවදුරටත් ප්‍රධාන නැහැ. ජනතාවගේ කැමැත්ත පිළිබිඹුවක් වන පාර්ලිමේන්තුව ජනතාවගේ කැමැත්තේ විකෘතියක් බවට අද පත්වෙලා. මේ කුමන්ත්‍රණය පරාජය කළ වහාම පාර්ලිමේන්තුව විසුරුවා මහ මැතිවරණයකට යාමට යෝජනාවක් පාර්ලිමේන්තුවට ගේන්න ජ.වි.පෙ. සූදානම්.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com






29වැනි ඉල් මහ විරු සමරුවෙන්...



කුවේට් හිදී ඉල් මහ විරුවන් සමරා...



ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් වාරියපොළදී...



පලස්තීනයේ නිදහස වෙනුවෙන් සහය පළකොට...



ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් නීතිඥයින් ලෙස එක්ව...

## රාජපක්ෂ කණ්ඩායම ආණ්ඩුවක් අටවා ගත්තේ නඩු යටපත් කරගැනීමටයි

### ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා



කුමන්ත්‍රණකාරී ලෙස ආණ්ඩුවක් අටවා ගැනීම සඳහා රාජපක්ෂ කණ්ඩායමේ ප්‍රධාන අරමුණ වූයේ ඔවුන්ට එරෙහිව තිබෙන නඩු යටපත් කර ගැනීම යැයි ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මේ බව පැවසුවේ, පසුගිය 18වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා ඒ පිළිබඳව මෙසේද කරුණු දැක්වීය.

"ඇවන්ගාඩ් ගනුදෙනුව නිසා රජයට රුපියල් බිලියන 11.4ක් (බැඳුම්කරයේ පාඩුවට සමානයි) පාඩු කළේ යැයි ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු 08දෙනෙකුට එරෙහි නඩුව 2019 පෙබරවාරි 26වැනිදා කැඳවීමට නියමිතයි. ඩී. ඒ. රාජපක්ෂ අනුස්මරණ කෞතුකාගාරය ඉදිකිරීමේදී රුපියල් මිලියන 33.9ක් සාවද්‍ය පරිහරණය නිසා ගෝඨාභය රාජපක්ෂ ඇතුළු විත්තිකරුවන් 07දෙනෙකුට එරෙහි නඩුව විශේෂ මහාධිකරණය හමුවේ දෙසැම්බර් 04වැනිදා සිට දිනපතා විභාගයට ගැනීමට නියමිතයි. ශ්‍රී ලංකා නිදහස් කම්කරු කොංග්‍රසය නැමති වෘත්තීය සමිතියට අයත් රු. ලක්ෂ ගණනක් මුදල් සාවද්‍ය පරිහරණය කිරීමට එරෙහිව මහින්දානන්ද අලුත්ගමගේට පවරා ඇති නඩුව 2019 ජනවාරි මස 23වැනිදා කැඳවීමට නියමිතයි. රාජපක්ෂ පාලන සමයේ මන්ත්‍රීවරයෙකු වන නාමල් රාජපක්ෂ ඇතුළු සැකකරුවන් සිව් දෙනෙකුට එරෙහි එන්.ආර්. කන්සල්ටන් සමාගම යටතේ රු. මිලියන 15ක මුදල් අයථා ලෙස උපයා ගැනීමට එරෙහි නඩුව 2019 මාර්තු මස 07වැනිදා කැඳවීමට නියමිතයි. ඒ වගේම අයථා ලෙස උපයා ගත් රු. මිලියන 30ක මුදලක් ගවර්ස් කෝපරේට් සමාගමට ආයෝජනය කිරීම සම්බන්ධව නාමල් රාජපක්ෂ ඇතුළු විත්තකරුවන් 06කට එරෙහි නඩුව නොවැම්බර් මස 30වැනිදා කැඳවීමට නියමිතයි. අවිධිමත් රාජ්‍යතාන්ත්‍රික විදෙස් **2වැනි පිටුවට**

## මේ රට වෙනස් ගමනක් යා යුතුයි

### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



කුමන්ත්‍රණ කරන පරණ දූෂිත පාලනයන් ස්ථාපිත කරන්න හදන පාලකයින් සමග රටට ඉදිරියට යා නොහැකියැයි පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා රට වෙනස් ගමනක් යා යුතු බවත් දේශපාලන සදාචාරය, ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ආ යුතු බවත් රට තුළ සමාජ සාධාරණත්වය තහවුරු කළ යුතු බවත් රටේ ජනතාවට සතුටින් ජීවත් විය හැකි සමාජයක් නිර්මාණය විය යුතු බවත් පැවසීය.

ඔහු මේ බව පැවසුවේ පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"කුමන්ත්‍රණවලට සම්බන්ධ වුණු ඒවාට උදව් කළ අයට රට නව ගමනක් ගෙනයාමට සම්බන්ධ විය නොහැකියි. ඒ වෙනුවෙන් නව බලවේගයක් නිර්මාණය කළ යුතුව තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය වෙනුවෙන් නිර්මාණය කළ හැකි දැවැන්තම බලවේගය ඒකරාශි කිරීම අපි දැනටමත් ආරම්භ කර තිබෙනවා. අවසානයේ සමාජය වෙනස් කළ හැකි විශාලතම බලවේගයට නායකත්වය දීමට අපි සූදානම්. එයට එකතු වන ලෙස අපි සියලු දෙනාට ආරාධනා කරනවා. මේ අවස්ථාව ඉතාම වැදගත් අවස්ථාවක්. ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි කුමන්ත්‍රණය තාවකාලිකව පරාජය කළ අවස්ථාවක්. ඉදිරියේදීත් කුමන්ත්‍රණවලින් බලය ලබාගැනීමට ඕනෑම අයෙක් ගන්නා උත්සාහයක් පරාජයක් කිරීමට අපි සූදානම්. ඒ සඳහා වන ප්‍රතිඥාව අපි ජනතාවට දෙනවා."

## කොමිසම් වාර්තාවලට අනුව චූදිතයන්ට දඬුවම් දිය යුතුයි

### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා



රනිල් වික්‍රමසිංහ අගමැති වුණු ආණ්ඩුවේ වංචා-දූෂණ සෙවීම සඳහා විශේෂ ජනාධිපති කොමිසමක් පත් කරන්නේයැයි ජනාධිපතිවරයා විසින් විදෙස් මාධ්‍යවලට ප්‍රකාශයක් කර ඇතැයි කියා සිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා එවැන්නක් වහාම පත්කිරීමට කටයුතු කරන ලෙසත් නිකුත් වී ඇති කොමිෂන් වාර්තාවලට අනුව චූදිතයන්ට දඬුවම් පැමිණවීමට කටයුතු කරන ලෙසත් ජනාධිපතිවරයාට අවධාරණය කර සිටියේය.

විජිත හේරත් සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 26වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද කීය.

"මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ වංචා-දූෂණ විමර්ශනයට බරපතළ වංචා-දූෂණ රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පත්කළා. එම වාර්තාවේ චූදිතයින් අතර ඉහළම ඉන්නේ පර්සි මහේන්ද්‍ර රාජපක්ෂයි. ඊට අමතරව ඔහු ළඟින්ම ඉන්න ඇමතිවරුන්, සම්බන්ධීකරණ ලේකම්ලා එම වාර්තාවේ චූදිතයින් වෙලා ඉන්නවා. මේ හොරු ඔක්කොම ඉන්නේ මෛත්‍රීගේ ඔඩොක්කුවේ. මෛත්‍රීපාල සිරිසේන ඔවුන්ට දඬුවම් දෙන්න බයයි. දඬුවම් වෙනුවට ඔවුන්ට ලබාදුන්නේ අගමැතිකමයි, ඇමති තනතුරුයි."

## රනිල්, මෛත්‍රීපාල, මහින්ද ජනතාවගේ අර්බුදයට විසඳුම් දෙන්නේ නැහැ

### ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



රටේ ආණ්ඩුවක් හා කැබිනට් මණ්ඩලයක් නොමැතිව මාසයක් ගතවී ඇති බවත් මේ තත්වය තුළ රටේ ආර්ථිකය, ජන ජීවිතය බරපතළ ලෙස කඩා වැටී ඇති බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා හතළිස් එක් ලක්ෂයක් වන පාසැල් ළමුන්ට පාසැල් නිල ඇඳුම ලබාදෙන්නට පවා ආණ්ඩුව අසමත් බවත් අවධාරණය කළේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙසේ කියා සිටියේ පසුගිය 28වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද කියා සිටියේය.

"මෛත්‍රී-රනිල් ආණ්ඩුව නිල ඇඳුම් දීම කප්පාදු කළා; අද වෙනකොට සෙල්ලම් ආණ්ඩුව ළමයින්ට නිල ඇඳුම් ටිකත් අහිමි කරලා. ආණ්ඩුව යැයි කියාගන්නා කණ්ඩායමේ ඇඳුම් ගැලවිලා. මෛත්‍රීපාල සිරිසේන බලෙන්, බලය හදාගන්න අටවපු සෙල්ලම් ආණ්ඩුවේ පීඩනය දැන් ජනතාවට දැනෙමින් තිබෙනවා.

මේ විදිහට සෙල්ලම් ආණ්ඩුවට ඉදිරියට යන්න බැහැ. රටේ ජන ජීවිතය උඩු යටිකුරු කරලා. පාසැල් දරුවට නිල ඇඳුම නැහැ. ගොවියට පොහොර සහනාධාරය නැහැ. රාජ්‍ය සේවකයට වැටුප් නැහැ. පෙන්ෂන් එක නැහැ. මේ විදිහට රට අරාජික කිරීමේ වගකීමෙන් රාජපක්ෂලාට ගැලවෙන්න පුළුවන්කමක් නැහැ."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.